# (ඔ) ජාත්‍යන්තර වෙළෙඳාම

## 1. වෙළෙඳ ශේෂය

තාවකාලික රේගු සංඛ්‍යා අනුව අපනයන ඉපැයීම් (ප්‍රති අපනයන ඇතුළුව) 1973 දී රුපියල් 26,170 ලක්ෂයේ සිට 1974 දී රුපියල් 34,720 ලක්ෂය දක්වා රුපියල් 8,550 ලක්ෂයකින් හෙවත් සියයට 33 කින් වැඩි වූ අතර ආනයන වටිනාකම ඊටත් තියුණු ලෙස වැඩිවිය. එනම් 1973 රුපියල් 27,150 ලක්ෂයක්ව පැවති ආනයන වටිනාකම 1974 දී රුපියල් 18,390 ලක්ෂයකින් හෙවත් සියයට 68 කින් රුපියල් 45,540 ලක්ෂය දක්වා ඉතා ඉහළ මට්ටමකට වැඩි විය. මේ අනුව 1974 දී මෙරට වෙළෙඳ ශේෂයෙහි රුපියල් 10,820 ලක්ෂයක හිඟයක් තිබුණි. මේ දක්වා වාර්තාගත ඉහළම වෙළෙඳ හිඟය මෙය වේ. මෙයට ආසන්නව වෙළෙඳ හිඟයක් තිබූ අනිත් එකම වර්ෂය 1969 වන අතර එම වර්ෂයේදී වාර්තාගත හිඟය රුපියල් 6,270 ලක්ෂයකි. එහෙත් 1973 වෙළෙඳ හිඟය රුපියල් 980 ලක්ෂයක් පමණක් විය. වෙළෙඳ හිඟය, මුළු අපනයන ඉපැයීම්වල ප්‍රතිශතයක් වශයෙන් ගත්විට එය 1972 දී සියයට 2·7 සිට 1973 දී සියයට 3·7 දක්වා ද 1974 දී සියයට 31·2 දක්වා ද වැඩි විය.

### II (ඔ) 1 වැනි සංඛ්‍යා සටහන
### විදේශීය වෙළෙඳාම 1960 - 1974

| වර්ෂය | රුපියල් දශ ලක්ෂ | | | දර්ශකාංක (1967 = 100) | | | | වෙළෙඳ අනුපාතය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | පරිමාව | | මිල | | |
| | අපනයන* (නැ. වි. ස.) | ආනයන (මි. ර. ගැ.) | වෙළෙඳ ශේෂය | සියළු අපනයන | සියළු ආනයන | සියළු අපනයන | සියළු ආනයන | |
| 1960 .. | 1,832 | 1,960 | − 128 | 87 | 133 | 122 | 83 | 148 |
| 1961 .. | 1,733 | 1,703 | + 30 | 90 | 107 | 112 | 82 | 136 |
| 1962 .. | 1,808 | 1,660 | + 148 | 97 | 108 | 109 | 77 | 142 |
| 1963 .. | 1,731 | 1,490 | + 241 | 93 | 93 | 109 | 85 | 129 |
| 1964 .. | 1,876 | 1,975 | − 99 | 102 | 114 | 111 | 105 | 105 |
| 1965 .. | 1,949 | 1,474 | + 475 | 105 | 86 | 113 | 100 | 112 |
| 1966 .. | 1,700 | 2,028 | − 328 | 96 | 118 | 107 | 98 | 109 |
| 1967 .. | 1,690 | 1,738 | − 48 | 100 | 100 | 100 | 100 | 100 |
| 1968 .. | 2,035 | 2,173 | − 138 | 103 | 101 | 117 | 126 | 93 |
| 1969 .. | 1,916 | 2,543 | − 627 | 98 | 108 | 117 | 134 | 88 |
| 1970 .. | 2,033 | 2,313 | − 280 | 102 | 102 | 118 | 140 | 84 |
| 1971 .. | 1,947 | 1,986 | − 39 | 99 | 90 | 117 | 150 | 78 |
| 1972 .. | 2,009 | 2,064 | − 55 | 97 | 88 | 118 | 157 | 75 |
| 1973 .. | 2,617 | 2,715 | − 98 | 98 | 79 | 137 | 209 | 65 |
| 1974 .. | 3,472 | 4,554 | − 1082 | 85 | 56 | 213 | 370 | 58 |

මූලයයන්: ශ්‍රී ලංකා රේගුව; ශ්‍රී ලංකා මහ බැංකුව

* ප්‍රති අපනයන ඇතුළත්ය.

සම්ප්‍රදායික ප්‍රධාන අපනයන භාණ්ඩත්‍රයයෙන් එනම් තේ, රබර් සහ පොල් නිෂ්පාදිත වලින් ලත් අපනයන ඉපැයීම් 1974 දී රුපියල් 4,970 ලක්ෂයකින් වැඩි වූ අතර 1973 දී එහි වැඩිවීම වූයේ රුපියල් 3,050 ලක්ෂයකි. 1974 දී තේ වලින් ලත් අපනයන ඉපැයීම් රුපියල් 990 ලක්ෂයකින් වැඩිවූ අතර රබර් සහ පොල් නිෂ්පාදනත්‍රයයෙන් ලත් ඉපැයීම් පිළිවෙලින් රුපියල් 1,460 ලක්ෂයකින් සහ රුපියල් 2,520 ලක්ෂයකින් වැඩි විය. අනෙකුත් දේශීය අපනයන වලින් (මැණික් හැර) ලත් ඉපැයීම් 1973 දී රුපියල් 3,460 ලක්ෂයක සිට 1974 දී රුපියල් 8,430 ලක්ෂයක් දක්වා සැලකිය යුතු ලෙස වැඩි වී ඇත. මැණික් වලින් ලත් ඉපැයීම් 1973 දී රුපියල් 1,410 ලක්ෂයේ සිට 1974 දී රුපියල් 1,090 ලක්ෂය දක්වා අඩු වූ අතර තෝරාගත් කාර්මික නිෂ්පාදන අපනයන වලින් ලත් ඉපැයීම් රුපියල් 2 806 ලක්ෂය කින් වැඩි විය. අනෙකුත් තෝරාගත් කෘෂි අපනයන සහ කාර්මික නොවන නිෂ්පාදන භාණ්ඩ අපනයනයෙන් ලත් ඉපැයීම් 1974 දී රුපියල් 4,460 ලක්ෂයකින් ඉහළ නැගිණ.

ආනයන වටිනාකම මෙතෙක් නොවූ පමණකින් ඉහළ යෑම නිසා, අපනයන ආදායම ඉහළ යෑමෙන් ලත් වාසිය මැකී ගිය අතර එහි ප්‍රතිඵලය වූයේ ඉතා අහිතකර ගෙවුම් ශේෂ තත්ත්වයක් ඇති වීමය. උදාහරණයක් වශයෙන් පරිභෝජන ද්‍රව්‍යවල අපනයන වටිනාකම 1973 දී රුපියල් 14,240 ලක්ෂයක සිට 1974 දී රුපියල් 21,380 ලක්ෂය දක්වා වැඩිවිය. එම වටිනාකමින් සහල්, පිටි සහ සීනි සඳහා පමණක් වියදම රුපියල් 17,670 ලක්ෂයක් හෙවත් 1974 මුළු ආනයන වලින් සියයට 39 ක් විය. 1973 දී එය සියයට 38 කි. ආනයනය කළ අන්තර් භාණ්ඩයන්ගේ වියදම ද රුපියල් 11,050 ලක්ෂයකින් තියුණු ලෙස වැඩි වී ඇත. අන්තර් භාණ්ඩ ගණයට ඇතුළත් වන ඛනිජ තෙල් නිෂ්පාදන සහ පොහොර සඳහා කළ යුතු වූ ඉහළ ගෙවීම මෙහිදී කැපී පෙනුණි. ආහාර ද්‍රව්‍ය සහ ආයෝජන භාණ්ඩ ද්‍රව්‍ය හැර අනෙකුත් භාණ්ඩ සඳහා ආනයන වටිනාකම, 1973 හා සැසඳීමේ දී වැඩිවී ඇත්තේ මඳ වශයෙනි.

1974 ආනයන සඳහා කළ වියදම ඉතා ඉහළ මට්ටමකට වැඩි වුවද මුළු ආනයන පරිමාවෙහි කැපී පෙනෙන පහත වැටීමක් විය. මහ බැංකුව විසින් පිළියෙල කරන ලද පරිමා දර්ශකය (1967=100) 1969 දී 108 ක් වූ අතර එතැන් සිට මේ දක්වා සෑම වර්ෂයකම නොකඩවා එය පහත වැටුණු අතර 1974 පමණක් අංශක 23 කින් හෙවත් සියයට 29 කින් පහත වැටුණි. අනෙක් අතට, සියළුම ආනයන සඳහා මිල දර්ශකය (1967=100) 1966 සිට සීඝ්‍රයෙන් වැඩි වී 1974 දී 370 දක්වා මෙතෙක් වාර්තාගත ඉහළ මට්ටමක පිහිටියේය. ඉකුත් වසරේ 209 වූ එම දර්ශකය හා සැසඳීමේදී සියයට එය 77 කින් වැඩිවීමක් පෙන්නුම් කළේය.

ප්‍රධාන වශයෙන් තේ සහ රබර් අපනයන් සැළකිය යුතු ප්‍රමාණයකින් පහත වැටීම හේතු-වෙන් සියළුම අපනයන සඳහා පරිමා දර්ශකය සියයට 13 කින් අඩු වූ අතර, 1973 අපනයන මිල දර්ශකය 137 ක සිට 1974 දී 213 දක්වා වැඩි විය. මිල දර්ශකය වැඩිවීමට ප්‍රධාන හේතුව වූයේ මූලික භාණ්ඩ සඳහා ජාත්‍යන්තර වෙළෙඳපොලේ මිල ගණන් සාමාන්‍ය වශයෙන් ඉහළ යෑමයි. කෙසේ නමුත් අපනයන මිල දර්ශකයේ ඉහළ යෑම, ආනයන මිල දර්ශකයේ වැඩි වීම සමනත් කිරීමට තරම් ප්‍රමාණවත් නොවීය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ආනයන ධාරිතාව හෙවත් වෙළෙඳ අනුපාතය 1973 දී 65 සිට 1974 දී 58 දක්වා තව දුරටත් පහත වැටිණ. සහල්, පිටි සහ සීනි වැනි ප්‍රධාන ආහාර ද්‍රව්‍ය, ඛනිජ තෙල්, පොහොර වැනි අනෙකුත් අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය සහ ආයෝජන සහ අන්තර් භාණ්ඩ සමහරක ආනයන මිල තියුණු ලෙස වැඩිවීම වෙළෙඳ අනුපාතය එවැනි පහත මට්ටමකට දැමීමට හේතුවූ ප්‍රධාන කරුණු විය.

### රේගු දත්තවල වෙනස්කම

වෙළෙඳ දත්ත පිළියෙල කිරීම සම්බන්ධව රේගු දෙපාර්තමේන්තුවේ ක්‍රියා පිළිවෙලෙහි යම් දියුණුවක් දක්නට හැකි විය. එම දත්ත හැකි ඉක්මනින් සැපයීම සඳහා පරිශ්‍රමයක් ගෙන ඇත. කෙසේ වුවද, රේගු සංඛ්‍යා, විශේෂයෙන් ආනයන සංඛ්‍යා, විග්‍රහ කිරීමේදී කල්පනාකාරී විය යුතුය. පළමු වශයෙන්, රේගුවෙන් නිදහස් කරන ලද භාණ්ඩවල වටිනාකම, රේගුවේ වාර්තාගත වටිනාකමට වඩා සැහෙන ලෙස වෙනස් වේ. එම වෙනස්වීම්වලට ප්‍රධාන හේතුව යම් මාසයක්තුළදී රේගුවේ සංඛ්‍යා ලේඛන අංශයට ලැබෙන රේගු සටහන් අනුව එම

සංඛ්‍යා සකස් කෙරෙන අතර එසේ වාර්තා කරන ලද ආනයන හා අපනයන සමහරක්, සංඛ්‍යා සටහන් කළ මාසයට වෙනස් මාසයකදී (පසු මාසයකදී හෝ පෙර මාසයක) නැවගත කිරීම හෝ ගොඩබෑම සිදු වීමයි. තවද එම සංඛ්‍යා නියත සංඛ්‍යාවලට වඩා අඩුවෙන් හෝ වැඩියෙන් වාර්තාගත විය හැකි අතර එම තත්ත්වය, ඇතැම් භාණ්ඩ වෙළෙඳ නියෝජිතයන්ගේ ආනයන හා අපනයන සංඛ්‍යා හා සැසඳීමෙන් යම් තරමකට හඳුනාගත හැක.

එම නිසා රේගු සංඛ්‍යා, ආහාර කොමසාරිස්ගේ සහ ඛනිජ තෙල් සංස්ථාවේ නියත ආනයන සංඛ්‍යා සහ වඩා නිවැරදි සංඛ්‍යා ලබාගත හැකි අනෙකුත් ආනයන සංඛ්‍යාවන් සමග ගැලපිය යුතු වේ.

උදාහරණයක් වශයෙන් 1974 දී ආහාර කොමසාරිස් විසින් ආනයනය කළ සහල්, පිටි සහ සීනි සඳහා වටිනාකම රේගුව විසින් රුපියල් 1,998 ලක්ෂයක් අඩුවෙන් වාර්තා කර ඇති අතර ඛනිජ තෙල් ආනයන සංඛ්‍යාවන් රුපියල් 434 ලක්ෂයක් වැඩියෙන් වාර්තා කර ඇත. රේගු සංඛ්‍යා අනුව 1974 සහල්, පිටි සහ සීනි ආනයන වටිනාකම පිළිවෙලින් රුපියල් 7,205 ලක්ෂයක්, රුපියල් 8,566 ලක්ෂයක් සහ රුපියල් 1,899 ලක්ෂයක් වශයෙන් දක්වා ඇති නමුත්, ආහාර කොමසාරිස් විසින් ආනයනය කළ එකී භාණ්ඩයන්හි නියත වටිනාකම පිළිවෙලින් රුපියල් 7,978 ලක්ෂයක්, රුපියල් 9,384 ලක්ෂයක් සහ රුපියල් 2,304 ලක්ෂයක් වේ. රේගු වාර්තා ඛනිජ තෙල් නිෂ්පාදිතයන් හි ආනයන වටිනාකම රුපියල් 9,048 ලක්ෂයක් වශයෙන් දක්වා ඇතත් ඛනිජ තෙල් සංස්ථාවට අනුව එය රුපියල් 9,203 ලක්ෂයක් විය. එයින් අමුතෙල් සඳහා පමණක් ආනයන වියදම රුපියල් 1,614 ලක්ෂයක් විය.

අනෙක් අතට, රේගු වාර්තා අනුව, දේශීය බංකර (රුපියල් 2,604 ලක්ෂයක්) ආනයන කළ බංකර (රුපියල් 5 ලක්ෂයක්) සහ අනෙකුත් ඛනිජ තෙල් නිෂ්පාදිත (රුපියල් 812 ලක්ෂයක්) වලින් ලත් අපනයන වටිනාකම රුපියල් 3,421 ලක්ෂයක් වශයෙන් දක්වා ඇති නමුත් ඛනිජ තෙල් සංස්ථාවට අනුව එය රුපියල් 3,500 ලක්ෂයකි. එම වටිනාකම සමන්විත වූයේ අපනයන රුපියල් 881 ලක්ෂයකින්, නාවුක බංකර රුපියල් 2,168 ලක්ෂයකින් සහ ගුවන් ඉන්ධන රුපියල් 452 ලක්ෂයකිනි. තවද, රේගු සංඛ්‍යා අනුව මැණික් වලින් ලත් අපනයන ඉපැයීම් රුපියල් 1,095 ලක්ෂයක් වුවත් රාජ්‍ය මැණික් සංස්ථාවට අනුව එය රුපියල් 1,326 ලක්ෂයකි.

මෙම වෙනස්කම් නිසා, රේගු වාර්තාවල සඳහන් ආනයන සහ අපනයන සංඛ්‍යා ගැලපීම මහ බැංකුව විසින් කර ඇත. එම ගැලපීම්වල ප්‍රතිඵලයක් වශයෙන් මුළු ආනයන වටිනාකම සහ අපනයන වටිනාකම පිළිවෙලින් රුපියල් 47,695 ලක්ෂයක් සහ රුපියල් 35,030 ලක්ෂයක් වන අතර 1974 වර්ෂය සඳහා ගලපන ලද වෙළඳ ශේෂය රුපියල් 12,670 ලක්ෂයක් වනු ඇත. (රේගු වාර්තාවලට අනුව වෙළෙඳ ශේෂය රුපියල් 10,820 ලක්ෂයකි.)

## II (ඹ) 2 වැනි සංඛ්‍යා සටහන

### වෙළෙඳ දත්ත ගැලපීම්

(රුපියල් දශ ලක්ෂ වලින්)

| | 1973 | 1974 |
|---|---|---|
| 1. මුළු ආනයන (රේගු සංඛ්‍යා) .. .. | 2,714·7 | 4,554·3 |
| 2. සහල්, පිටි සහ සීනි ආනයන පිළිබඳව රේගු සහ ආහාර කොමසාරිස්ගේ සංඛ්‍යා අතර වෙනස .. .. | + 69·4 | + 199·8 |
| 3. ඛනිජ තෙල් නිෂ්පාදිත ආනයන පිළිබඳව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ රේගු සංඛ්‍යා අතර වෙනස .. | – 21·4 | + 15·4 |
| 4 මුළු ආනයන (ගලපන ලද) .. .. | 2,762·7 | 4,769·5 |
| 5 මුළු අපනයන රේගු සංඛ්‍යා) .. . | 2,617·1 | 3,471·9 |
| 6. මැණික් අපනයන පිළිබඳව රාජ්‍ය මැණික් සංස්ථාවේ සහ රේගු සංඛ්‍යා අතර වෙනස .. .. | + 12·0 | + 23·1 |
| 7 ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන පිළිබඳව ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ රේගු සංඛ්‍යා අතර වෙනස .. | + 0·7 | + 7·9 |
| 8. මුළු අපනයන (ගලපන ලද) .. .. | 2,629·8 | 3,502·9 |
| 9. වෙළෙඳ ශේෂය ගලපන ලද) .. .. | – 132·9 | – 1,266·6 |

මූලයයන්: ශ්‍රී ලංකා රේගුව,
ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව,
ඛනිජ තෙල් නීතිගත සංස්ථාව,
රාජ්‍ය මැණික් සංස්ථාව,

## 2. අපනයන

නොගලපන ලද රේගු සංඛ්‍යා අනුව, ඉකුත් පස් වසරෙහි ප්‍රධාන අපනයන භාණ්ඩවලින් ලත් ඉපැයීම් II (ඔ) 3 වැනි සංඛ්‍යා සටහනින් දක්වේ. අපනයන ආදයම රුපියල් වටිනාකමින් ගෙන බැලීමේදී නියත ආනයන ධාරිතාව හෝ ඒවායේ විදේශ විනිමය වටිනාකම නිසියාකාරව පිළිබිඹු නොවන බැවින් එම වටිනාකම් විශේෂ හැර ගැනුම් අයිතිවාසිකම් (එස් ඩී·ආර්·) අනුව ද දක්වා ඇත විශේෂ හැර ගැනීම් අයිතිවාසිකම් අනුව අපනයන වටිනාකම් වඩා ස්ථාවර තත්ත්වයක පිහිටි අතර එය වටිනාකම් මිණුම් දණ්ඩක් වශයෙන් වඩා යෝග්‍ය වේ.

රුපියල් වටිනාකම් අනුව මැණික් හැර සියළුම ප්‍රධාන අපනයන භාණ්ඩවල වටිනාකම් වැඩි වූ අතර 1974 මුළු අපනයන වටිනාකම රුපියල් 8,550 ලක්ෂයකින් හෙවත් සියයට 33 කින් වැඩි විය. විශේෂ හැරගැනීම් අයිතිවාසිකම්[1] අනුව විදේශ විනිමය ඉපයීම් එස්. ඩී. ආර්. 880 ලක්ෂයකින් හෙවත් සියයට 26 කින් පමණක් වැඩි විය.[2].

නිෂ්පාදනය පහත වැටීමත් සමගම, තේ අපනයන පරිමාවද 1973 දී රාත්තල් 4540 ලක්ෂයේ සිට 1974 රාත්තල් 3,870 ලක්ෂය දක්වා බෙහෙවින් අඩුවිය.[3] කෙසේ වුවද, ජාත්‍යන්තර වෙළෙඳපලෙහි තේ මිළ වැඩිවීම නිසා ඉන් ලත් අපනයන ඉපැයීම් රුපියල් 13,600 ලක්ෂය දක්වා (රුපියල් 990 ලක්ෂයකින් හෙවත් සියයට 8 කින්) වැඩි විය. රබර් අපනයන පරිමාව ද 1973 රාත්තල් 3,544 ලක්ෂයක සිට 1974 දී රාත්තල් 2,831 ලක්ෂය දක්වා රාත්තල් 713 ලක්ෂයකින් හෙවත් සියයට 20·1 කින් තියුණු ලෙස පහත වැටුනි. එසේ වුවද, රබර්වලින් ලත් අපනයන ඉපැයීම් 1973 දී රුපියල් 5,920 ලක්ෂයේ සිට 1974 දී රුපියල් 7,380 ලක්ෂය දක්වා (රුපියල් 1,460 ලක්ෂයකින් හෙවත් සියයට 25 කින්) වැඩි වූ බැව වාර්තා වේ. එයට හේතු වූයේ 1973 දී රාත්තල රුපියල් 1·67 ක් වූ අපනයන මිළ 1974 දී රාත්තල රුපියල් 2·61 ක් වීමය. 1973 දී රුපියල් 1,450 ලක්ෂයක් වූ ප්‍රධාන පොල් නිෂ්පාදනත්‍රයයෙන් සහ ගෙඩි පොල්වලින් ලත් අපනයන ඉපැයීම් 1974 දී රුපියල් 3,970 ලක්ෂය දක්වා (රුපියල් 2,520 ලක්ෂයකින් හෙවත් සියයට 174 කින්) ඉහළ නැඟිණ. කෙසේ වුවද, එහි අපනයන පරිමාවෙහි ගෙඩි 460 ලක්ෂයක වැඩිවීමක් වාර්තා විය. එයට අමතරව, 1973 ගෙඩිය රුපියල් 0·34 ක් වූ අපනයන මිළ 1974 දී ගෙඩිය රුපියල් 0·85 ක් වීමද අපනයන ඉපැයීම් වැඩිවීමට තුඩු දුනි. (බ්‍රිස්ටල් කෙඳි, මෙට්ට කෙඳි, පොල් කටු අඟුරු ඇතුළුව සියළු පොල් නිෂ්පාදනවල අපනයන වටිනාකම රුපියල් 5,370 ලක්ෂයක් හෙවත් මුළු අපනයන ඉපැයීම්වලින් සියයට 15 ක් වේ.

වටිනාකම අනුව ගත්විට, ශ්‍රී ලංකාවේ අපනයන සැකැස්මෙහි සම්ප්‍රදායික භාණ්ඩ සඳහාවූ වැදගත්කම මෑත කාලයක සිට අඩුවෙමින් පවතී. 1974 දී එය තවදුරටත් කැපී පෙනුනි. උදාහරණයක් වශයෙන් 1971 සහ 1972 සම්ප්‍රදායික ප්‍රධාන අපනයන භාණ්ඩත්‍රයයේ වටිනාකම, මුළු අපනයනවල වටිනාකමෙන් පිළිවෙලින් සියයට 89 ක් හා සියයට 88 ක් විය. 1973 දී මෙය සියයට 77 දක්වා පහත වැටුණු අතර 1974 දී සියයට 71 දක්වා තවදුරටත් අඩු විය සම්ප්‍රදායික අපනයන භාණ්ඩත්‍රයය ඇතුළත ද වෙනස්වීම් දක්නට හැකිය. ඉතාමත් කැපී පෙනෙන වෙනස වූයේ වටිනාකම අනුව, සම්ප්‍රදායික මුළු අපනයනවලින් තේ අපනයන වටිනාකම 1972 දී සියයට 58 ක් වූ අතර, එය 1973 දී සියයට 48 දක්වා ද, 1974 දී සියයට 39 දක්වා තව දුරටත් අඩුවීමය.

---

1. වෙළෙඳ සංඛ්‍යා සංසන්දනය කිරීම සඳහා මහ බැංකුව විශේෂ හැර ගැණීම් අයිතිවාසිකම් භාවිතා කෙරේ. 1974 වර්ෂය සඳහා සාමාන්‍ය අනුපාතය තාවකාලික වශයෙන් එස්.ඩී.ආර්. 1 = ලංකා රුපියල් 8·05 වශයෙන් ගෙණ ඇත.
2. විශේෂ හැර ගැනීම් අයිතිවාසිකම් අනුව ආනයන සඳහා විදේශ විනිමය වියදම එස්. ඩී. ආර්. 5,660 ලක්ෂයක් පමණ වේ යැයි ඇස්තමේන්තු කර ඇති අතර එය එස් ඩී. ආර්. 2,100 ලක්ෂයක හෙවත් සියයට 59 ක වැඩිවීමකි ඒ අනුව ශ්‍රී ලංකාවේ වෙළෙඳ ශේෂ හිඟය එස්. ඩී. ආර්. 1,350 ලක්ෂයක් වන අතර මුළු අපනයන වලින් සියයට 31 ක් වේ.
3. 255 වැනි පිටුවෙහි 1 පාද සටහන බලන්න.

සම්ප්‍රදයික මුළු අපනයනවලින් තේ වටිනාකම් අනුපාතය අඩුවීමට හේතු වූයේ ඉන් ලත් අපනයන ඉපැයීම් අඩුවීම නොවේ. ඇත්ත වශයෙන් 1973 දී රුපියල් 12,610 ලක්ෂයක පැවැති එම ඉපැයීම් 1974 දී රුපියල් 13,600 ලක්ෂය දක්වා වැඩිවිය. එහෙත්, පොල් නිෂ්පාදිත සහ අනෙකුත් දේශීය අපනයන වැනි දේවලින් ලත් ඉපැයීම් වැඩිවීම, තේවල අනුපාතය අඩුවීමට හේතු විය. රබර් වලින් ලත් අපනයන ඉපැයීම් ඉහළ ගියද මුළු අපනයන වලින් එහි ප්‍රතිශතය සියයට 23 සිට සියයට 21 දක්වා අඩු විය. පොල් තෙල්, කොප්පරා, කපාපු පොල් සහ ගෙඩි පොල් සඳහා හිමි වූ අනුපාතය 1973 දී සියයට 6 සිට 1974 දී සියයට 11 ක් වූ අතර මැණික් හැර අනෙකුත් දේශීය අපනයන, ප්‍රධාන වශයෙන් කාර්මික සහ කෘෂි නිෂ්පාදන අපනයනවල අනුපාතය සියයට 13 සිට සියයට 24 දක්වා තියුණු ලෙස ඉහළ නැඟිණ.

## II (ඔ) 3 වැනි සංඛ්‍යා සටහන

### අපනයන සැකැස්ම 1970 – 1974

| ද්‍රව්‍යය | වටිනාකම රුපියල් දශ ලක්ෂ වලින් | | | | | වටිනාකම එස්. ඩී. ආර්. දශලක්ෂ වලින් (අ) | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1970 | 1971 | 1972 | 1973 | 1974 | 1970 | 1971 | 1972 | 1973 | 1974 |
| 1· තේ | 1,120 | 1,144 | 1,162 | 1,261 | 1,360 | 188·16 | 192·19 | 171·39 | 165·27 | 168·94 |
| 2· රබර් | 440 | 307 | 265 | 592 | 738 | 73·92 | 51·58 | 39·08 | 77·59 | 91·68 |
| 3· පොල් නිෂ්පාදිත | 240 | 280 | 266 | 145 | 397 | 40·32 | 47·04 | 39·23 | 19·00 | 49·32 |
| 3·1 කොප්පරා | 23 | 24 | 52 | 4 | 1 | 3·86 | 4·03 | 7·69 | 0·52 | 0·12 |
| 3·2 පොල් තෙල් | 116 | 149 | 132 | 27 | 141 | 19·49 | 25·03 | 19·47 | 3·54 | 17·52 |
| 3·3 කපාපු පොල් | 98 | 103 | 78 | 111 | 252 | 16·45 | 17·30 | 11·50 | 14·55 | 31·30 |
| 3·4 පොල් ගෙඩි | 3 | 4 | 4 | 3 | 3 | 0·50 | 0·67 | 0·59 | 0·39 | 0·37 |
| 4· අනගි හා අර්ධ අගනා ගල් | 4 | 3 | 12 | 141 | 109 | 0·67 | 0·50 | 1·77 | 18·48 | 13·54 |
| 5· වෙනත් දේශීය අපනයන | 191 | 196 | 218 | 346 | 843* | 32·09 | 32·93 | 32·15 | 45·35 | 104·72 |
| මුළු දේශීය අපනයන | 1,995 | 1,930 | 1,993* | 2,596* | 3,447* | 335·16 | 324·24 | 293·95 | 340·24 | 428·20 |
| ප්‍රති අපනයන | 38 | 17 | 16 | 21 | 25 | 6·38 | 2·86 | 2·21 | 2·88 | 3·11 |
| එකතුව | 2,033 | 1,947 | 2,009 | 2,617 | 3,472 | 341·54 | 327·10 | 296·31 | 342·99 | 431·30 |

මූලය: ශ්‍රී ලංකා රේගුව

අ) භාවිත පරිවර්තන අනුපාතයන් පහත දක්වෙන අනුපාතයන් අනුවය.
1970, 1971 – එස්.ඩී.ආර්. 1=රු. 5·95237; 1972=එස්.ඩී.ආර්. 1=රු. 6·78; 1973=එස්ඩීආර් 1=රු. 7·63
1974=එස්.ඩී.ආර්. 1=රු. 8·05 (තාවකාලික)

* මෙයට බන්කර වටිනාකමද ඇතුළත් වේ.

### (අ) තේ

#### නිෂ්පාදනය

1974 දී තේ කර්මාන්තයේ එකිනෙකට ප්‍රතිවිරුද්ධ ප්‍රධාන උපනතීන් දෙකක් දිස් විය. ඉන් එකක් නම් තුන්වැනි වරටත් තේ නිෂ්පාදනය පහත වැටීමයි. අනෙක නම් කොළඹ සහ ලන්ඩනයේ තේ වෙන්දේසිවලදී තේ වලට ඉහළ මිළක් ලැබීමයි.

1973 රාත්තල් 4,657 ලක්ෂයක් වූ තේ නිෂ්පාදනය 1974 දී රාත්තල් 4,498 ලක්ෂයක් විය. මෙය රාත්තල් 159 ලක්ෂයක හෙවත් සියයට 3·4 පහත වැටීමකි. 1965 මුළු නිෂ්පාදනය වූ රාත්තල් 5,030 ලක්ෂයක සිට (1968 රාත්තල් අනුලක්ෂයක වැඩිවීම හැර) නිෂ්පාදනය මේ දක්වා නොකඩවා පහත වැටිණි. 1960 න් පසු තේ නිෂ්පාදනයේ අඩුම වර්ෂය 1974 වේ. 1960 දී තේ නිෂ්පාදනය රාත්තල් 4,500 ලක්ෂයකි. ඉකුත් වර්ෂයේදී නිෂ්පාදනය පහත වැටීමට හේතු වූ කරුණ වූයේ, පොහොර යෙදීම අඩුවීම, වතු බෙදා වෙන් කිරීම, ඉඩම් ප්‍රතිසංස්කරණයෙන් ඇතිවුන අවිනිශ්චිත තත්ත්වය සහ යම් තරමකට අහිතකර දේශ ගුණ තත්ත්වයයි.

බිම් මට්ටම් යටතේ නිවැවුම් වර්ගීකරණයන්ට අනුව, 1974 නිෂ්පාදනයේ පහත වැටීම් සම්පූර්ණයෙන්ම පහත රට තේ නිෂ්පාදනයේ අඩුවීම මත පදනම් වී ඇත. මුළු තේ නිෂ්පාදනයේ පහත වැටීම රාත්තල් 159 ලක්ෂයක් වූ අතර, පහත රට තේ නිෂ්පාදනය රාත්තල් 155 ලක්ෂයකින් අඩු විය. 1973 දී සියයට 28·6 ක් වූ පහත් බිම් තේ නිෂ්පාදන අනුපාතය 1974 දී සියයට 26 1 ක් විය මෙහි ප්‍රතිඵලයක් වශයෙන් උස් බිම් සහ මැදි බිම් තේ අනුපාතයන් පිළිවෙලින් සියයට 38·1 සහ සියයට 33·3 සිට පිළිවෙලින් සියයට 39·3 දක්වා සහ සියයට 34·6 දක්වා ඉහළ ගියේය.

II (ඔ) 4 වැනි සංඛ්‍යා සටහන

වගා බිම් මට්ටම් අනුව තේ නිෂ්පාදනය

| | 1972 | | 1973 | | 1974 | | 1972 සිට 1973 දක්වා වෙනස | 1973 සිට 1974 දක්වා වෙනස |
|---|---|---|---|---|---|---|---|---|
| | පරිමාව (රාත්තල් දශ ලක්ෂ) | % | පරිමාව (රාත්තල් දශ ලක්ෂ) | % | පරිමාව (රාත්තල් දශ ලක්ෂ) | % | | |
| උස්බිම් වගාව .. | 179·4 | 38·1 | 177·6 | 38·1 | 177·0 | 39·3 | −1·8 | − 0·6 |
| මැදබිම් වගාව .. | 165·2 | 35·1 | 155·3 | 33·3 | 155·4 | 34·6 | − 9·9 | + 0·1 |
| පහත්බිම් වගාව .. | 126·0 | 26·8 | 132·9 | 28·6 | 117·4 | 26·1 | +6·9 | − 15·5 |
| එකතුව .. | 470·6 | 100·0 | 465·8 | 100·0 | 449·8 | 100·0 | − 4·8 | − 16·0 |

මූලය: තේ පාලන දෙපාර්තමේන්තුව

තේ පාලක තැනගේ සංඛ්‍යා ලේඛනවලට අනුව 1974 වර්ෂය තුළදී ක්‍රියාත්මක වූ තේ කම්හල් 828 ක් විය. බිම් මට්ටම් අනුව මෙම කම්හල් ගැන සලකා බැලීමේදී උස් බිම් තේ කම්හල් 235 ක් ද මැදි බිම් තේ කම්හල් 232 ක් ද පහත් බිම් තේ කම්හල් 261 ක් ද වශයෙන් නිෂ්පාදනයේ නියැලුන බව දිස්වේ. මුළු කම්හල් ගණනින් 352 ක් තමන්ගේම තේ නිෂ්පාදනය කළ අතර කම්හල් 366 ක් තමන්ගේ මෙන්ම මිළදී ගත් දලුවලින් ද තේ නිෂ්පාදනය කළ ඒවා විය. කම්හල් 74 ක් මිළදී ගත් තේ දලු වලින් පමණක් නිෂ්පාදනය කළ අතර කම්හල් 36 ක් කිසිසේත් නිෂ්පාදනයෙහි නියැලුනේ නැත.

1974 දී මුළු තේ නිෂ්පාදනයෙන් රාත්තල් 452 ලක්ෂයක් හෙවත් සියයට 10 ක් දේශීය පරිභෝජනය සඳහා වෙන්විය. තේ නැවත වගාකිරීමේ සහනාධාර ක්‍රමය යටතේ රුපියල් 218 ලක්ෂයක් ද, රබර් වතුවල තේ නැවත වගා කිරීමේ සහනාධාර ක්‍රමය යටතේ රුපියල් 4 ලක්ෂයක් ද, තේ කර්මාන්ත ශාලා දියුණු කිරීමේ සහනාධාර ක්‍රමය යටතේ රුපියල් 37 ලක්ෂයක් ද, තේ සඳහා පොහොර සහනාධාර ක්‍රමය යටතේ රුපියල් 480 ලක්ෂයක් ද, තේ පෙට්ටි සහනාධාර ක්‍රමය යටතේ රුපියල් 386 ලක්ෂයක් ද, වැවිලි විවිධාංගකරණ සහනාධාර ක්‍රමය යටතේ රුපියල් 10 ලක්ෂයක් ද වශයෙන් විවිධ සහනාධාර ක්‍රමයන් යටතේ රජය 1,135 ලක්ෂයක් වියදම් කර තිබුණි.

**අපනයන**

II (ඔ) 5 සංඛ්‍යා සටහනින් නිෂ්පාදනය, අපනයන පරිමාව කොළඹ වෙන්දේසිවලට ඉදිරිපත් කළ ප්‍රමාණය, ලන්ඩන් වෙන්දේසිවලට නැව්ගත කල ප්‍රමාණය සහ පෞද්ගලික අලෙවි කිරීම් පෙන්නුම් කරයි. 1974 වර්ෂයේදී අපනයනය කෙරුණ තේ පරිමාව රාත්තල් 3,870 ලක්ෂයක් වූයේ රාත්තල් 670 ලක්ෂයක පහත වැටීමක් දැක්වීය.[1] මෙය ඉකුත් වසර හා සසඳන විට වෙනස් තත්ත්වයකි. ඉකුත් වසරේ නිෂ්පාදනය රාත්තල් පනස් ලක්ෂයකින් අඩුව තිබියදී අපනයන පරිමාව රාත්තල් 350 ලක්ෂයකින් වැඩිවිය. 1974 අපනයනය කළ තේ ප්‍රමාණය අඩුවීමට හේතු වූ කරුණු ගණනාවක් විය. කොළඹ වෙන්දේසියේදී අඩු ප්‍රමාණයක් ඉදිරිපත් කිරීම, කරච්චි වරායේ තදබදය නිසා නැව්ගත කිරීමේ දුෂ්කරතාවන් සහ

1. රේගු වාර්තා අනුව 1974 තේ අපනයන පරිමාව රාත්තල් 3868 ලක්ෂය වශයෙන් දක්වා ඇතත්, සෙස් බදු ලැබීම් අනුව තේ පාලක විසින් ගණනය කර ඇති පරිදි මෙම සංඛ්‍යාව රාත්තල් 4077 ලක්ෂයක් වෙයැයි දක්වා ඇත. 1974 ජනවාරි සහ පෙබරවාරි මාසවල තේ අපනයන පරිමාව රේගුව විසින් දක්වා ඇති පරිදි පිළිවෙලින් රාත්තල් 150 ලක්ෂයක් සහ 320 ලක්ෂයක් වෙයි එසේ වුවද, සෙස් බදු ලැබීම් අනුව තේ පාලක ගණනය කර ඇත්තේ පිළිවෙලින් රාත්තල් 340 ලක්ෂය සහ රාත්තල් 360 ලක්ෂයක් වශයෙනි, තේ පාලකගේ මතය අනුව 1974 නිෂ්පාදනය වූ රාත්තල් 4490 ලක්ෂය සමඟ මෙම අපනයන සංඛ්‍යාව වූ රාත්තල් 4077 ලක්ෂය සමඟ ගැලපේ.

ඇමරිකා එක්සත් ජනපදයේ ඇතැම වරායවල පැවැති නැව ගාස්තු ප්‍රශ්න මේවාට මූලික හේතූන් විය. මේ හැරෙන්නට 1973 අපනයන සංඛ්‍යාවලට 1972 අග භාගයේ නැවගත කිරීම ගණනාවක් ද ඇතුළත් කර තිබුණි. එහෙත් 1974 සංඛ්‍යාවලට 1973 නැවගත කළ සංඛ්‍යා ඇතුළත් නොවීය.

අපනයන කළ තේ සඳහා ලැබුණ ඉහළ මිළ මගින් තේ නිෂ්පාදනය පහළ වැටීමෙන් ලත් පාඩුව මකාලන ලදී. රුපියල් වටිනාකම අනුව තේ අපනයනයෙන් 1973 දී රුපියල් 12,607 ලක්ෂයක් ද, 1974 දී රුපියල් 13,597 ලක්ෂයක් ද වූයෙන් 1974 ආදයම සියයට 7·85 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. විදේශ විනිමය අනුව බැලූවද අපනයන ඉපැයීම්වල ඉහළ යාමක් දිස් වේ. උදහරණයක් වශයෙන් 1974 තේ අපනයන ආදයම විශේෂ හැරගැනිම අයිතිවාසිකම් 1,689·4 ලක්ෂයක් වූ අතර එය පසුගිය වර්ෂය සමග සැසඳීමේදී විශේෂ හැරගැනීම් අයිතිවාසිකම් 36·7 ලක්ෂයක වැඩිවීමකි එහෙත් 1972 වර්ෂයේදී වූ විශේෂ හැරගැනීම් අයිතිවාසිකම් 1,713·9 ලක්ෂය හා සසඳන විට විදේශ විනිමය ඉපැයීම් විශේෂ හැරගැනීම් අයිතිවාසිකම් 24·5 ලක්ෂයකින් අඩුවීමකි.

### II (ඹ) 5 වැනි සංඛ්‍යා සටහන

### නිෂ්පාදනය, අපනයන, කොළඹ වෙන්දේසිවලදී අලෙවි කළ ප්‍රමාණ හා ලන්ඩන් වෙන්දේසි වෙත නැව්ගත කළ ප්‍රමාණයන්

(රාත්තල් දශ ලක්ෂ)

| වර්ෂය | නිෂ්පාදනය | අපනයන රේගු දත්ත (ක්ෂණික තේ ඇතුළුව) | කොළඹ වෙන්දේසි වලට ඉදිරිපත් කළ ප්‍රමාණය | කෙළින්ම ලංඩන් වෙන්දේසි වලට නැවගත කළ ප්‍රමාණය | පෞද්ගලික අලෙවි කිරීම් |
|---|---|---|---|---|---|
| 1969 .. | 484 | 455 | 387 | 88 | 5 |
| 1970 .. | 468 | 460 | 373 | 91 | 5 |
| 1971 .. | 480 | 443 | 393 | 73 | 4 |
| 1972 .. | 471 | 419 | 391 | 54 | 5 |
| 1973 .. | 466 | 454 | 410 | 46 | 4 |
| 1974 .. | 450 | 387 | 392 | 51 | 3 |

මූලයයන්: තේ පාලක තැනගේ පාලන වාර්තා;
ශ්‍රී ලංකා රේගුව;
කොළඹ තේ බ්‍රෝකර් වරුන්ගේ සංගමය.

#### රටවල් අනුව අපනයන

පසුගිය වසර සමහ සැසඳීමේදී, 1974 දී තේ අපනයන රටාවෙහි සැලකිය යුතු වෙනසක් දැකිය හැකිවූවා පමණක් නොව හැම රටක් විසින්ම වාගේ මිළදී ගත් තේ ප්‍රමාණයන්ද, මේ වර්ෂයේ අඩු විය. එක්සත් රාජධානියට අපනයනය කළ තේ ප්‍රමාණය 1973 දී රාත්තල් 723 ලක්ෂයක සිට 1974 දී තවදුරටත් රාත්තල් 673 ලක්ෂය දක්වා පහත වැටුණි. එහෙත් තවමත් ශ්‍රී ලංකා තේ මිළට ගැනීමෙ ප්‍රධාන ගැනුම්කරු එක්සත් රාජධානිය විය. 1973 දී එක්සත් රාජධානිය වෙත අපනයනය කළ තේ පරිමාව සියයට 15 9 ක් වූ අතර, 1974 දී එය සියයට 17·4 දක්වා ඉහළ ගියේය 1972 බංගලදේශය වෙනම රටක් වශයෙන් කටයුතු කිරීමත් සමගම, පකිස්ථානය දෙවැනි ආනයනකරු බවට පත්විය. පකිස්ථානයට අපනයනය කළ තේ පරිමාව රාත්තල් 63 ලක්ෂයකින් පහත වැටුනද, 1973 දී ලංකාවේ මුළු අපනයනයෙන් 1973 දී සියයට 14·7 ක් වූ අනුපාතය 1974 දී සියයට 15·6 දක්වා වැඩි විය. එක්සත් ජනපදය යන්තමින් ඉරාකය පසු බස්වමින් ඊළඟ වැදගත් තේ ආනයනකරු බවට පත්විය. ඒ අනුව, ඉරාකය තුන්වැනි ස්ථානයේ සිට සිව්වැනි ස්ථානයට පත්විය. වැදගත්කමෙ අනුපිළිවෙල අනුව ලංකා තේ ආනයනය කළ අනෙක් රටවල් වන්නේ ඔස්ට්‍රේලියාව, එක්සත් දකුණු අප්‍රිකා රාජ්‍යය සහ ලිබියාවයි. 1974 වර්ෂයේදී එක්සත් අරාබි සමූහාණ්ඩුවට අපනයනය කළ තේ ප්‍රමාණයේ කැපී පෙනෙන පහත වැටීමක් දැකිය හැක.

## II (ඔ) 6 වැනි සංඛ්‍යා සටහන

## රටවල් අනුව තේ අපනයන වර්ගීකරණය හා ප්‍රතිගත කොටස්

| රටවල් | පරිමාව (රාත්තල් දශ ලක්ෂ) | | මුළු අපනයන වල ප්‍රතිශතය | | වටිනාකම (රු. දශලක්ෂ) | | මුළු වටිනාකමෙහි ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1973 | 1974 | 1973 | 1974 | 1973 | 1974 | 1973 | 1974 |
| 1. යුරෝපීය ආර්ථික ප්‍රජාව .. .. | 100.0 | 81.7 | 22 0 | 21.1 | 289.2 | 273.7 | 22.9 | 20.1 |
| 1.1 එක්සත් රාජධානිය .. .. | 72.3 | 67.3 | 15.9 | 17.4 | 197.7 | 214.3 | 15.7 | 15.8 |
| 1.2 අයිරිශ් සමූහාණ්ඩුව .. .. | 2.5 | 1.9 | 0.6 | 0.5 | 6.2 | 6.7 | 0.5 | 0.5 |
| 1.3 ඩෙන්මාර්කය .. .. | 1.0 | 0.8 | 0.2 | 0.2 | 3.1 | 3.6 | 0.2 | 0.2 |
| 1.4 අනෙකුත් .. .. | 24.2 | 11.7 | 5.3 | 3.0 | 82.2 | 49.1 | 6.5 | 3.6 |
| 2. පකිස්ථානය .. .. .. | 66.8 | 60.5 | 14.7 | 15.6 | 165.3 | 202.2 | 13.1 | 14.9 |
| 3. ඇමෙරිකා එක්සත් ජනපදය .. | 39.0 | 35.2 | 8.5 | 9.1 | 110.1 | 124.4 | 8.7 | 9.1 |
| 4. ඉරාකය .. .. .. | 44.4 | 34.4 | 9.8 | 8.9 | 103.8 | 107.6 | 8.2 | 7.9 |
| 5. ඕස්ට්‍රේලියාව .. .. .. | 24.4 | 21.7 | 5.4 | 5.6 | 65.2 | 85.2 | 5.2 | 6.3 |
| 6. දකුණු අප්‍රිකා සංගමය .. .. | 23.6 | 21.6 | 5.2 | 5.6 | 74.3 | 89.8 | 5.9 | 6.6 |
| 7. ලිබියාව .. .. .. | 19.5 | 12.5 | 4.3 | 3.2 | 54.6 | 35.4 | 4.3 | 2.6 |
| 8. එක්සත් අරාබි සමූහාණ්ඩුව .. | 20.6 | 4.3 | 4.5 | 1.1 | 7.0 | 12.1 | 0.6 | 0.9 |
| 9. සෝවියට් සමාජවාදි සමූහාණ්ඩුව .. | 2.2 | 4 0 | 0.5 | 1.0 | 8.7 | 16.9 | 0.7 | 1.2 |
| 10. අනිකුත් රටවල් .. .. | 113.1 | 110.9 | 25.0 | 28.8 | 382.6 | 412.4 | 30.4 | 30.4 |
| එකතුව .. .. | 453.6 | 386.8 | 100.0 | 100.0 | 1260.8 | 1359.7 | 100.0 | 100.0 |

මූලය: ශ්‍රී ලංකා රේගුව.

### කොළඹ වෙන්දේසි

1974 වර්ෂයේදී කොළඹ වෙන්දේසියට ඉදිරිපත් කළ තේ ප්‍රමාණය 1973 ට වඩා රාත්තල් 181 ලක්ෂයකින් අඩුවුවත් පිරිවැටුම සහ මිළ සැළකිය යුතු අන්දමින් ඉහළ ගියේය. පරිවහනය, ඉන්ධන, පොහොර, තේ පෙට්ටි යනාදියෙහි මිළ ඉහළයාම නිසා නිෂ්පාදන වියදම වැඩිවී පැවතිය ද, වෙළෙඳාම වර්ධනය වීමත් සමඟ වූ සහන සමූහය නිසා තේ කර්මාන්තයට සෑහෙන ආදයමක් ලැබුණි. 1973 දී කොළඹ වෙන්දේසිවල රුපියල් 8,070 ලක්ෂයක් වූ දළ පිරිවැටුම 1974 දී රුපියල් 11,800 ලක්ෂයක් හෙවත් රුපියල් 2,630 ලක්ෂයක ඉහළ යාමක් පෙන්විය. දේශීය නිෂ්පාදකයාගේ අංශයෙන් බලනවිට ශුද්ධ පිරිවැටුම වඩා වැදගත් වන අතර, 1974 රුපියල් 10,380 ලක්ෂයක් වූ මෙය පසුගිය වර්ෂයට වඩා රුපියල් 2,630 ලක්ෂයකින් ඉහළ ගියේය[1]. දළ පිරිවැටුම සහ ශුද්ධ පිරිවැටුම අතර වෙනස වටිනාකම අනුව විකුණුම් බද්ද වශයෙන් රජය ලබාගත් ප්‍රමාණයයි. 1974 දී කොළඹ වෙන්දේසිය වෙත ඉදිරිපත් කළ තේ ප්‍රමාණය රාත්තල් 180 ලක්ෂයකින් අඩු නොවන්නට, පිරිවැටුම මීට වඩා ඉහළ මට්ටමකට පත්වීමට ඉඩ තිබුණි.

1. ෆෝර්බ්ස් සහ වෝකර් සමාගම, තේ වෙළෙඳ වාර්තාව 1974, 1 පිටුව.

## II (ඹ) 7 වැනි සංඛ්‍යා සටහන

## තේ නිෂ්පාදනය, අපනයන සහ මිල 1970 - 1974

| වර්ෂය | නිෂ්පාදනය (රාත්තල් දශ ලක්ෂ) | අපනයනය | | කොළඹ වෙන්දේසියේ රාත්තලක සාමාන්‍ය (ශුද්ධ) මිල රුපියල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රමාණය (රාත්තල් දශ ලක්ෂ) | රාත්තලක නැ. වි. ස. මිල රුපියල් | උස්බිම | මැදිබිම | පහත් බිම | සියළුම තේ |
| 1970 | 468 | 460 | 2·44 | 1·92 | 1·58 | 1·38 | 1·63 |
| 1971 | 480 | 443 | 2·56 | 1·94 | 1.72 | 1·76 | 1·81 |
| 1972 | 471 | 419 | 2·77 | 1·99 | 1·80 | 1.89 | 1·89 |
| 1973 | 466 | 454 | 2·77 | 2·09 | 1·76 | 1·80 | 1·89 |
| 1974 | 450 | 387 | 3·52 | 2·76 | 2·49 | 2·67 | 2·64 |
| 1974 1 වැනි කාර්තුව | 98 | 82 | 3·00 | 2·64 | 2·16 | 2·10 | 2·32 |
| 2 වැනි කාර්තුව | 141 | 89 | 3·41 | 2 66 | 2·43 | 2·91 | 2·55 |
| 3 වැනි කාර්තුව | 92 | 112 | 3·58 | 2·97 | 2·71 | 2·95 | 2·86 |
| 4 වැනි කාර්තුව | 119 | 104 | 3·99 | 3·04 | 2·82 | 3·12 | 3·00 |

මූලයයන්: තේ පාලක තැනගේ පාලන වාර්තා;
ශ්‍රී ලංකා රේගුව;
කොළඹ තේ බ්‍රෝකර්වරුන්ගේ සංගමය.

1973 රාත්තල රුපියල් 1·89 ක්ව පැවති කොළඹ වෙන්දේසියේ සියළුම තේ සඳහා සාමාන්‍ය (ශුද්ධ) මිළ 1974 වර්ෂයේදී රාත්තල රුපියල් 2·64 දක්වා හෙවත් සියයට 40 කින් වැඩිවිය. 1973 සටිතිකවම වාගේ පැවති මිළ හා සසඳන විට 1974 මිළ වැඩිවීම සැලකිය යුතු කරුණකි. 1973 දෙසැම්බර් මාසයේදී පැවති සාමාන්‍ය (ශුද්ධ) මිළ රාත්තල රුපියල් 1·93 ක් වුවත්, 1974 දෙසැම්බර් මාසයේ එය රාත්තල රුපියල් 3·11 ක් තරම් ඉහල මිළක් විය.

උස් බිම තේ රාත්තලක සාමාන්‍ය ශුද්ධ මිළ 1973 දී රුපියල් 2·09 සිට 1974 දී රාත්තල 2·76 දක්වා ද, මැදිබිම තේ රාත්තල රුපියල් 1·76 සිට රාත්තල රුපියල් 2 49 දක්වා ද, පහත් බිම තේ රාත්තල රුපියල් 1·80 සිට 2·67 දක්වාද වශයෙන් වැඩිවිය. මැද පෙරදිග සමහර රටවල් වලින් පහත් බිම තේ සඳහා වැඩි ඉල්ලුමක් තිබීම නිසා පසුගිය වර්ෂ කිහිපයකදීම, පහත් බිම තේ වල මිළ මැදි බිම තේ වල මිළට වඩා වැඩි වී ඇත.

රුපියල් වටිනාකම අනුව, වාර්තාගත මිළ ඉහල යාමක්, සාමාන්‍ය දළ මිළ ගණන් අනුවද දැකිය හැක. උදාහරණයක් වශයෙන් කොළඹ වෙන්දේසියේ සියළුම තේ රාත්තලක් සඳහා වූ සාමාන්‍ය දළ මිළ රුපියල් 3·01 ක් වූ අතර උස්, මැදි සහ පහත් බිම තේ රාත්තලක සාමාන්‍ය දළ මිළ පිලිවෙලින් රුපියල් 3·20, රුපියල් 2 80, රුපියල් 3·03 දක්වා වැඩිවිය.

1974 දී කොළඹ වෙන්දේසිය වෙත ඉදිරිපත් කළ තේ ප්‍රමාණය පහත වැටුණි. 1973 රාත්තල් 4,100 ලක්ෂයක් වූ මෙය 1974 දී රාත්තල් 3,920 ලක්ෂය දක්වා පහත වැටුණි.[1]

1973 වර්ෂයේදී තේ වෙන්දේසි 50 ක් පවත්වා ඇති අතර, 1974 දී වෙන්දේසි 51 ක් වූයේ සාමාන්‍ය වශයෙන් එක් වෙන්දේසියකදී රාත්තල් 79 ලක්ෂයක් ඉදිරිපත් වීය. පෞද්ගලික විකුණුම් සහ ඉදිරි කොන්ත්‍රාත්තු මගින් 1974 දී රාත්තල් 28 ලක්ෂයක් අලෙවි කොට ඇති අතර එය රාත්තල් 16 ලක්ෂයක අඩුවීමකි

1. නැවත සෑදුම්, ආපසු ගැනුම් සහ සාම්පල් ඇතුළත් නොවේ. ඒවාද ඇතුළත් වූ විට තේ ප්‍රමාණය රාත්තල් 4034 ලක්ෂයක් වේ.

## ලන්ඩන් වෙන්දේසි

1974 වර්ෂයේ දී තේ නිෂ්පාදනය, අපනයන සහ කොළඹ වෙන්දේසියට ඉදිරිපත් කළ තේ පරිමාව පහත වැටුණද, ලන්ඩන් වෙන්දේසියට කෙලින්ම නැව් ගත කළ තේ පරිමාව රාත්තල් 510 ලක්ෂය දක්වා රාත්තල් 50 ලක්ෂයකින් ඉහළ ගියේය. තවද, මෙය පසුගිය වර්ෂ හත තුළදී පහත වැටෙමින් තිබුණ ප්‍රවණතාවයෙහි වෙනසකි. ලන්ඩන් වෙන්දේසි වලට තේ නැව්ගත කිරීමේ අවහිරයක් නොවූ අතර, සතුටුදායක මිළ ගණන් වෙන්දේසියේ දී ලබාගත් නිසා ලන්ඩන් වෙන්දේසියට තේ යැවීමට දේශීය නැව්ගත කරන්නන්ගේ උනන්දුව වැඩිවිය. පසුගිය කාල වලදී මෙන් ලන්ඩන් වෙන්දේසිවලට නැව්ගත කළ තේ පරිමාවෙන් වැඩි කොටසක් උස් බිම් තේ වූ අතර, ඒවා 1973 දී රාත්තල් 279 ලක්ෂයේ සිට 1974 රාත්තල් 315 ලක්ෂය දක්වා ඉහළ ගියේය. 1974 දී ලන්ඩන් වෙන්දේසියට යැවුණු සියළුම තොග සලකා බැලීමේදී උස්බිම් තේ අනුපාතය සියයට 61 8 ක්වූ අතර, මැදි බිම් තේ රාත්තල් 179 ලක්ෂයක් හෙවත් සියයට 35·1 ක්විය. පහත් බිම් තේ රාත්තල් 16 ලක්ෂයක් හෙවත් සියයට 3·1 ක් පමණක් විය.

තේ සඳහා වූ ජාත්‍යන්තර වෙළෙඳපොලක් වශයෙන් ලන්ඩන් වෙන්දේසියේ ඇති වැදගත්කම දිගටම අඩුවෙමින් පැවතියේ ලන්ඩන් වෙන්දේසියේ අලෙවි කරන ලද තේ පරිමාව 1973 දී කිලෝග්‍රෑම් 1039 ලක්ෂයක (රාත්තල් 2291 ලක්ෂය) සිට 1974 දී කිලෝ ග්‍රෑම් 910 ලක්ෂය (රාත්තල් 2006 ලක්ෂය) දක්වා පහත වැටුණි. ඉන්දියාව, ශ්‍රී ලංකාව සහ අප්‍රිකාව යන හැම රටකම තේ අලෙවි පරිමාවෙහි අඩුවීමක් දැකිය හැක. එහෙත් ලන්ඩන් වෙන්දේසියේදී ශ්‍රී ලංකා තේ අලෙවි අනුපාතය 1973 සියයට 18 9 සිට 1974 සියයට 21·4 දක්වා ඉහළ ගියේය

සමහර රටවල විශේෂයෙන් කිනියාවල පැවැති නියඟයත්, ප්‍රධාන වශයෙන් තෙල් අර්බුදයත් හේතුවෙන් ලෝකය පුරා පැවති සැපයුම අඩුවීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් ලන්ඩන් වෙන්දේසියේදී විකිණීම සඳහා තේ නිෂ්පාදනය කොට ඉදිරිපත් කරන හැම ප්‍රධාන රටකටම සාමාන්‍ය ඉහළ මිලක් ලබාගැනීමට හැකි විය. සියලුම තේ සඳහා සාමාන්‍ය මිළ 1973 දී කිලෝවක් නව පැන්ස 43·29 සිට 1974 දී කිලෝවක් නව පැන්ස 59 89 දක්වා සියයට 38 කින් ඉහළ ගියේය. 1974 කිනියාව ඉහළම තේ මිළක් ලැබූ රට වූයේ කිලෝවකට නව පැන්ස 64·65 ක් ලබාගනිමිනි. මේ සම්බන්ධව ශ්‍රී ලංකාව ලැබූ සාමාන්‍ය මිළ තත්ත්වය, 1973 දී කිලෝවකට නව පැන්ස 45·42 සිට 1974 කිලෝවකට නව පැන්ස 60·30 ක් දක්වා වැඩිවූ අතර එය සියයට 33 ක වැඩිවීමකි.

### II (ඹ) 8 වැනි සංඛ්‍යා සටහන

### මූලාරම්භක රටවල් හා සාමාන්‍ය මිල ගණන් අනුව ලන්ඩන් වෙන්දේසිවලදී අලෙවි වූ තේ ප්‍රමාණයන්

| රටවල් | ලන්ඩන් වෙන්දේසි වලදී අලෙවි වූ ප්‍රමාණයන් (කි. ග්‍රෑ. දශලක්ෂ) | | | | සාමාන්‍ය මිල ගණන් (කිලෝවක් - නව පැන්සවලින්) | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1971 | 1972 | 1973 | 1974 | 1971 | 1972 | 1973 | 1974 |
| 1· උතුරු ඉන්දියාව .. | 54·5 | 40·6 | 35·0 | 33·8 | 42·14 | 42·87 | 45·65 | 60·48 |
| 2· දකුණු ඉන්දියාව .. | 2·0 | 1·4 | 1·1 | 1·6 | 39·90 | 37·88 | 37·79 | 55·31 |
| 3· ශ්‍රී ලංකාව .. | 32·2 | 22·0 | 19·6 | 19·5 | 45·33 | 45·47 | 45·42 | 60·30 |
| 4· අප්‍රිකානු රටවල් .. | 35·2 | 46·1 | 44·7 | 32·8 | 43·01 | 40·49 | 41·19 | 59·77 |
| ඒවා අතරින්– | | | | | | | | |
| කිනියාව .. | 12·4 | 20·6 | 20·6 | 14·2 | 47·25 | 43·56 | 44·32 | 64·65 |
| උගන්ඩාව .. | 3·8 | 5·2 | 2·3 | 2·2 | 43·64 | 40·57 | 41·92 | 60·87 |
| ටැන්සානියාව .. | 5·0 | 5·8 | 6·5 | 3·4 | 45·39 | 41·71 | 42·55 | 60·19 |
| 5· එකතුව .. .. | 125·0 | 112·7 | 103·9 | 91·0 | 43·25 | 42·24 | 43·29 | 59·69 |

මූලය: ලන්ඩන් තේ බ්‍රෝකර්වරුන්ගේ සංගමය.

### අසුරන ලද තේ

1973 වර්ෂය හා සැසඳීමේදී 1974 දී අසුරන ලද තේ අපනයන වලින් ලත් ඉපැයීම් රුපියල් 205 ලක්ෂයකින් අඩුවිය. අසුරන ලද තේ රාත්තලක නැ. වි. ස. මිළ ශත 50 කින් ඉහළ ගියද, අසුරන ලද තේ අපනයන පරිමාව 1973 දී රාත්තල් 304 ලක්ෂයක සිට 1974 දී රාත්තල් 203 ලක්ෂය දක්වා පහත වැටිණ. සියලුම තේ වල මිළ සියයට 27 දක්වා වැඩිවුවද ඇසුරු තේ වල මිළ ඉහළ ගියේ සියයට 16 කින් පමණි.

අසුරන ලද තේ සඳහා පරිවර්ත්‍ය රුපියල් ගිණුම් පහසුකම් තිබියදීත් අපනයන පරිමාවේ පහත වැටීමට හේතු වන්නට ඇත්තේ තොග තේ වලට ලැබුණ මිළ ඉහළ යාමත්, ඇසුරුම් ද්‍රව්‍යවල මිල ඉහළ යාමත් විය හැකිය.

II (ඔ) 9 සංඛ්‍යා සටහනින් 1967 සිට 1974 දක්වා අපනයන කරන ලද ඇසුරුම් තේ පරිමාව, වටිනාකම සහ නැ. වි. ස. මිළ ද දැක්වේ.

**II (ඔ) 9 වැනි සංඛ්‍යා සටහන**

**අපනයන කළ අසුරන ලද තේ**

| වර්ෂය | පරිමාව (රාත්තල් දශලක්ෂ) | වටිනාකම (රුපියල් දශලක්ෂ) | නැ. වි. ස. මිළ රාත්තල රුපියල් |
|---|---|---|---|
| 1967 .. .. | 4·7 | 12·0 | 2·53 |
| 1968 .. .. | 9·4 | 29·4 | 3·13 |
| 1969 .. .. | 15·2 | 37·3 | 2·46 |
| 1970 .. .. | 17·0 | 41·6 | 2·44 |
| 1971 .. .. | 22·7 | 60·6 | 2·67 |
| 1972 .. .. | 32·4 | 102·4 | 3·16 |
| 1973 .. .. | 30·4 | 92·4 | 3·04 |
| 1974 .. .. | 20·3 | 71·9 | 3·54 |

මූලය; ශ්‍රී ලංකා රේගුව

### ක්ෂණික තේ

නොකඩවා වැඩි වූ ක්ෂණික තේ නිෂ්පාදනය 1974 වර්ෂයේදී රාත්තල් 640·7 දහසක් විය. 1973 වර්ෂයේදී ක්ෂණික තේ නිෂ්පාදනය රාත්තල් 474·6 දහසකි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 1974 වර්ෂයේ ක්ෂණික තේ අපනයන පරිමාව රාත්තල් 614·2 දහසක් වූයේ, 1973 වර්ෂයට වඩා රාත්තල් 113·2 දහසකින් වැඩිවිය. පුරුදු පරිදි ක්ෂණික තේ සඳහා ප්‍රධාන වෙළෙඳ පලවල් වූයේ, එක්සත් රාජධානිය (සියයට 44·7) ඕස්ට්‍රේලියාව (සියයට 21·0) සහ ජර්මන් පෙඩරල් සමූහාණ්ඩුව (සියයට 12·7) යන රටවල්ය.

### තේ අපනයන බදු ප්‍රතිදාන ක්‍රමය

1974 ජූනි 14 දින තේ වෙන්දේසියේ සිට ක්‍රියාත්මක වන පරිදි තේ අපනයන බදු ප්‍රතිදාන ක්‍රමයේ අවම මිළ රාත්තලක් රුපියල් 1·60 සිට රාත්තල රුපියල් 2·00 දක්වාද උපරිම මිළ රාත්තල රුපියල් 2·00 සිට රාත්තල රුපියල් 2·30 දක්වාද වැඩිකරන ලදී.

1974 වර්ෂයේ තේ මිළෙහි සාමාන්‍ය ඉහළයාම් හේතුවෙන්, තේ ප්‍රතිදානයට 1973 දී සුදුසු කම ලත් තේ ප්‍රමාණය රාත්තල් 2480 ලක්ෂයක් වූ අතර, 1974 වර්ෂයේදී එය ඉතා පහත් මට්ටමකට එනම් රාත්තල් 360 ලක්ෂය දක්වා පහත වැටිණ. එමනිසා ගෙවන ලද ප්‍රතිදානය ද රුපියල් 182 ලක්ෂයකින් පහත වැටිණ. II (ඔ) 10 සංඛ්‍යා සටහනින් වගා බිම් මට්ටම් අනුව ගෙවන ලද බදු ප්‍රතිදාන ප්‍රමාණයත්, අපනයන බදු ප්‍රතිදාන ගෙවූ තේ පරිමාවත් පිළිබඳ විස්තර දැක්වේ.

## II (ඔ) 10 වැනි සංඛ්‍යා සටහන

### තේ අපනයන බදු ප්‍රතිදන ක්‍රමය යටතේ සුදුසුකම් ලැබූ ප්‍රමාණය හා ගෙවන ලද ප්‍රතිදන මුදල 1973 1974

| | ප්‍රතිදනය සඳහා සුදුසුකම් ලැබූ ප්‍රමාණය (රාත්තල්) | | ගෙවූ ප්‍රතිදනයේ වටිනාකම (රුපියල්) | |
|---|---|---|---|---|
| | 1973 | 1974 | 1973 | 1974 |
| උස් බිම .. | 68,435,218 | 5,410,762 | 5,434,259 | 418,479 |
| මැදි බිම .. | 92,459,311 | 15,629,589 | 8,514,925 | 1,636,002 |
| පහත් බිම .. | 87,082,667 | 14,760,669 | 7,637,101 | 1,319,384 |
| එකතුව .. | 247,977,196 | 35,851,020 | 21,586,285 | 3,373,865 |

මූලය: තේ පාලන දෙපාර්තමේන්තුව.

**ජාත්‍යන්තර තේ සම්මේලනය**

තේ පිළිබඳ අන්තර් රාජ්‍ය සමුළුවේ, අපනයන රටවල අනු කමිටුවේ හත්වැනි සාකච්ඡා වාරය, ආහාර සහ කෘෂිකර්ම සංවිධානයේ මෙහෙයවීම යටතේ 1974 ජූනි 10-14 වැනි දින දක්වා රෝමයේදී පැවැත්විණි[1]. මෙහිදී 1974/75 සහ 1975/76 කාලච්ඡේදයන් සඳහා ලෝක අපනයන සලාකයන් පිළිවෙලින් රාත්තල් 14,506 ලක්ෂයක්,[2] (මෙට්‍රික් ටොන් 658,000) සහ රාත්තල් 15,035 ලක්ෂයක් (මෙට්‍රික් ටොන් 682,000) විය යුතු යැයි එහිදී තීරණය කරනලදී.[3]

1973 අප්‍රේල් 1 සිට 1974 මාර්තු 31 දක්වා කාලපරිච්ඡේදය සඳහා ශ්‍රී ලංකාව සඳහාවූ තේ සලාකය රාත්තල් 4,722 ලක්ෂයක් වුවත් රේගු සංඛ්‍යා අනුව ශ්‍රී ලංකාවේ නියත අපනයනය රාත්තල් 4,334 ලක්ෂයක් වූ අතර එය ලැබූ සලාකයට වඩා රාත්තල් 388 ලක්ෂයක අඩුවීමක් විය[4]. තේ පිළිබඳ අන්තර් රාජ්‍ය කණ්ඩායමේ හයවැනි සැසි වාරයේදී 1973/74 සඳහා ශ්‍රී ලංකාවට වෙන් කළ අපනයන සලාකය වූ රාත්තල් 4,722 ලක්ෂය 1974/75 දී රාත්තල් 4,630 ලක්ෂය දක්වා අඩු කරන ලදී. ශ්‍රී ලංකාව සහ ඉන්දියාව 1974/75 වර්ෂවලදී ඇස්තමේන්තු අපනයනයෙන් සියයට 66 ක්ම අපනයනය කළ අතර 1973/74 දී එය සියයට 66 කි. අපනයන සලාක සඳහා එකඟවූ අනෙක් වැදගත් තේ අපනයන රටවල් නම් කීනියාව (මෙට්‍රික් ටොන් 62,900 හෙවත් රාත්තල් 1387 ලක්ෂයක්) ඉන්දුනීසියාව, (මෙට්‍රික් ටොන් 44,000 හෙවත් රාත්තල් 970 ලක්ෂයක්) ආර්ජන්ටයිනාව (මෙට්‍රික් ටොන් 29,000 හෙවත් රාත්තල් 639 ලක්ෂයක්) බංගල දේශය, (මෙට්‍රික් ටොන් 27,000 හෙවත් රාත්තල් 595 ලක්ෂයක්) උගන්ඩා, (මෙට්‍රික් ටොන් 22,800 හෙවත් රාත්තල් 503 ලක්ෂයක්) මලාවි:

---

1. ලෝක තේ අපනයනයෙන් සියයට 90 ක් නියෝජනය කරන තේ නිෂ්පාදනය කරන රටවල් 13 ක් හැරුණු විට, ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ සහ සංවර්ධන බැංකුව, එක්සත් ජාතීන්ගේ වෙළෙඳාම සහ සංවර්ධනය සඳහා සමුළුව, ජාත්‍යන්තර තේ කමිටුව, වෙළෙඳාම සහ තීරුබදු පිළිබඳ පොදු සම්මුතිය සහ පොදු රාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලය යන සංවිධාන සහ ආයතන වල නියෝජිතයන් ද සාකච්ඡා වාරයට සහභාගී විය.

2. 1973 ජූලි මාසයේදී පැවැති අවසාන සැසි වාරයේදී තීරණය කළ ලෝක සලාකයට වඩා මෙය රාත්තල් 485 ලක්ෂයකින් (හෙවත් මෙට්‍රික් ටොන් 22,000 කින්) අඩුවීමකි.

3. මෙම සංඛ්‍යාව ගණන් බලා ඇත්තේ අපනයන ප්‍රමාණයන් 1974/75 සඳහා සියයට 7½ කින්ද, 1975/76 සඳහා සියයට 8 කින්ද, අඩු වේ යැයි ඇස්තමේන්තු කිරීමෙන් පසුවය. 1976/77 කාලච්ඡේදය සඳහා ලෝක අපනයන සලාකය රාත්තල් 15,278 ලක්ෂයක් වේ යැයි තාවකාලිකව තීරණය කර ඇත.

4. මෙම කාලච්ඡේදය සඳහා ඉන්දියාවට වෙන් කළ අපනයන සලාකය රාත්තල් 4,802 ලක්ෂයක් වුවද, එහි නියත අපනයනයන් රාත්තල් 4,166 ලක්ෂයක් වූයෙන් සලාකයට වඩා රාත්තල් 636 ලක්ෂයක අඩුවීමක් විය.

(මෙට්‍රික් ටොන් 24,400, හෙවත් රාත්තල් 538 ලක්ෂයක්) තුර්කිය, (මෙට්‍රික් ටොන් 15,000 හෙවත් රාත්තල් 331 ලක්ෂයක්) මොසැම්බික්, (මෙට්‍රික් ටොන් 20,000 හෙවත් රාත්තල් 441 ලක්ෂයක්) සෙයිරේ ජනරජය (මෙට්‍රික් ටොන් 15,300 හෙවත් රාත්තල් 337 ලක්ෂයක් සහ ටැන්සානියාව (මෙට්‍රික් ටොන් 13,000 හෙවත් රාත්තල් 287 ලක්ෂයක්) ය.

තවද, තේ පිළිබඳ අන්තර් රාජ්‍ය කණ්ඩායමේ හත්වන සැසි වාරයේදී තේ පිළිබඳව ජාත්‍යන්තර තේ ගිවිසුම් සඳහා බහුවිධ ආකල්ප සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු ගැන පරීක්ෂා කිරීමට ප්‍රතිපත්තියක් වශයෙන් එකඟවන ලදී. (අ) අවම අපනයන මිළ ක්‍රමයට (ආ) ආනයන රටවල තොග තබාගැනීම් වලකාලීම් වස් වෙළඳාම් පාලනය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම (ඇ) ලොව වටා නව වෙළඳපොළ සහ විකිණීම් උනන්දු කිරීම් සහ සහයෝගිතාවයක් ඇති කිරීම (ඈ) ඉහළ මිළක් ලබා ගැනීම සඳහා වෙළඳාමේ සලාක කිරීම සහ (ඉ) තේ අපනයන රටවලට ස්වාධීන වෙළඳ සේවයක් පවත්වාගෙන යාමට ඉඩ සැලසීම.

**තේ කර්මාන්තයේ සංවර්ධනය සඳහා ගෙණ ඇති ක්‍රියා මාර්ග**

ඉහළ ගිය වියදම් සහ නිෂ්පාදනයන් පහත වැටීම නිසා තේ කර්මාන්තයට පහර වැදුනත්, තේ කර්මාන්තයට සහන සැලසීම සඳහා රජය විසින් පියවර ගණනාවක්ම ගැනිණි 1974 මුල සිටම 'සහන සමූහය' ක්‍රියාත්මක වන්නට විය. ඉන් පසුව, 1974 පෙබරවාරි මස 25 දින තේ වෙන්දේසියේ සිට ක්‍රියාත්මක වන පරිදි තේ අපනයන බදු ප්‍රතිදානය ගෙවන මිළ පරාශය ඉහළ දමන ලදී. එනම් ප්‍රතිදානය ගෙවනු ලබන පහළ මට්ටම රාත්තලක් රුපියල් 1/40 සිට රුපියල් 1/60 දක්වාත්, උපරිම මිළ රාත්තල රුපියල් 1/95 සිට රුපියල් 2/15 දක්වාත් වෙනස් කරන ලදී.[1] කෙසේ වෙතත් සහන ගෙවුම් වල වෙනසක් නොවූ අතර පහත් බිම් සහ මැදි බිම් තේ රාත්තලක් සඳහා උපරිම සහනය ශත 20 ක් වශයෙන්ද උස් බිම් සඳහා සහනය ශත 15 වශයෙන්ද නොවෙනස්ව පැවතුනි.

1974 පෙබරවාරි මස 25 වැනි දින වෙන්දේසියේදී සිට ක්‍රියාත්මක වන පරිදි තේ සඳහා වටිනාකම අනුව ගෙවිය යුතු බද්ද පදනම් කෙරෙන මිළ ගණන්හි අඩුම සහ ඉහළම සීමාවන් ශත 20 කින් වැඩි කරන ලදී. වෙනත් වචන වලින් දක්වතොත්, අවම මට්ටම රාත්තල රුපියල් 2·00 සිට රාත්තල රුපියල් 2·20 දක්වාත් ඉහළ මට්ටම රාත්තල රුපියල් 3·40 සිට රාත්තල රුපියල් 3·60 දක්වාත් වැඩි කරන ලදී. වෙන්දේසි මිලත් රාත්තලක් රුපියල් 2·20 ක්වූ අවම මිලත් (රාත්තලක් සත 70 ක්වූ උපරිම විකුණුම් බද්දකට යටත්ව)[2] අතර වෙනසින් සියයට 50 ක් හැටියට බදු අනුපාතිකය නොවෙනස්ව පැවතුණි.

මිළ ගණන් සම්බන්ධයෙන් පැවති ඉහත ක්‍රියාවලියට අමතරව, 1974 අප්‍රේල් 29 දින සිට තේ පෙට්ටි පනේල පට්ටලයකට ගෙවන සහනාධාරය රුපියල් 6 88 සිට රුපියල් 11·19 දක්වාත්, පෙට්ටි පනේල කට්ටලභාගයකට රුපියල් 5/00 සිට රුපියල් 9/24 දක්වාත් වැඩි කරන ලදී නිෂ්පාදකයා ආදායම් බද්දෙන් මෙම සහනාධාරය ආපසු නොගෙවන ආධාරයක් වන අතර එය කොළඹ වෙන්දේසි සහ ලන්ඩන් වෙන්දේසි වෙත යැවුන තේ සඳහා බලපාන ලදී. තේ පෙට්ටි පනේල මිළ 1974 මාර්තු 20 දින තුනී ලෑලි සංයුක්ත මණ්ඩලය විසින් ඉහළ දැමීමෙන් පසුව තේ කර්මාන්තය සඳහා පනේල කට්ටලයක් රුපියල් 3·00 කට ලබාගත හැකි පදිරි රජය විසින් එම සහනාධාරය වැඩි කරන ලදී. නැවත වාරයක් මෙම මිළ ගණන් ඉහළ දැමීමෙන් පසුව සම්පූර්ණ පනේල කට්ටල සහ අර්ධ පනේල කට්ටල සඳහා පිළිවෙලින් රුපියල් 12/00 සහ රුපියල් 10/00 දක්වා සහනාධාරය වැඩි කරන ලදුව, තේ කර්මාන්තය සඳහා පනේල කට්ටලයක වියදම රුපියල් 5/00 ක් විය.

---

1· 1974 නොවැම්බර් 12 දින වෙන්දේසියේ සිට අවම මිළ රාත්තල රුපියල් 2·00 දක්වාත් උපරිම මිල රාත්තල රුපියල් 2·30 දක්වාත් වැඩි කරන ලදී.

2· 1974 නොවැම්බර් මස 7 දින සිට බදු ගෙවිය යුතු මිල රුපියල් 2·50 දක්වා වැඩි කළ අතර වැඩිම බද්ද රාත්තලට රුපියලක් විය.

සහනාධාර ක්‍රමයේ තුන්වැනි සහ අවසාන වෙනස් කිරීම 1974 ඔක්තෝබර් 08 වැනිද සිට ක්‍රියාත්මක කෙරිණි. ඒ තුනි ලෑලි සංයුක්ත මණ්ඩලය මගින් තේ පෙට්ටි පනේල කට්ටල යක් රුපියල් 22/60 කටත් පනේල කට්ටල භාගයක් රුපියල් 20/50 කටත් මිළ වෙනස් කිරීමත් සමගය. මෙම වතාවේදී සහනාධාරය, පනේල කට්ටලයකට රුපියල් 12/60 සහ පනේල කට්ටල භාගයකට රුපියල් 10/50 වන පරිදි වෙනස් කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් පනේල කට්ටලයක් සඳහා කර්මාන්තයට යන වියදම රුපියල් 5/00 සිට රුපියල් 10/00 දක්වා වැඩි විය.

තේ කර්මාන්තය මුහුණ දෙන ද්‍රවශීලතා ප්‍රශ්නය වෙනුවෙන් ගත් තවත් පියවරක් වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය ඇපවීම් ක්‍රමයයි. ඉහළ යන නිෂ්පාදන වියදම් හැරුන විට තේ කර්මාන්ත ශාලා නවීකරණය කිරීම් සහ නැවත වගා කිරීම් සඳහා වතු සහ සමාගම් වලට එහි කාරක ප්‍රාග්ධනයෙන් විශාල මුදලක් වියදම කිරීමට සිදු විය. මේ නිසා ඔවුන්ගේ ද්‍රවශීල තත්වය අඩුවන්නට විය. මේ සඳහා මහ බැංකුව විසින් සකසන ලද ක්‍රමයක් අනුව ශ්‍රී ලංකා රජය වෙනුවෙන් වෙළඳ බැංකු වලින් නැවත වගා කිරීම්වලට සහ කර්මාන්ත ශාලා දියුණු කිරීම් සඳහා දෙන ණය මුදල් පිළිබඳව රජය වෙනුවෙන් ඇපවීම් සලසයි ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය මණ්ඩලය විසින් අනුමත කරන ලද ණය මෙම ක්‍රමය යටතට පත් වූ අතර ණය සහතිකය අදාළ වූයේ පැහැර හැරිය නොහැකි ණය වලින් සියයට 75 කට පමණි. මෙම කටයුතු වෙනුවෙන් කලින් කළ වියදම් ද සලකා බැලීම සඳහා මෙම ක්‍රමය 1970 ජනවාරි 01 වනද සිට ක්‍රියාත්මක වන පරිදි සකසන ලදී.

## (ආ) රබර්.

### නිෂ්පාදනය.

1974 දී රබර් නිෂ්පාදනය රාත්තල් 3010 ලක්ෂයක් වී යැයි ඇස්තමේන්තුකර ඇත. මෙය 1973 හා සැසඳීමේදී රාත්තල් 400 ලක්ෂයකින් හෙවත් සියයට 12 කින් අඩුවීමක් පෙන්නුම් කෙරෙන අතර 1966 න් පසු වාර්තාගත වූ අඩුම නිෂ්පාදන ප්‍රමාණයද වේ. සාමාන්‍ය වාර්ෂික මිලෙහි වැඩිවීමක් තිබියදීත් 1974 රබර් නිෂ්පාදනය අඩුවීමට හේතු වූයේ අයහපත් කාලගුණ තත්ත්වය, නිෂ්පාදන වියදම ඉහළ යාම සහ පොහොර උපයෝජනය හීන වීමත්ය. අයහපත් කාල ගුණය හේතුවෙන් කිරි කැපීමේ කටයුතුවලට බාධා වූවා පමණක් නොව, ලබා ගත හැකි රබර් කිරි ප්‍රමාණයද හීන විය. පොහොර මිල වැඩිවීම නිසා, පොහොර යෙදීමේ ප්‍රමාණය, 1973 දී ටොන් 14,470 සිට 1974 දී ටොන් 12,288 දක්වා අඩුවිය.

1973 වර්ෂයේදී මිලෙහි අධික ඉහළ යාම හේතුකොට ගෙන කලින් සුළු වශයෙන් පමණක් ලාභ ලබාගත් රබර් ඉඩම්වල කිරි කැපීමේ කටයුතුවල වර්ධනයක් ඇති වුවද, 1974 වර්ෂයේදී අගභාගයෙහිවූ මිලෙහි පහල වැටීම හේතුකොට ගෙන මෙම ඉඩම් නැවත වරක් නොසලකා හැරීම හෝ අත් හැරීම සිදු වී ඇත. ඉහත කී කරුණු නිසා, නැවත වගා කරන ලද ඉඩම් වලින් එලදාවෙහි ඇතිවූ වැඩිවීම සමහන් විය. 1967 වර්ෂය අවසානය වන විට මුළු රබර් වගාවට යටවූ ඉඩම් ප්‍රමාණයෙන් භාගයකට ආසන්න ප්‍රමාණයක් ඇතුළුව අක්කර 250,995 ක ප්‍රමාණයක් නැවත වගා කරන ලද අතර 1974 වන විට මේවායේ පලදාව ලැබෙන්නට ඇත. නැවත වගා කිරීමේ සහනාධාර රුපියල් 2,000 දක්වා වැඩිකර තිබියදීත් 1974 වර්ෂයේ වගා කරන ලද ඉඩම් ප්‍රමාණය අක්කර 7076 ක් වූයේ පසුගිය වර්ෂයේ නැවත වගා කළ ප්‍රමාණය වූ අක්කර 7276 කට වඩා අඩු විය.

### අපනයන

1974 වර්ෂයේ රබර් අපනයන වටිනාකම රුපියල් 7380 ලක්ෂයක් වූ අතර මෙය 1973 වර්ෂයට වඩා සියයට 25 කින් වැඩිවීමක් පෙන්විය. මෙයට මුළු මනින්ම හේතු වූයේ රබර්වල සාමාන්‍ය නැ. වි. ස. මිළ සියයට 56 කින් වැඩි වීමය. අපනයන පරිමාව නිෂ්පාදනයෙහි පහල වැටීම හේතුකොටගෙන සැලකිය යුතු ප්‍රමාණයකින් පහත වැටුණි. ඒ පිළිබඳ විස්තර පහත සංඛ්‍යා සටහනින් දක්වෙයි.

## II (ඔ) 11 වැනි සංඛ්‍යා සටහන

## රබර් නිෂ්පාදනය, අපනයන සහ මිල

| වර්ෂය | නිෂ්පාදනය (රාත්තල් දශලක්ෂ) | | | අපනයන (රාත්තල් දශලක්ෂ) | | | නැ·වි·ස· මිල (රාත්තල රුපියල්) | | | කොළඹ වෙළඳපල මිල (රාත්තල රුපියල්) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ෂීට | ක්‍රේප් | සියළු | ෂීට | ක්‍රේප් | සියළු | ෂීට | ක්‍රේප් | සියළු | ආර්· එස්· එස්· නො· 1 | ලේටෙක්ස් ක්‍රේප් නො· IX |
| 1970 | 211·0 | 138·3 | 350·9 | 221·7 | 132·5 | 354·2 | 1·23 | 1·26 | 1·24 | 0·91 | 1·12 |
| 1971 | 175·8 | 134·7 | 311·2 | 156·0 | 129·1 | 285·2 | 0·93 | 1·19 | 1·08 | 0·79 | 1·13 |
| 1972 | 184·0 | 122·5 | 309·4 | 164·6 | 119·3 | 285·7 | 0·90 | 0·97 | 0·93 | 0·81 | 0·89 |
| 1973 | 202·4 | 135·3 | 341·0 | 224·4 | 128·2 | 354·4 | 1·51 | 1·95 | 1·67 | 1·18 | 1·81 |
| 1974 | 168·6 | 129·3 | 300·6 | 158·0 | 124·2 | 283·1 | 2·45 | 2·81 | 2·61 | 1·28 | 2·02 |
| 1974 1 කාර්තුව | 43·2 | 27·7 | 71·7 | 42·9 | 30·3 | 73·3 | 2·37 | 3·33 | 2·77 | 1·41 | 2·05 |
| 2 කාර්තුව | 34·9 | 28·1 | 63·6 | 26·3 | 32·1 | 58·5 | 2·92 | 3·23 | 3·09 | 1·33 | 2·19 |
| 3 කාර්තුව | 61·5 | 43·3 | 105·5 | 62·1 | 31·4 | 93·9 | 2·56 | 2·40 | 2·51 | 1·22 | 2·33 |
| 4 කාර්තුව | 29·1 | 30·3 | 59·8 | 26·3 | 28·9 | 55·6 | 1·91 | 2·36 | 2·07 | 1·17 | 1·53 |

මූලයයන්: රබර් පාලන දෙපාර්තමේන්තුව;
ශ්‍රී ලංකා රේගුව;
කොළඹ රබර් බ්‍රෝකර්වරුන්ගේ සංගමය

### මිල

බලශක්ති අර්බුදයෙහි ආරම්භයත්, ඊටපසුව අමු තෙල් මිල සීඝ්‍රයෙන් ඉහල යාමත් සමග ස්වභාවික රබර් මිලෙහිවූ තී වැඩිවීමක් විය. 1973 අවසන් මාස කිහිපය සහ 1974 මුල් කාර්තුව තුලදීත්, රබර් මිල ඉතා ඉහල තත්ත්වයකට ලඟාවූ අතර ඉන් පසුව මිලෙහි පිරිහීමක් නොකඩවා ඇති විය.

1974 ජනවාරි—අගෝස්තු කාලච්ඡේදයේදී ස්වාභාවික රබර් පරිභෝජනය සැපයුමට වඩා අඩු වූ අතර තොගවල වැඩිවීමක් දක්නට තිබුණි. මිල පහල යන උපනතියක පැවතුනි ලන්ඩන් වෙළඳපොලෙහි 1974 ජනවාරි මාසයේදී ආර්. එස්. එස්. නො. 1 සඳහා පැවති මිල කිලෝවක් පැන්ස 52·27 කි. 1974 දෙසැම්බර් මාසයේදී කිලෝවක් පැන්ස 26·24 දක්වා පහල වැටුනි. ඒ අයුරින්ම නිව්යෝක් රබර් වෙළඳපොලෙහි ජනවාරි මාසයෙහි ආර්. එස්. එස්. 1 මිල රාත්තල ශත 54·46 සිට දෙසැම්බර් මාසයේදී රාත්තල ශත 30·76 දක්වා පහල වැටිනි. රබර් මිලෙහි පහල යාමට මූලික හේතුව වූයේ ප්‍රධාන ආනයන රටවල කර්මාන්ත ක්‍රියාවලියෙහි පසුබැස්ම විශේෂයෙන්ම ඔටෝමොබයිල් කර්මාන්තයෙහි පසුබැස්ම හේතුකොට ගෙන රබර් සඳහා පැවති ඉල්ලුම අඩු වීමයි.

### II (ඔ) 12 වැනි සංඛ්‍යා සටහන

### ස්වාභාවික සහ කෘතිම රබර්වල ලෝක නිෂ්පාදනය, පාරිභෝජනය සහ තොග

(රාත්තල් දශලක්ෂ)

| | ස්වභාවික රබර් | | | | කෘත්‍රිම රබර් | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1972 | 1973 | 1973 ජනවාරි–අගෝස්තු | 1974 ජනවාරි–අගෝස්තු | 1972 | 1973 | 1973 ජනවාරි–අගෝස්තු | 1974 ජනවාරි–අගෝස්තු |
| නිෂ්පාදනය | 6,861·8 | 7,699·6 | 4,943·8 | 5,109·2 | 14,408·2 | 16,110·1 | 10,615·1 | 10,945·8 |
| පාරිභෝජනය | 6,988·6 | 7,495·6 | 4,949·3* | 5,037·5* | 14,318·9 | 15,707·8 | 10.345·1 | 10,504·9 |
| මුළු තොග | 3,439·2* | 3,791·9* | 3,538·4* | 3,984·8* | 3,268·3** | 3,670·7** | 3,543·9** | 3,935·2** |

මූලය: රබර් සංඛ්‍යාන විවරණිකාව. (1974 නොවැම්බර්)

* පාරිභෝජනය සහ නිෂ්පාදනය කරන ලද ප්‍රදේශවල තොග සහ ඇස්තමේන්තු කරන ලද පාවෙන තොග ඇතුළත් වේ.

** වාර්තාගත කරන ලද තොග, ඇස්තමේන්තු කරන ලද වෙනත් තොග සහ පාවෙන තොග ඇතුළත් වේ.

### ලෝක සැපයුම, පරිභෝජනය සහ තොග.

ජාත්‍යන්තර වෙළඳපොලෙහි මිල පහත වැටීමේ උපනතියක් පැවති හෙයින් මැලේසියානු රබර් අපනයනකරුවන් සහ විශාල වතු හිමියන් ඔවුන්ගේ විකුණුම් (1974 ජූනි 30 වැනි දින පැවති ප්‍රමාණයෙන්) සියයට 10 කින් කපාහැරීමට එකඟ විය. මිලෙහි පහල යාම තව දුරටත් පැවතියෙන් මැලේසියානු ආණ්ඩුව 1974 නොවැම්බර් මාසයේදී ස්වභාවික රබර් මිල ස්ථාවර කිරීමේ වැඩ පිළිවෙලක් ප්‍රකාශයට පත් කරන ලදී.

දේශීය මිල, ලෝක වෙළඳපලේ මිල උපනතින් අනුව යමින් වර්ෂයේ වැඩි කාලයක් තුලදීම නොකඩවා පිරිහෙමින් පැවතින. වර්ෂයේ මුල් කාර්තුව තුලදී කොළඹ වෙළඳපොලෙහි ආර්. එස්. එස්. නො. 1 මිල රාත්තලක් රුපියල් 1.41 ක් වූ අතර, අවසාන කාර්තුවේදී රාත්තලක් රුපියල් 1.17 දක්වා පහත වැටින. වර්ෂය තුලදීම අවම සහතික මිල ක්‍රමය ක්‍රියාත්මක

වූ අතර කොළඹ වෙළඳපොළෙහි ආර්. එස්. එස්. නො. 1 සහ ආර්. එස්. එස්. නො. 2 සඳහා ගෙවියයුතු අවම මිල වූයේ පිළිවෙලින් රාත්තල ශත 96 හා ශත 89 කි. ප්‍රාදේශීය මධ්‍යස්ථාන වලදී ඒ සඳහා ගෙවියයුතු වූයේ රාත්තලකට ශත 95 සහ ශත 88 කි. නිෂ්පාදන වියදමෙහි වැඩිවීම තදින් බලපාන ආන්තික නිෂ්පාදකයා හට මෙය එක්තරා සහනයක් ගෙන දුනි.

## රටවල් අනුව අපනයන

චීනය වෙත අපනයන කැරුණු රබර් ප්‍රමාණය 1973 දී රාත්තල් 1,528 ලක්ෂයක් වූ අතර 1974 දී එය රාත්තල් 922 ලක්ෂය දක්වා අඩු වුවද පසුගිය වර්ෂවලදී මෙන් ශ්‍රී ලංකාවේ ප්‍රධානතම රබර් ගැනුම්කරුවූයේ චීනයයි. කෙසේ වුවත්, 1974 දී චීනය වෙත යැවූ රබර් අපනයන වටිනාකම රුපියල් දශලක්ෂ 2 429 ක් වූ අතර මෙය 1973 ට වඩා රුපියල් 102 ලක්ෂයක වැඩි වීමකි. යුරෝපීය ආර්ථික ප්‍රජාව ඊළඟ ප්‍රධානතම ගැනුම්කරු විය. මෙයට අපනයන කරන ලද ප්‍රමාණය 1974 දී රාත්තල් 10 ලක්ෂයකින් අඩු වීමක් පෙන්විය. එසේ වුවත් යුරෝපීය ආර්ථික ප්‍රජාවට යැවූ අපනයන අනුපාතය 1973 දී සියයට 16·8 වූ අතර 1974 දී සියයට 20·7 දක්වා වැඩි විය. (එක්සත් රාජධානියට අපනයන කරන ලද රබර් ප්‍රමාණය 1972 රාත්තල් 103 ලක්ෂයක් වූ අතර 1973 රාත්තල් 74 ලක්ෂයක් විය. 1974 දී මෙය තව දුරටත් පහළ වැටුණු අතර අපනයනයන් රාත්තල් 45 ලක්ෂයක් පමණක් විය ) අනිකුත් රටවල් වෙත සුළු ප්‍රමාණයක් අපනයනය කරන ලද අතර ඒවා වැදගත්කමේ අනු පිළිවෙලට එක්සත් සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුව, පෝලන්තය, අ. එ. ජනපදය, රුමේනියාව සහ ජපානයත් වේ.

### II (ඔ) 13 වැනි සංඛ්‍යා සටහන

### රටවල් අනුව රබර් අපනයන

| රට | | පරිමාව (රාත්තල් දශලක්ෂ) | | මුළු පරිමාවෙහි ප්‍රතිශතය | | වටිනාකම (රුපියල් දශලක්ෂ) | | මුළු වටිනාකමෙහි ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1973 | 1974 | 1973 | 1974 | 1973 | 1974 | 1973 | 1974 |
| චීන මහජන සමූහාණ්ඩුව | .. | 152·8 | 92·2 | 43·1 | 32·6 | 232·7 | 242·9 | 39·3 | 32·9 |
| සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමය | .. | 22·6 | 21·9 | 6·4 | 7·7 | 47 5 | 75·1 | 8·0 | 10·2 |
| අමෙරිකා එක්සත් ජනපදය | .. | 14·7 | 13·8 | 4·1 | 4·9 | 34·8 | 43·1 | 5·9 | 5·8 |
| පෝලන්තය | .. | 19·2 | 16·6 | 5·4 | 5·9 | 35·5 | 39·9 | 6·0 | 5·4 |
| රුමේනියාව | .. | 16 6 | 9·9 | 4·7 | 3·5 | 19·2 | 19·1 | 3·2 | 2·6 |
| ජපානය | .. | 6·1 | 2·8 | 1·7 | 1·0 | 12·4 | 11·8 | 2·1 | 1·6 |
| යුරෝපීය ආර්ථික ප්‍රජාව | .. | 59·7 | 58·7 | 16·8 | 20·7 | 102·0 | 145·8 | 17·2 | 19·7 |
| අනෙකුත් රටවල් | .. | 62·7 | 67·2 | 17·7 | 23·7 | 107·9 | 160·7 | 18·3 | 21·8 |
| එකතුව | .. | 354·4 | 283·1 | 100·0 | 100·0 | 592·0 | 738·4 | 100·0 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා රේගුව

## (ඇ) පොල් නිෂ්පාදිත.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ඇස්තමේන්තුවලට අනුව 1974 වර්ෂයේදී පොල් නිෂ්පාදනයෙහි සියයට 5·0 ක වැඩිවීමක් දක්නට තිබුණි. 1973 දී ගෙඩි 19,350 ලක්ෂයක් වූ නිෂ්පාදනය 1974 දී 20,130 ලක්ෂයක් දක්වා වැඩි විය. කෙසේ වුවද මෙම නිෂ්පාදනය අවුරුදු ගණනාවකින් ලබන ලද පහත්ම අස්වැන්නයි. ශ්‍රී ලංකා මහ බැංකුවේ 1973 වාර්ෂික වාර්තාවේ සඳහන් කළ පරිදි 1973 දී පොල් නිෂ්පාදනය පහලයාමට හේතු වූයේ කලක් තිස්සේ පැවති නියඟකාරී තත්ත්වය සමග පොහොර උපයෝජනය අඩුවීම, සමහර පොල් වගා ප්‍රදේශවල පැවති කෘමි වසංගතය, ඉඩම් ප්‍රතිසංස්කරණය මගින් ඇති වූ අවිනිශ්චිතතාවය හේතුකොට ගෙන සමහර විශාල වතු නොසලකා හැරීමට ලක්වීමත් ය. මේවායේ ප්‍රතිවිපාකයන්,

විශේෂයෙන්ම ඉඩම් ප්‍රතිසංස්කරණයෙන් ඇතිවූ අවිනිශ්චිතතාවය හේතුකොටගෙන විශාල වතු නොසලකා හැරීම, 1974 දී ද පොල් නිෂ්පාදනයේ පරිහානියට හේතු විය. 1974 දී පොල් වගා ප්‍රදේශයන් බොහොමයකම සතුටුදායක කාලගුණ තත්ත්වයක් පැවති බැවින් 1975 දී පොල් නිෂ්පාදනයෙහි ඉහළ යාමක් බලාපොරොත්තු විය හැක.

පොල් අලෙවි මණ්ඩලයේ ඇස්තමේන්තුවලට අනුව 1974 පොල් නිෂ්පාදනය ගෙඩි 20,440 ලක්ෂයක් වූ අතර 1973 වර්ෂයේ ගෙඩි 19 350 ලක්ෂය හා සැසඳීමේදී එය ගෙඩි 1,090 ලක්ෂයක හෙවත් සියයට 5·6 කින් වැඩිවීමක් පෙන්නුම් කළේය. පොල් අලෙවි මණ්ඩලයේ වාර්තාවලට අනුව පොල් නිෂ්පාදිත වෙන් වෙන් වශයෙන් ගත්කල සියළුම අංශයන්හි වැඩිවීමක් වී ඇත. කොප්පරා නිෂ්පාදනය 1973 දී ටොන් 98,205 සිට 1974 දී ටොන් 106,765 දක්වා ද පොල්තෙල් නිෂ්පාදනය ටොන් 60,433 සිට 63,833 දක්වා ද කපාපු පොල් ටොන් 37,384 සිට ටොන් 42,461 දක්වා ද පුන්නක්කු ටොන් 30,217 සිට 31,917 දක්වා ද වැඩිවී ඇත.

රේගු වාර්තාවලට අනුව, සියළුම ප්‍රධාන පොල් නිෂ්පාදනත්‍රය යන්ගේ අපනයන වටිනාකම 1973 වූ රුපියල් 1415 ලක්ෂයෙහි සිට 1974 දී රුපියල් 3940 ලක්ෂයක් දක්වා වැඩිවී ඇත. මෙය රුපියල් 2,525 ලක්ෂයක හෙවත් සියයට 175 කටත් වඩා වැඩිවීමකි. අපනයන පරිමාව, 1973 දී ගෙඩි 4,168 ලක්ෂයෙහි සිට 1974 දී ගෙඩි 4657 ලක්ෂය දක්වා ගෙඩි 433 ලක්ෂයක වැඩිවීමක් පෙන්නුම් කෙරේ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1973 ගෙඩියක් ශත 34 ක් වූ සාමාන්‍ය නැ. වි. ස. මිල 1974 ශත 85 දක්වා වැඩිවිය. කොප්පරාවල සාමාන්‍ය නැ. වි. ස. මිල 1973 දී පාරම රුපියල් 324 සිට 1974 දී රුපියල් 567 දක්වා වැඩිවී තිබියදීත් අපනයන ඉපැයීම් රුපියල් 260 ලක්ෂයක අඩුවීමක් පෙන්නුම් කළේය. මෙයට හේතු වූයේ සලකා බලන කාලය තුළදී අපනයන පරිමාවේ පහළ යාමයි.

එහෙත්, 1974 දී පොල්තෙල් වලින් ලත් අපනයන ඉපැයීම් රුපියල් 1,413 ලක්ෂයක් වූයේ, පසුගිය වර්ෂයට වඩා රුපියල් 1,144 ලක්ෂයක හෙවත් සියයට 425 ක ත්‍රිවූ වැඩිවීමකි. මෙයට මුළුමනින්ම හේතු වූයේ 1973 දී ටොන් එකක් රුපියල් 1,489 ක්ව තිබූ පොල් තෙල් වල නැ. වි. ස. මිල රුපියල් 6,573 දක්වා වැඩි වීමයි. කපාපු පොල්වලින් ලත් අපනයන ඉපැයීම් 1973 දී වූ රුපියල් 1,110 ලක්ෂයක සිට 1974 දී රුපියල් 2,518 ලක්ෂය දක්වා වැඩි වී ඇත. කපාපු පොල්වල සාමාන්‍ය නැ. වි. ස. මිල 1973 වූ රාත්තල රුපියල් 1 34 ක සිට 1974 දී රාත්තල රුපියල් 2.68 දක්වා වැඩි වීමත් අපනයන පරිමාව ටොන් 37·3 දහසේ සිට ටොන් 41·9 දහස දක්වා වැඩි වීමත් ඊට හේතුවී ඇත.

**පොල් තෙල්**

රේගු සංඛ්‍යාවලට අනුව, පොල් තෙල් අපනයන පරිමාව 1974 දී ටොන් 21 5 දහසක් විය. මෙය 1973 දී වූ ප්‍රමාණයට වඩා ටොන් 3·4 දහසකින් හෙවත් සියයට 14·3 කින් වැඩිවීමකි. පොල් තෙල් නිෂ්පාදනයේ තරමක වැඩිවීම හැරුණුකොට, අපනයන පරිමාව ඉහළ යාමට හේතුවූයේ, පොල්තෙල්වල අධික මිල නිසා දේශීය පරිභෝජනය අඩුවීමත් දේශීය සබන් කර්මාන්තය සඳහා යොදගන්නා පොල් තෙල්වලට ආදේශකයක් ලෙස ආනයනය කරන ලද ඉටිතෙල් උපයෝගී කර ගැනීමත්ය. 1974 වූ පොල් තෙල් අපනයන පරිමාව, 1973 වර්ෂයේ හැර මෙතෙක් වාර්තාගත වූ අඩුම ප්‍රමාණයයි.

කෙසේවුවද, 1974 වර්ෂයේදී රුපියල් 1,413 ලක්ෂයක් වටිනා පොල් තෙල් අපනයන කළ අතර අපනයන පරිමාව පහත යාම නිසා ඇතිවූ ප්‍රතිඵල කපාහැරීමට ද සමත් විය. එමෙන්ම මෙතෙක් වාර්තාගත ඉහලම නැ. වි. ස. මිලක් අපනයන වටිනාකම තුළින් දැකිය හැක. 1974 දී පොල්තෙල්වල සාමාන්‍ය නැ වි. ස. මිල ටොන් එකක් රුපියල් 6 573 ක් වූයේ, 1973 පැවති මිලට වඩා රුපියල් 5,084 ක හෙවත් සියයට 341 ක වැඩි වීමකි.

දේශීය වෙළඳුන් ලබාගත් අධික වාසි, සැපයුම අඩුවීම හේතු කොට ගෙන ජාත්‍යන්තර වෙළඳ පොල මිළ ඉහල යාම නිසා ඇතිවූ ප්‍රතිඵලයකි. 1973 අවසානය වන විට, අනෙකුත් තෙල් සහ මේදයන්ට වඩා පොල්තෙල් වලට ලෝක වෙළඳ පොලෙහි ලැබුණ මිළ වාරිකය 1974 මුල් කාර්තු තුන තුලදීම පැවතියේය. උදහරණයක් වශයෙන් 1973 දී ලන්ඩන් වෙළඳ පොලෙහි පිලිපයින් පොල්තෙල් ටොන් එකක මි. ර. ගැ. මිළ පවුම් 200 වූ මෙය 1972 ට වඩා සියයට 144 ක වැඩි වීමකි. මෙම තත්ත්වය 1974 මුල් කාර්තුව තුළදී තව දුරටත් වර්ධනය වූ අතර වර්ෂය තුළදී පැවති සාමාන්‍ය මිළ පවුම් 440 ක් විය. මෙය 1973 ට වඩා සියයට 120 ක වැඩි වීමකි. ශ්‍රී ලංකාවේ පොල්තෙල් (කොළඹ) නැ. වි. ස. මිළ 1973 දෙසැම්බර් මාසයෙහි ටොන් එකක් පවුම් 370 වූ අතර 1974 මාර්තු මාසයෙහි එය පවුම් 600 ක් දක්වා වැඩිවිය. එයින් පසු මිල පහත යන උපනතියක් ඇතිව මිල උච්චාවචනය වූ අතර 1974 දෙසැම්බර් මාසයේදී පොල්තෙල් මිල සැලකිය යුතු පහත් මට්ටමකට පත්වූයේ, පවුම් 294 විය. කෙසේ වුවද 1974 සමාන්‍ය වාර්ෂික මිල ටොන් එකක් පවුම් 444 විය. වර්ෂය අවසානයේදී මිළ පහල යාමට හේතු වූයේ, පිලිපයින් සැපයුම වැඩි වීමත් ප්‍රධාන වෙළඳ පොලවල කර්මාන්ත ක්‍රියාවලිය අඩුවීම හේතුකොටගෙන ඉල්ලුම අඩු වීමත්ය.

පරිමා වශයෙන් සහ වටිනාකම් වශයෙන් ප්‍රධානම පොල්තෙල් ගැනුම්කරු වී ඇත්තේ කැනඩාවයි. ඇය 1973 දී හොන්ඩර 66,100 මිළදී ගත් අතර 1974 දී හොන්ඩර 218,236 ක් මිළදී ගත්තාය. හොන්ඩර 53,118 ක් මිළදී ගත් නෙදර්ලන්තය දෙවැනි විශාලතම ගැනුම්කරු විය. හොන්ඩර 49,636 ක් මිලට ගත් ඉතාලිය තවත් වැදගත් ගැනුම්කරුවකු විය.

**කපාපු පොල්**

1974 කපාපු පොල් අපනයන පරිමාව ටොන් 41 9 දහසක් වූ අතර මෙය ඉකුත් වර්ෂයට වඩා ටොන් 4·6 දහසකින් හෙවත් සියයට 12·3 ක ඉහල යාමක් පෙන්වූ නමුදු 1972 අපනයනය කළ ප්‍රමාණයට වඩා පහල මට්ටමක පැවතුණි. 1973 කපාපු පොල් වලින් ලත් අපනයන ඉපැයීම් රුපියල් 1,110 ලක්ෂයක් වූ අතර 1974 දී එය රුපියල් 2,520 ලක්ෂයක් දක්වා වැඩි විය. රුපියල් වටිනාකම අනුව ගෙන බැලීමේදී 1974 දී කපාපු පොල්වලින් ලත් අපනයන ඉපැයීම්, ශ්‍රී ලංකාව මෙතෙක් ලබා ගත් ඉහලම වටිනාකම වේ. 1974 දී කපාපු පොල් වල සාමාන්‍ය නැ. වි. ස. මිළ රාත්තල රුපියල් 2·68 ක් (හොන්ඩරයක් රුපියල් 300ක්) වූයෙන් එය මෙතෙක් වාර්තාගත වූ ඉහලම මිළ විය. මෙය ඉකුත් වර්ෂයට වඩා රාත්තල රුපියල් 1·34 ක (හොන්ඩරයක් රුපියල් 150 ක) වැඩි වීමකි.

කපාපු පොල් වල ජාත්‍යන්තර මිළ ගණන් 1974 දී තව දුරටත් වැඩි විය. ලන්ඩන් වෙළඳ පොලෙහි ශ්‍රී ලංකාවේ කපාපු පොල් වල මිල 1972 දී ටොන් එකක් පවුම් 140 සිට 1973 දී ටොන් එකක් පවුම් 253 ක් විය. 1974 මෙය ටොන් එකක් පවුම් 512 දක්වා වැඩි විය. (1974 ආරම්භයේදී කපාපු පොල්වල මිළ පවුම් 439 වූ අතර මුල් කාර්තුව තුළදී එය ක්‍රමයෙන් වැඩිවී අප්‍රේල් මාසයේදී ටොන් එකක් පවුම් 564 දක්වා ඉහල මට්ටමකට ලඟා විය. ඉන් පසුව ක්‍රමයෙන් මිල අඩු වූ නමුදු කපාපු පොල් ටොන් එකක් රන් පවුම් 400 ට අධිකව පැවතියේය).

ජාත්‍යන්තර වෙළඳ පොලෙහි මිල ඉහල යාමේ ප්‍රතිඵලයක් වශයෙන් කපාපු පොල්වල දේශීය මිළෙහි ද ඉහල යාමක් සිදුවිය. 1973 දෙසැම්බර් මාසයේ දී දේශීය වෙළඳ පොලෙහි කපාපු පොල්වල සාමාන්‍ය මිළ රාත්තල රුපියල් 1·24 ක් වූ අතර 1974 මාර්තු මාසයේ දී එය රුපියල් 1·68 දක්වා වැඩි විය. එහෙත් 1974 දෙසැම්බර් මාසයේදී රාත්තල රුපියල් 1·21 වූ අතර මෙය පසුගිය වර්ෂයේ එම මාසයට වඩා සුළු වශයෙන් අඩුවීමක් පෙන්විය. 1974 වර්ෂයේදී කපාපු පොල් වල වාර්ෂික සාමාන්‍ය මිළ රුපියල් 1·42 ක් විය. 1973 දී වාර්ෂික සාමාන්‍ය මිළ වූයේ රාත්තල ශත 90 කි.

අපනයන මිළ ගණන්වලට අනුව, කපාපු පොල් මෝල් කරුවන්ට ද සාධාරණ මිලක් ලබා දීමේ අරමුණ ඇතිව දේශීය වෙළඳ පොළෙහි කපාපු පොල් ගණුදෙනු සඳහා 1974 ජූනි මස 10 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි දර්ශක මිළ ක්‍රමයක් පොල් අලෙවි මණ්ඩලය මගින් හඳුන්වා දෙන ලදී. මෙම ක්‍රමයෙහි ප්‍රධාන ලක්ෂණය වූයේ පොල් අලෙවි මණ්ඩලය මගින් දිනපතා යෝජිත මිළක් ප්‍රකාශයට පත් කිරීමය. මෙම මිල නියම කරන ලද්දේ පවතින විදේශීය විකුණුම් මිළෙන් (නැ. වි. ස. වට්නාකමෙන්) තීරු ගාස්තු හා අපනයන කරුවන්ගේ වෙනත් වියදම් ද අඩු කිරීමෙනි. ගණුදෙනු වලදී පැවතිය යුතු නියම මිල යෝජිත මිලෙන් ශත 5 කින් අඩු හෝ වැඩි නොවන තත්ත්වයක් අපේක්ෂා කෙරිණි පොල් අලෙවි මණ්ඩලය මගින් වාර්තා කරන පරිදි මෙම දර්ශක මිළ ක්‍රමය 1974 වර්ෂයේ දී සතුටුදායක ලෙස ක්‍රියාත්මක වූ අතර මෙය සාර්ථක කර ගැනීමට මෝල් කරුවන්, නැව් කරුවන් සහ තැරැව්කරුවන්ගේ සහයෝගය ද ලැබිණි.

එක්සත් රාජධානිය වෙත යැවුනු කපාපු පොල් අපනයන 1973 දී වූ හොන්ඩර 237,300 සිට 1974 දී හොන්ඩර 267,815 දක්වා වැඩි වී ඇත. 1974 දී කපාපු පොල් හොන්ඩර 132,391 ක් මිළදී ගත් ජර්මන් පෙඩරල් සමූහාණ්ඩුව දෙවැනි විශාලතම ගැනුම්කරු විය. අනිකුත් ගැනුම්කරුවන් අතර නෙදර්ලන්තය සහ ප්‍රංශය වැදගත් වේ.

**කොප්පරා**

රේගු සංඛ්‍යා අනුව, කොප්පරා අපනයන පරිමාව 1973 දී වූ ටොන් 2·7 දහසේ සිට 1974 දී ටොන් 0·4 දහස දක්වා සැලකියයුතු ප්‍රමාණයකින් අඩුවුනි. මෙය 1973 ට වඩා ටොන් 2·3 දහසකින් පහල වැටීමකි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් කොප්පරා වලින් ලත් අපනයන ඉපැයීම් 1973 දී රුපියල් 35 ලක්ෂයේ සිට රුපියල් 9 ලක්ෂය දක්වා පහල වැටිනි. කොප්පරා අපනයන සීමාකිරීම 1974 වර්ෂයේ දීත් පැවතුනි.

1974 ජූලි මාසයේ දී පොල් අලෙවි මණ්ඩලය විසින් කොප්පරා ආනයන-අපනයන ක්‍රමයක් ද හඳුන්වා දෙන ලදී. මේ අනුව වතු කොප්පරා නො 1 ටොන් 1000 ක් අපනයනය කෙරෙන අතර ඒ හා සමාන ප්‍රමාණයක් තෙල් ඇඹරීමට සුදුසු කොප්පරා ආනයනය කරනු ලැබිය. මේ හේතුවෙන් සමහර විදේශීය වෙළඳ පොල වල වාරික මිළක් ලැබෙන උසස් වර්ගයේ කොප්පරා අපනයනය කිරීමට ශ්‍රී ලංකාවට හැකි විය. ආනයන-අපනයන ක්‍රමයත් සකස් කලේ තෙල් ඇඹරීමට සුදුසු කොප්පරා සැපයුමත් සහ සත්වාහාර (පුන්නක්කු) නිෂ්පාදනයත් කහවුරු කිරීමටය.

1974 දී ලෝක වෙළඳ පොලෙහි කොප්පරා මිළ වැඩිවීම දේශීය වෙළෙඳ පොලෙහි ද පිළිබිඹු විය. පිලිපයින් කොප්පරා වල මි. ර. ගැ. මිළ (යුරෝපීය) 1973 දී ටොන් එකක් ඇ. එ. ජ. ඩොලර් 350 ක් වූ අතර 1974 දී එය ඇ. එ. ජ. ඩොලර් 675 දක්වා වැඩි විය. 1974 මාර්තු මාසය සඳහා සමාන්‍ය මිළ ඇ. එ. ජ. ඩොලර් 860 විය. මේ මිළ උපනතිය අනුගමනය කරමින් දේශීය වෙළඳ පොලෙහි වෙළඳුන්ගේ කොප්පරා මිළ ද 1973 දී පාරම රුපියල් 313 සිට 1974 දී පාරම රුපියල් 565 දක්වා ඉහල ගියේය. වෙනත් වචන වලින් කිව හොත් දේශීය වෙළඳ මිළ 1973 දෙසැම්බර් මාසයෙහි පාරම රුපියල් 373 වූ දේශීය කොප්පරා මිළ 1974 අප්‍රේල් මාසයෙහි පාරම රුපියල් 700 දක්වා ඉතා ඉහල තත්ත්වයකට ක්‍රමිකව වැඩි වුනි. ඉන් පසුව ක්‍රමයෙන් මිළ අඩු වී ගිය අතර 1974 දෙසැම්බර් මාසය වන විට පාරම රුපියල් 378 ක්වූ පෙර මට්ටමට කිට්ටු තත්වයකට පත්විය.

පොල් අලෙවි මණ්ඩලයේ සංඛ්‍යා අනුව පුන්නක්කු නිෂ්පාදනය, 1973 දී ටොන් 30,217 සිට 1974 දී ටොන් 31,917 දක්වා සියයට 5·6 කින් වැඩි වී ඇත. 1974 දී දේශීය වෙළඳ පොලෙහි පුන්නක්කු ටොන් එකක් රුපියල් 933 ක් විය. මෙය 1973 දී මිල වූ ටොන් එකක් රුපියල් 787 ට වඩා රුපියල් 146 කින් වැඩිවීමකි 1974 මුල් භාගයෙහි මිළෙහි ඉහලයාමට හේතු වූයේ පුන්නක්කු සැපයුම පහත වැටීමයි. මේ නිසා 1974 අප්‍රේල් මාසයේදී පුන්නක්කු ටොන් එකක මිළ රුපියල් 1313 දක්වා ඉහල මට්ටමකට වැඩිවිය. කෙසේ වුවද පුන්නක්කු සැපයුම වැඩි වීමත් සමග මිළ පහල වැටුනු අතර වර්ෂය අවසානයේදී ටොන් එකක සාමාන්‍ය මාසික මිළ රුපියල් 609 විය.

වර්ෂය මුළුල්ලේම කොප්පරා අපනයන සීමාකිරීම බල පැවැත්වුයෙන් අපනයන ප්‍රමාණය ඉතා පහත් මට්ටමක විය. මෙම වර්ෂයේ දී ඉන්දියාව සහ පකිස්ථානය කොප්පරා මිළ දී ගත්තේ ඉතාමත් සුළු ප්‍රමාණයකි.

### II (ඔ) 14 වැනි සංඛ්‍යා සටහන.

### ප්‍රධාන පොල් නිෂ්පාදිත : අපනයන පරිමාව සහ මිල 1970 – 1974

| වර්ෂය | පරිමාව | | | | | නැ. වි. ස. මිල | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | පොල් තෙල් හොන්ඩර දහස් (1) | කොප්පරා හොන්ඩර දහස් (2) | කපාපු පොල් හොන්ඩර දහස් (3) | ගෙඩි පොල් ගෙඩි දහස් (4) | 1, 2, 3 සහ 4 එකතුව (ගෙඩි ප්‍රමාණය අනුව) ගෙඩි දශලක්ෂ | පොල් තෙල් ටොන් එක රුපියල් | කොප්පරා පාරම රුපියල් | කපාපු පොල් රාත්තල රුපියල් | ගෙඩි පොල් ගෙඩිය ශත |
| 1970 | 1,142 | 305 | 967 | 6,321 | 880 | 2,037·60 | 371·90 | 0·91 | 0·46 |
| 1971 | 1,388 | 344 | 1,043 | 8,567 | 1,019 | 2,142·40 | 349·72 | 0·88 | 0·45 |
| 1972 | 1,709 | 872 | 973 | 10,478 | 1,258 | 1,548·69 | 296·39 | 0·72 | 0·41 |
| 1973 | 361 | 55 | 742 | 5,118 | 422 | 1,488·80 | 324·25 | 1·34 | 0·68 |
| 1974 | 430 | 8 | 838 | 2,836 | 468 | 6,573·17 | 566·91 | 2·68 | 0·85 |

මූලය: ශ්‍රී ලංකා රේගුව.

#### (ඇ) තෝරාගත් කර්මාන්ත අපනයන

1973 සහ 1974 යන වර්ෂයන්හි දී රේගුව විසින් අනුගමනය කල ශීර්ෂ අංකයන්ගේ යම්යම් වෙනස්කම් නිසා 1973 කර්මාන්ත අපනයනයන් සමහරක් හඳුනා ගැනීම අපහසු වී ඇත. එමනිසා 1973 දී මුළු කර්මාන්ත අපනයන වටිනාකම අඩුවෙන් ප්‍රකාශ වී ඇත.

මෙම සීමාකම්වලට යටත්ව, II (ඔ) 15 සංඛ්‍යා සටහනෙහි 1974 වර්ෂය සඳහා දැක්වෙන තෝරාගත් කර්මාන්ත අපනයනයන්හි වටිනාකම දෙගුණයකටත් වඩා වැඩි වී ඇත. මෙයට ප්‍රධාන හේතුව වූයේ නැප්තා, ඉන්ධන තෙල්, මුහුදු බන්කර, සහ ගුවන් ඉන්ධන අපනයන වටිනාකම 1973 වූ රුපියල් 1340 ලක්ෂයෙහි සිට 1974 දී රුපියල් 3500 ලක්ෂය දක්වා වැඩි වීමයි. අනතුරුව බොරතෙල් මිලෙහි තියුණු ඉහළ යාමක් දක්නට තිබුණි. II (ඔ) 15 සංඛ්‍යා සටහනෙහි දැක්වෙන පරිදි අනිකුත් තෝරාගත් කර්මාන්තයන්ගේ අපනයන වටිනාකම ද සැලකිය යුතු ලෙස වැඩි වී ඇත.

## තෝරාගත් කර්මාන්ත අපනයන

| | 1973 වටිනාකම (රුපියල්) | 1974 වටිනාකම (රුපියල්) |
|---|---|---|
| අ. කාර්මික නිෂ්පාදිත | | |
| 1. ආහාර පානවර්ග සහ දුම්කොළ (අ) බේකරි නිෂ්පාදිත විස්කෝතු සහ අනිකුත් බේකරි නිෂ්පාදිත .. | 885,703 | 970,270 |
| (ආ) කොකෝවා සහ ක්ෂණික තේ | | |
| (i) කොකෝවා තලප .. .. | ල·නො· | 348,873 |
| (ii) කොකෝවා පිටිපැණිරස නොකල .. .. | ල·නො· | 267,018 |
| (iii) ක්ෂණික තේ සහ තේ මලු .. .. | 5,617,481 | 6,502,493 |
| (ඇ) ටින් කළ හෝ බෝතල්වල ඇසුරූ පලතුරු සහ අනිකුත් එලවළු යුෂ .. .. | | |
| (i) අන් ලෙසකින් පිළියෙල කරන ලද සුරක්ෂිත කරන ලද හෝ ටින්වල හෝ බෝතල්වල ඇසුරූ පලතුරු .. | 2,500,095[1] | 1,205,290 |
| (ii) පලතුරු යුෂ සහ එළවළු, වියළනලද යුෂ .. .. | ල·නො· | 1,167,571 |
| (ඇ) මාලු - අලුත් මාලු ශීත කරනලද හෝ පිරිමුදවන ලද - ඉස්සන් සහ බෙල්ලන් හැර .. | | |
| ( ) මාලු අලුත් - සජීව හෝ අජීව ශීතකළ හෝ පිරිමුදවන ලද .. .. | 17,684,008[2] | 4,994,218 |
| (ii) මාලු ලුණු දියරේලු ලුණුදැමූ ගිල්වූ හෝ දුම්ගැස්වූ මෝර වරල් සහ මාලු බිත්තර .. | 2,532,675[3] | 1,848,860 |
| (iii) ඉස්සන් සහ බෙල්ලන් .. .. | 1,691,888[4] | 19,919,525 |
| (ඉ) සත්වාහාර පුන්නක්කු සහ වෘක්ෂ තෙල්වලින් ලැබෙන අවශේෂ ද්‍රව්‍ය .. .. | 3,214,501 | 1,524,671 |
| (ඊ) සකස් කළ දුම්කොළ නිෂ්පාදිත දුම්කොළ සාරක සහ සාර වර්ග .. .. | 126,285 | 570,497 |
| 2. රෙදි පිළිසහ ඇඳුම් පැළඳුම් (i) කෘතිම රෙදිවලින් වියනලද පැබ්රික් රෙදි .. .. | 3,994,210[5] | 381,988 |
| (ii) වියනලද වෙනත් කපු රෙදි .. .. | | 1,687,328 |
| (iii) පිරිමින්ගේ හා පිරිමි ළමයින්ගේ පිට ඇඳුම් .. .. | 11,374,054 | 13,226,152 |
| (iv) ගැහැණුන්ගේ සහ ගැහැණු ළමයින්ගේ හා ළදරුවන්ගේ පිට ඇඳුම් .. .. | | 10,951,275 |
| 3. තෙල් (i) පැඟිරි තෙල් .. .. | 4,177,334 | 5,616,938 |
| (ii) කුරුඳු කොළ තෙල් .. .. | 1,827,056 | 4,959,543 |
| (iii) කුරුඳු පොතු තෙල් .. .. | 768,062 | 674,493 |
| (iv) වෙනත් .. .. | 2,280,191 | 6,401,254 |
| 4. රසායනික නිෂ්පාදිත (i) මේද අම්ල ශුද්ධ කිරීමෙන් ලබාගත් අම්ල තෙල් .. .. | 6,916,963 | 3,922,083 |
| (ii) ග්ලිසරෝල් සහ ග්ලිසරෝල් ලයිස් ග්ලිසරින් .. .. | 2,741,771 | 5,577,380 |
| (iii) මාපරින් ඌරුතෙල් සහ වෙනත් පිළියෙල කළ බාද්‍ය මේද .. .. | ල·නො· | 5,035,600 |
| 5. ඛනිජ තෙල් නිෂ්පාදිත (i) නැප්තා .. .. | 19,459,374 | 81,514,538 |
| (ii) ඉන්ධන තෙල් .. .. | 4,141,554 | 6,657,278 |
| (iii) මුහුදු බත්කර සහ ගුවන් ඉන්ධන .. .. | 110,809,603 | 261,865,341 |
| 6. සම්, රබර්, දුව සහ පිගන් නිෂ්පාදිත (i) ගමන් බඩු .. .. | 268,157[6] | 553,524 |
| (ii) පදම්කල සම්වලින් හෝ පදම්කල සම් සංයුතිවලින් තැනූ වෙනත් භාණ්ඩ .. .. | 85,867 | 159,374 |
| (iii) සම්වලින් සාදන ලද පිටපාද තලය සඳහා පා වැසුම් .. .. | 901,009 | 3,669,647 |
| (iv) වල්කනයිස් කළ රබර්වලින් තැනූ සම්ප්‍රේෂක වාහන හෝ ආරෝහක පටි හෝ පටි රෙදි .. | ල·නො· | 457,272 |
| (v) රබර් ටයර් රබර් කේසස් සහ රබර් ටියුබ් ආදිය .. .. | 2,090,115 | 700,950 |
| (vi) දැඩි නොකළ වල්කනයිස් කළ වෙනත් භාණ්ඩ .. .. | 581,433 | 928,187 |
| (vii) ලීයෙන් කළ වෙනත් භාණ්ඩ .. .. | 1,859,863 | 2,921,034 |
| viii) ගේදෙර හෝ සනීපාරක්ෂක කටයුතු සඳහා ගන්නා සම් බඩු සහ වෙනත් ද්‍රව්‍ය .. .. | 80,925 | 6,453,246 |
| 7. සිමෙන්ති (i) බොර සිමෙන්ති, පෝට්ලන්ඩ් සිමෙන්ති, සුපර් සල්පේට් සිමෙන්ති ආදිය .. .. | 581,673 | 16,007,678 |
| 8. යාන්ත්‍රික සහ යන්ත්‍ර සූත්‍ර උපකරණ (i) යන්ත්‍ර සූත්‍ර .. .. | ල·නො· | 3,586,875 |
| (ii) යන්ත්‍ර සූත්‍ර සහ යාන්ත්‍රික උපකරණ වෙනත් .. .. | 817,820 | 818,495 |
| කාර්මික නිෂ්පාදනවල මුළු එකතුව .. .. | 210,010,170 | 484,046,759 |
| ආ. පතල් කැණීම් (i) ස්වාභාවික මිණිරන් .. .. | 11,641,421 | 15,555,550 |
| (ii) ඉල්මනයිට් .. .. | 7,337,454 | 7,303,382 |
| (iii) ලෝප්පස් හහ යකඩ පයරයිටිස් - වෙනත් .. .. | ල·නො· | 2,688,433 |
| පතල් කැනීම්වල මුළු එකතුව .. .. | 18,978,875 | 25,547,365 |
| මුළු එකතුව .. .. | 223,935,045 | 509,594,124 |

මූලය: ශ්‍රී ලංකා රේගුව, සහ ඛනිජ තෙල් නීතිගත සංස්ථාව.

1. ටින්වල හෝ බෝතල්වල ඇසුරූ පලතුරු. 2. අළුත් මාළු. 3. මාළු බිත්තර මෝර වරල්. 4. ලුණු දැමූ වියලූ සහ දුම් ගස්වන ලද මාළු. 5. කපු බතික් රෙදි. 6. සූට් කේස් සහ ගමන් මලු.

තෝරාගත් කර්මාන්ත අපනයනයන්ගේ විශාල කොටසක් අඩංගු වන ඛනිජ තෙල් නිෂ්පාදනයන්ගෙන් ලත් ඉපැයීම සියයට 167·9 කින් වැඩි වී ඇත. මෙවායින්, නැප්තා ඉපැයීම සියයට 319 කින් ද මුහුදු බන්කර සහ ගුවන් ඉන්ධන පිළිවෙලින් සියයට 136 කින් සහ සියයට 60 කින් ද වැඩි වී ඇත.

අනිකුත් කර්මාන්ත අපනයන ඉපැයීම අතර වඩාත් වැඩිවීම් වාර්තා කරන ලද්දේ සකස් කළ දුම්කොළ (සියයට 352 රෙදිපිළි (සියයට 113) ග්ලිසරෝල් සහ ග්ලිසරෝල් ලයිස් (සියයට 103) ගමන් බඩු (සියයට 109) සම් වලින් සෑදූ පාවහන් (සියයට 307) මේස බඩු, ගෘහස්ථ සහ සනීපාරක්ෂක කටයුතු සඳහා යොදගන්නා වෙනත් ද්‍රව්‍ය (සියයට 7874) සිමෙන්ති (සියයට 2652) සහ යාන්ත්‍රික උපකරණද වේ.

**(ඉ) වෙනත් කෘෂි අපනයන සහ කර්මාන්ත නොවන අපනයන.**

තෝරා ගත් සුළු අපනයන භෝගයන් හි කොළඹ වෙළඳ පල මිළ ගණන් 16 (ඔ) II සංඛ්‍යා සටහනින් දක්වේ සුදු හා දුඹුරු පැපොල් කිරි හැර අනෙකුත් සුළු අපනයන භෝගයන් හි සැලකිය යුතු මිළ වැඩිවීම් වාර්තා කෙරිත. මෙම ඉහළ යාම් වලට ප්‍රධාන වශයෙන්ම හේතු වී ඇත්තේ, 1974 වර්ෂයේ ලෝක වෙළඳ පොළෙහි පැවතීගෙන එන උත්පාත තත්ත්වයයි.

නිදර්ශනයක් වශයෙන් ලන්ඩන් වෙළඳපොලෙහි කොකෝවා ටොන් එකක මිළ 1973 වර්ෂයේ පවුම් 513 සිට 1974 දී පවුම් 812 දක්වා සියයට 58 කින් ඉහළ ගොස් ඇත. වතු කොකෝවා නොං 1, 1973 වර්ෂයේ හොණ්ඩරය රුපියල් 467 සිට 1974 වර්ෂයේ හොණ්ඩරය රුපියල් 720 දක්වා සියයට 54 කින් වැඩිවූ බව වාර්තා කෙරේ. කුරුඳු පොතු සහ කුරුඳු කූරු 1973 වර්ෂයේ පිළිවෙලින් රාත්තල පැන්ස 0·25 ක් සහ රාත්තල පැන්ස 7·6 ක් වූ අතර 1974 වර්ෂයේ රාත්තල පැන්ස 0 43 ක් සහ රාත්තල පැන්ස 9·8 ක් දක්වා ඉහළ ගොස් ඇති අතර, කොළඹ වෙළඳ පලෙහි කුරුඳු පොතු රාත්තලක සාමාන්‍ය මිල 1973 වර්ෂයේ රුපියල් 4·58 සිට 1974 වර්ෂයේ රුපියල් 7·31 දක්වා ද, කුරුඳු කූරු පාරමක මිළ රුපියල් 451 සිට පාරම රු. 514 දක්වා ද ඉහළ යාම් පෙන්නුම් කෙරේ. 1973 වර්ෂයට පෙර මෙම සියළුම ද්‍රව්‍යයන් හි මිළ ගණන් හි සාමාන්‍ය වශයෙන් අඩුවීමේ උපනතියක් දක්නට තිබුණි.

1972 වර්ෂයේදී රාත්තලක් රුපියල් 15·94 ක් වූ කරදමුංගු මිළ 1973 දී රාත්තල රුපියල් 29 52 දක්වා සියයට 85 කින් ද 1974 දී රාත්තල රුපියල් 34·30 දක්වා සියයට 16 කින් ද ඉහළ ගියේය. ලන්ඩන් හි සාමාන්‍ය වෙළඳ පල මිළ ද පවුම් 1·05 සිට පවුම් 1·62 දක්වා ඉහල ගිය බව පෙනේ.

සුදු හා දුඹුරු පැහැති ගස් ලබු කිරිවල සාමාන්‍ය මිළ කලින් වර්ෂයන්හි දී ඉහළ යන උපනතියක් දක්වූ නමුත්, 1974 වර්ෂයේදී එම වර්ග දෙකෙහි මිළ පිළිවෙලින් රාත්තල රුපියල් 36·15 හා රාත්තල රුපියල් 23·53 දක්වා සියයට 17 කින් සහ සියයට 38 කිකින් පහළ ගියේය. ලන්ඩන් වෙළඳ පලෙහි සුදු ගස්ලබු කිරි මිල 1973 හා 1974 වර්ෂයන් හි දී නොදක්වන ලද අතර දුඹුරු ගස්ලබු කිරි මිල රාත්තල පවුම් 1·25 ක සිට පවුම් 1·35 දක්වා ඉහළ ගියේය.

1974 පොල් නිෂ්පාදිතවලට ලැබුණු සතුටු දයක මිළ ගණන් නිසා මෙට්ට කොහු, බ්‍රිස්ටල් කොහු හා පොල් කටු අඟුරු ආදී අනෙකුත් පොල් නිෂ්පාදිතවලටද වාසි ලැබුනේය. ලන්ඩන් වෙළඳ පොළෙහි මෙට්ට කොහු මෙට්‍රික් ටොන් එකක මිල 1973 දී පවුම් 65·72 ක සිට 1974 දී පවුම් 117·15 දක්වාත් බ්‍රිස්ටල් කොහු මෙට්‍රික් ටොන් එකක මිළ පවුම් 108·27 ක සිට පවුම් 156·64 දක්වාත් වැඩි විය. මෙම ජාත්‍යන්තර මිල උපනතිය අනුගමනය කරමින් දේශීය වෙළඳ පොලෙහි මෙට්ට කොහු හොණ්ඩරයක මිල 1973 දී රුපියල් 22·77 ක සිට 1974 දී හොණ්ඩරය රුපියල් 36·95 දක්වාද බ්‍රිස්ටල් කොහු හොණ්ඩරයක මිල රුපියල් 53·00 ක සිට රුපියල් 79·86 දක්වාද ඉහල ගියේය. පොල් කටු අඟුරුවල දේශීය මිලෙහි වැඩිවීම 1974 දී සියයට 241 ක තරම් ඉහල මට්ටමක විය.

## II (ඔ) 16 වැනි සංඛ්‍යා සටහන

## තෝරා ගත් සුළු අපනයන භාණ්ඩයන්ගේ කොළඹ වෙළෙඳපළෙහි සාමාන්‍ය මිල

ඒකකය රුපියල්

| | ඒකකයේ ප්‍රමාණය | වාර්ෂික සාමාන්‍යය | | | | | 1974 කාර්තු සාමාන්‍යය | | | | සියයට ගණනෙහි වෙනස | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1970 | 1971 | 1972 | 1973 | 1974 | 1 වැනි | 2 වැනි | 3 වැනි | 4 වැනි | 1970 ට වඩා 1971 | 1971 ට වඩා 1972 | 1972 ට වඩා 1973 | 1973 ට වඩා 1974 |
| කොකෝවා[1] .. | හොන්ඩරය | 239·19 | 228·30 | 214·69 | 466·71 | 720·02 | 643·02 | 734·33 | 751·28 | 767·19 | − 4·6 | − 5·9 | +106·0 | + 54·3 |
| කුරුඳු කුරු[2] .. | රාත්තල | 4·58 | 3·87 | 3·24 | 4·58 | 7·31 | 7·39 | 6·93 | 7·53 | 7·37 | − 15·5 | − 16·3 | + 41·4 | + 59·6 |
| කුරුඳු පොතු[3] .. | පාරම | 267·52 | 286·50 | 283·87 | 450·61 | 514·26 | 462·71 | 513·33 | 590·00 | 491·00 | + 7·1 | − 0·9 | + 58·7 | + 14·1 |
| කර්දමුංගු[4] .. | රාත්තල | 29·03 | 15·07 | 15·94 | 29·52 | 34·30 | 31·21 | 36·98 | 38·44 | 30·55 | − 48·1 | + 5·8 | + 85·2 | + 16·2 |
| සුදු ගස්ලබු කිරි .. | රාත්තල | 14·53 | 15·47 | 22·22 | 38·73 | 36·15 | 42·44 | 41·00 | 36·03 | 25·13 | + 6·5 | + 43·6 | + 74·3 | − 6·7 |
| දුඹුරු ගස්ලබු කිරි .. | රාත්තල | 9·40 | 13·05 | 19·66 | 31·37 | 23·53 | 32·40 | 29·33 | 19·92 | 12·48 | + 38·8 | + 50·6 | + 59·6 | − 25·0 |
| කොහු කෙඳි (මෙට්ට)[5] .. | හොන්ඩරය | 16·88 | 19·85 | 17·86 | 22·77 | 36·95 | 31·10 | 36·16 | 40·81 | 39·74 | + 17·6 | − 10·5 | + 27·5 | + 62·3 |
| කොහු කෙඳි (බ්‍රිස්ටල්)[6] .. | හොන්ඩරය | 38·03 | 40·63 | 42·32 | 53·00 | 79·86 | 70·85 | 77·00 | 84·91 | 86·67 | + 6·8 | + 4·1 | + 25·2 | + 50·7 |
| පොල්කටු අඟුරු[7] .. | ටොන්එක | 320·21 | 443·07 | 238·76 | 450·54 | 1538·18 | 1032·50 | 1851·04 | 1954·17 | 1315·00 | + 38·4 | − 46·1 | + 88·7 | +241·4 |

මූලයයන්: විවිධ නිෂ්පාදිත සඳහා වූ සතිපතා වෙළඳ වාර්තා; ලංකා වෙළඳ මණ්ඩලය, සතිපතා මිල ලැයිස්තු.

1. චතු නො. 1.
2. අගනා/0000.
3. ගැණුම් කරුවන්ගේ ගබඩා වල නො අසුරන ලද වැලි සහ දූවිලි වෙන් කළ.
4. නො. 1 ග්‍රීන් එස්ටේට්.
5. නො. 1 වර්ගය.
6. බැදි 3.
7. ගැණුම් කරුවන්ගේ මලුවල.

අපනයන

1973 වාර්ෂික වාර්තාවෙහි සඳහන් දත්ත සමග සසඳන විට, 1974 දී, තෝරාගත් කෘෂි කාර්මික හා කාර්මික නොවන අපනයනයන්හි වාර්ෂික වටිනාකම්වල වෙනසක් දක්නට ලැබෙන්නේ, ඛණිජ මිනිරන් හා ඉල්මනයිට යන අපනයන කාර්මික අපනයන ගණයට මාරු කිරීම නිසයි.* කෙසේ වුවද වටිනාකම අනුව බලන විට තෝරාගත් කෘෂිකාර්මික, සහ සම්ප්‍රදායික නොවන භාණ්ඩයන්හි අපනයන වටිනාකම 1973 දී රුපියල් 3,032 ලක්ෂයක සිට 1971 දී රුපියල් 3,478 ලක්ෂය දක්වා ඉහල ගියේය.

II (ඔ) 17 වැනි සංඛ්‍යා සටහනින් දක්වෙන පරිදි කරද මුංගු, ගම්මිරිස්, නිෂ්පාදනය නොකළ දුම්කොළ, සහ මැණික් හැර අනිකුත් සියළුම භාණ්ඩ අපනයන වලින් ලත් ආදයම විවිධ තරාතිරම් වලින් වැඩිවී ඇත අපනයන කරන ලද ප්‍රමාණ හා ඒවාට ලැබූ වටිනාකම් හි වෙනස්වීම් කුමන අන්දමින් සිදු වුවද මැණික් හැර ඉහත කී අනිකුත් සෑම අපනයනයන්හිම මී. ර. ගැ. මිල සැලකිය යුතු අන්දමින් ඉහල ගිය බව දිස්වේ. එම නිසා එවැනි තෝරාගත් අපනයනයන්හි මුළු වටිනාකම ඉහල නැගීමට ප්‍රධාන හේතුව වූයේ පරිමාව වැඩිවීමට වඩා මිළ වැඩි වීමය. ඇත්ත වශයෙන් 1974 දී කරද මුංගු ගම්මිරිස්, කරාබු නැටි, කොකෝවා, ඇට නිෂ්පාදනය නො කළ දුම්කොල අපනයන ප්‍රමාණය 1973 හා බලන විට අඩුවූ බව පෙනේ.**

බ්‍රිස්ටල් කොහු අපනයන ප්‍රමාණය 1973 දී හොණ්ඩර 578,300 ක සිට 1974 දී හොණ්ඩර 645,000 දක්වා වැඩි වූ අතර මෙට්ට කොහු අපනයනයන් හොණ්ඩර 1,441,100 සිට හොණ්ඩර 1,429,000 දක්වා පහත වැටුණි. බ්‍රිස්ටල් කොහු අපනයන ඉපැයීම් ඉහළ යාමට තුඩු දුන්නේ එක් අතකින් ඒවායේ අපනයන පරිමාව ඉහල යාමත් අනික් අතින් ඒවායේ මී. ර. ගැ. මිළ 1973 දී හොණ්ඩරය රුපියල් 61·78 ක සිට 1974 දී හොණ්ඩරය රුපියල් 73·02 දක්වාඉහළ යාමත් නිසාය අපනයනය කරන ලද පරිමාණයෙහි සුළු පහත වැටීමක් දිස් වුවද 1974 දී මෙට්ට කොහු වලින් ලත් ඉපැයීම රුපියල් 613 ලක්ෂයක් වූයේ සියයට 69·3 ක වැඩි වීමක් පෙන්නුම කළේය. මීට එකම හේතුව වූයේ මී. ර. ගැ. මිළ 1973 දී හොණ්ඩරයක් රුපියල් 25·12 ක සිට 1974 දී රුපියල් 42·89 දක්වා සියයට 70·7 කින් ඉහළ යාමයි. පොල් කටු, පොල් කටු කුඩු හා කාබන් ආදී නිෂ්පාදිතවලින් සමන්විතවූ පොල් කටු නිෂ්පාදිත අතුරින් ප්‍රධානම අපනයන ද්‍රව්‍ය වූයේ පොල් කටු අඟුරුය. පොල් කටු අඟුරු අපනයනයෙන් ලත් ඉපැයීම 1973 දී රුපියල් 15 ලක්ෂයක සිට 1974 දී රුපියල් 314 ලක්ෂය දක්වා ඉහළ ගියේය. 1974 දී අපනයනය කල පොල් කටු අඟුරු පරිමාව මෙන්ම ඒවායේ මී. ර ගැ. මිළ ද ඉහල යාම මෙම වැඩිවීමට තුඩු දුන් අතර මිළ ගණන් මෙහි ලා බලපෑ ප්‍රධාන සාධකය විය.

---

*. තෝරා ගත් කාර්මික අපනයනයන් පිළිබඳ II (ඔ) 15 සංඛ්‍යා සටහන බලන්න.

**. කරාබු නැටි හා ගම්මිරිස් ටොන් එකක මිල ලන්ඩන් වෙළඳපලෙහි පිළිවෙලින් පවුම 1668·75 සිට පවුම 2323·93 දක්වාත් පවුම 749·07 සිට පවුම 946·22 දක්වාත් ඉහල ගියේය.

**(ඊ) මැණික්**

රේගු දත්තයනාට අනුව අගනා හා අර්ධ අගනා ගල් වර්ග අපනයනය කිරීමෙන් ලැබූ ඉපැයීම 1973 දී රුපියල් 1,198 ලක්‍ෂයක සිට 1974 දී රුපියල් 1095 ලක්ෂය දක්වා රුපියල් 313 ලක්ෂයකින් හෙවත් සියයට 22·2 කින් පහත වැටුනි. එහෙත් 1973 වර්ෂයේදී එකී ඉපැයීම 1972 වර්ෂයට වඩා රුපියල් 964 ලක්‍ෂයකින් හෙවත් සියයට 784 කින් වැඩිවී තිබුණි. ශ්‍රී ලංකාවේ මුළු අපනයන ඉපැයීම හි ප්‍රතිශතයක් වශයෙන් මැණික් වලින් ලත් ආදයම 1973 දී සියයට 5 ක සිට 1974 දී සියයට 3 දක්වා පහත වැටුනි.

අපනයනය කරන ලද පාර්සල් පිළිබඳ ඉන්වොයිසි වටිනාකම මත පදනම් වූ රාජ්‍ය මැණික් සංස්ථාවේ දත්ත අනුව වුවද මැණික් වලින් ලත් ඉපැයීම මෙම වර්ෂයේදී පහත වැටී ඇත. සංසථාවට අනුව මැණික් අපනයන වටිනාකම (වි. වි. භි. ස. නොමැතිව) 1973 දී රුපියල් 1,528 ලක්‍ෂයක සිට 1974 දී රුපියල් 1326 ලක්ෂය දක්වා රාපියල් 202 ලක්ෂයකින් හෙවත් සියයට 13 කින් පහල ගියේය. සංස්ථාව විසින් මැණික් වලින් ලත් අපනයන ඉපැයීම, මුළු මැණික් ඉපැයීම වලින් සියයට 12·1 ක් වූ අතර පෞද්ගලික අංශයේ අපනයන ඉපැයුම, සියයට 87·9 ක් විය. වටිනාකම අනුව බලන විට 1974 දී සංස්ථාව විසින් ලත් අපනයන ඉපැයීම රුපියල් 101 ලක්ෂයකින් හෙවත් සියයට 38·7 කින් පහල ගියේය. මේ හා සංසන්දනාත්මකව බලන විට පෞද්ගලික අංශය විසින් කරන ලද අලෙවි වටිනාකමද රුපියල් 101 ලක්ෂයකින් හෙවත් සියයට 8·0 කින් අඩු විය.

සම්ප්‍රදායික නොවන අපනයනයක් වූ මැණික් අපනයනය කිරීමෙන් ලත් ඉපැයීම වි.වි.භි.ස. ක්‍රමය යටතේ සියයට 65 ක වාරික දීමනාවකට දිගටම ඇතුල් විය. බදු සානුබලවලට අමතරව මැණික් අපනයන කරුවනට, ඔවුන්ගේ ශුද්ධ මී. ර. ගැ. අපනයන වටිනාකමින් සියයට 25 ක් පරිවර්ත්‍ය ගිණුම්වලට බැර කිරීමට ද ඉඩ සලසන ලදී. කෙසේ වුවද 1974 නොවැම්බර් 07 වැනිද සිට මැණික්වලින් ලැබූ ඉපැයීම්වලින් පරිවත්‍ය ගිණුම්වලට ඇතුල් කළ හැකි ප්‍රතිශතය සියයට 20 දක්වා අඩුකරන ලදී.

රාජ්‍ය මැණික් සංස්ථාවට අනුව 1974 දී ශ්‍රී ලංකා මැණික් මිලදී ගත් ප්‍රධාන ගැනුම්කරුවා හොංකොං වූ අතර ඇය විසින් රුපියල් 426 ලක්ෂයක් හෙවත් මුළු අපනයන ඉපැයුම්වලින් සියයට 32·1 ක් වටිනා මැණික් මිලට ගනු ලැබිණ. පිළිවෙලින් රුපියල් 276 ලක්ෂයක් (සියයට 20·8) හා රුපියල් 181 ලක්ෂයක් (සියයට 13·6) වටිනා මැණික් මිලදී ගත් ස්විටසර්-ලන්තය හා ජපානය දෙවැනි හා තුන්වැනි ස්ථානය ගත්හ. වැදගත්කම අනුව ලංකා මැණික් මිලදී ගත් අනිකුත් රටවල් නම් ඇමරිකා එක්සත් ජනපදය (රුපියල් 79 ලක්ෂයක්), ප්‍රංශය (රුපියල් 78 ලක්ෂයක්), චීනය (රුපියල් 74 ලක්ෂයක්), බටහිර ජර්මනිය (රුපියල් 50 ලක්ෂයක්), එක්සත් රාජධානිය (රුපියල් 40 ලක්ෂයක්) හා සිංගප්පූරුව (රුපියල් 34 ලක්ෂයක්) ආදියයි.

රාජ්‍ය මැණික් සංස්ථාවෙහි දේශීය ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් බලනවිට 1973 දී සංස්ථාව විසින් රුපියල් 1077 ලක්ෂයක් වටිනා මැණික් මිලදී ගත් නමුදු 1974 දී මිලදී ගන්නා ලද්දේ රුපියල් 1?9 ලක්ෂයක් වටිනා මැණික් පමණි. මැණික් ගැරීම සඳහා නිකුත් කළ බලපත්‍ර ගණන 1972 දී 1,657 ක සිට 1973 දී 2,547 දක්වා ඉහල ගිය අතර 1974 දී එය 3,027 දක්වා තවදුරටත් ඉහල ගයේය. නමුත් මැණික් වෙළදාම සඳහා නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව 2,335 සිට 1737 දක්වාත් මැණික් ඔපදැමීමට නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව 475 සිට 393 දක්වාත් පහත වැටුනි. රාජ්‍ය මැණික් සංස්ථාව 1973 දී ඉඩම් වෙන්දේසි කිරීමෙන් ලබාගත් ආදායම රුපියල් 18 ලක්ෂයක් වූ අතර 1974 දී මෙය රුපියල් 17 ලක්ෂයක් වූයේය. වෙන්දේසි කරන ලද ඉඩම් කැබලි සංඛ්‍යාව 1973 දී 667 ක සිට 1974 දී 465 දක්වා පහල ගියේය.

**වෙනත් කෘෂිකාර්මික හා**

| | ඒකකය | පරිමාව | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1966 | 1967 | 1968 | 1969 | 1970 | 1971 | 1972 | 1973 | 1974 | 1966 | 1967 |
| **පොල් අතුරු නිෂ්පාදන ගණය** | | | | | | | | | | | | |
| කොහු කෙදි (බ්‍රිස්ටල්) .. | හො: දහස් | 401·2 | 538·0 | 563·9 | 506·7 | 474 0 | 534·1 | 531·3 | 578·3 | 645·0 | 17·4 | 22·0 |
| කොහු කෙදි (මෙට්ට) . | ,, | 1114·2 | 1065·0 | 1260·0 | 1180·3 | 1172 6 | 1307·2 | 1289·5 | 1441·1 | 1429·0 | 20·3 | 19·4 |
| පොල් කටු අඟුරු .. | ,, | 264·6 | 273·0 | 319·1 | 385·2 | 583·4 | 629·9 | 539·2 | 566·2 | 581·0 | 3·2 | 4·9 |
| **කුළුබඩු ගණය** | | | | | | | | | | | | |
| කුරුඳු කුරු . | ,, | 47·1 | 52·8 | 61·8 | 65·9 | 70·0 | 72·6 | 77·0 | 87·3 | 99·2 | 29·2 | 29·8 |
| කුරුඳු පොතු .. | ,, | 7·2 | 7·9 | 16·6 | 21·6 | 12·7 | 15·3 | 21·5 | 40·8 | 51·8 | 1·2 | 1·2 |
| කරදමුංගු .. | ,, | 2·5 | 2·4 | 2·5 | 3·2 | 4·0 | 3·7 | 4·2 | 3·7 | 3·0 | 4·9 | 3·3 |
| ගම්මිරිස් .. | ,, | 6·0 | 2·0 | 16·2 | 17·9 | 16·9 | 0·9 | 2·1 | 40·4 | 6·6 | 1·2 | 0·4 |
| කරාබුනැටි .. | ,, | 1·0 | 0·8 | 1·0 | 4·6 | 5·5 | 0·2 | 2·1 | 12·1 | 11·3 | 0·1 | 0·1 |
| **වෙනත් කෘෂි නිෂ්පාදිත** | | | | | | | | | | | | |
| කොකෝවා ඇට .. | ,, | 42·5 | 23·7 | 34·8 | 25·4 | 29·9 | 30·1 | 30·7 | 22·6 | 20·2 | 5·9 | 4·1 |
| සකස් කළ දුම්කොළ .. | රාත්තල් ලක්ෂ | – | 0·9 | 1·3 | 0·7 | 0·5 | 1·5 | 1·5 | 1·5 | 1·2 | – | 2·8 |
| **නිමැවූ නිෂ්පාදිත ගණය** | | | | | | | | | | | | |
| අගනා සහ අර්ධ අගනා ගල | කැ: දහස් | 61·1 | 24·9 | 196·0 | 136·6 | 184·9 | ල.නො. | 288·2 | 649·7 | 682·4 | 3·9 | 3·4 |
| ස්වර්ණාභරණ සහ රන්කරුවන්ගේ භාණ්ඩ .. | ට්‍රෝයි අවු දහස් | – | – | – | – | – | – | – | – | 2·5 | 1·7 | 2·3 |
| ඉහත සඳහන් ශීර්ෂයන්ගේ මුළු වටිනාකම .. | | | | | | | | | | | 89·0 | 93·7 |

## II (ඔ) 17 වැනි සංඛ්‍යා සටහන

### කාර්මික නොවන භාණ්ඩ අපනයන

| වටිනාකම (රුපියල් දශලක්ෂ) | | | | | | | නැ. වි. ස. මිළ ඒකකය රුපියල් | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1968 | 1969 | 1970 | 1971 | 1972 | 1973 | 1974 | 1966 | 1967 | 1968 | 1969 | 1970 | 1971 | 1972 | 1973 | 1974 |
| 25·6 | 24·6 | 22·3 | 27·2 | 28·6 | 35·7 | 47·1 | 43·49 | 40·94 | 43·35 | 48·63 | 47·13 | 51·01 | 53·78 | 61·78 | 73·02 |
| 25·5 | 25·4 | 24·8 | 27·2 | 28·4 | 36·2 | 61·3 | 18·21 | 18·24 | 20·23 | 21·67 | 21·16 | 20·83 | 21·99 | 25·12 | 42·89 |
| 5·2 | 3·4 | 6·7 | 10·7 | 6·5 | 8·5 | 31·4 | 12·20 | 18·02 | 16·34 | 8·90 | 11·53 | 17·06 | 12·07 | 15·01 | 54·12 |
| 32·9 | 33·8 | 28·4 | 25·1 | 26·9 | 31·1 | 51·0 | 620·11 | 564·71 | 531·79 | 513·33 | 405·79 | 353·16 | 349·63 | 356·24 | 513·64 |
| 2·3 | 4·1 | 1·7 | 2·2 | 3·4 | 6·7 | 8·5 | 161·79 | 153·27 | 141·30 | 191·11 | 134·02 | 146·23 | 160·28 | 164·22 | 165·00 |
| 4·1 | 7·3 | 11·3 | 5·8 | 5·7 | 8·4 | 6·5 | 1978·56 | 1341·65 | 1639·22 | 2297·00 | 2838·61 | 1581·78 | 1356·17 | 2270·12 | 2229·31 |
| 2·4 | 3·1 | 4·7 | 0·7 | 0·9 | 12·9 | 3·4 | 199·76 | 215·21 | 146·53 | 173·12 | 279·42 | 749·21 | 391·82 | 319·31 | 513·12 |
| 0·1 | 2·8 | 4·1 | 0·1 | 0·8 | 10·1 | 12·5 | 138·29 | 104·24 | 130·22 | 617·35 | 756·41 | 354·28 | 395·97 | 834·74 | 1110·38 |
| 7·3 | 7·0 | 7·2 | 6·2 | 5·1 | 6 1 | 10·8 | 139·26 | 178·36 | 211·16 | 273·43 | 240·82 | 205·57 | 165·92 | 269·91 | 534·69 |
| 5·1 | 2·9 | 2·2 | 6·9 | 6·9 | 6·7 | 6·0 | – | 3·00 | 3·81 | 4·04 | 4·21 | 4·47 | 4·57 | 4·41 | 5·15 |
| 2·0 | 0·5 | 4·3 | 3·4 | 12·3 | 140·8 | 109·5 | 63·56 | – | – | – | – | – | — | 216·71 | 160·42 |
| 1·2 | 1·0 | 1·0 | 0·3 | 0·2 | 0·1 | 0·6 | – | – | – | – | – | – | – | – | 254·48 |
| 113·7 | 115·9 | 118·7 | 115·3 | 125·7 | 303·2 | 347·8 | | | | | | | | | |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

## II (ඔ) 18 වැනි සංඛ්‍යා සටහන

### මැණික් අපනයන

රුපියල් දශ ලක්ෂ

| | රේගු සංඛ්‍යා | | | 1973 රාජ්‍ය මැණික් සංස්ථාවේ සංඛ්‍යා | | | 1974 රාජ්‍ය මැණික් සංස්ථාවේ සංඛ්‍යා | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1972 | 1973 | 1974 | මැණික් සංස්ථාව | පුද්ගලික ආයතන | එකතුව | මැණික් සංස්ථාව | පුද්ගලික ආයතන | එකතුව |
| ජනවාරි .. | 0·2 | 3·9 | 1 9 | 2·2 | 3·1 | 5·4 | 0·1 | 3·9 | 4·0 |
| පෙබරවාරි .. | 0·1 | 2·7 | 5·5 | 1·1 | 3·8 | 4·9 | 0·2 | 6·8 | 7·0 |
| මාර්තු .. | 0·1 | 6·2 | 9·5 | 1·2 | 7·7 | 8·9 | 2·1 | 18·1 | 20·2 |
| අප්‍රේල් .. | 0·1 | 16·7 | 15·0 | 1·9 | 15·1 | 17·1 | 7·6 | 13·7 | 21·3 |
| මැයි .. | 0·6 | 14·5 | 15·7 | 6·4 | 10·2 | 16·7 | 0·3 | 9·5 | 9·8 |
| ජූනි .. | 1·6 | 18·1 | 7·7 | 1·9 | 15·4 | 17·3 | 1·4 | 8·2 | 9·6 |
| ජූලි .. | 0·3 | 14·3 | 5·6 | 3·5 | 13·8 | 17·3 | 1·6 | 16·9 | 18·6 |
| අගෝස්තු .. | 1·6 | 16·6 | 7·9 | 0·6 | 16·5 | 17·1 | 1·1 | 10·4 | 11·4 |
| සැප්තැම්බර් .. | 2·0 | 13·6 | 14·9 | 2·1 | 15·6 | 17·7 | 0·3 | 9·2 | 9·5 |
| ඔක්තෝබර් .. | 1·3 | 17·8 | 14·5 | 2·2 | 14·0 | 16·2 | 0·9 | 6·4 | 7·3 |
| නොවැම්බර් .. | 1·8 | 12·9 | 6·8 | 2·5 | 8·3 | 10·8 | 0·1 | 8·5 | 8·6 |
| දෙසැම්බර් .. | 2·8 | 3·5 | 3·7 | 0·2 | 3·2 | 3·5 | 0·3 | 5·0 | 5·3 |
| එකතුව | 12·3 | 140·8 | 109·5 | 26·1 | 126·7 | 152·8 | 16·0 | 116·6 | 132·6 |

මූලයයන්: ශ්‍රී ලංකා රේගුව;
රාජ්‍ය මැණික් සංස්ථාව

## 3. ආනයන

ශ්‍රී ලංකාව විසින් දැඩි ආනයන ප්‍රතිපත්තියක් ගෙනයන ලද්දේ වී නමුත්, රේගු දත්තයනට අනුව 1974 වර්ෂයේදී ආනයන වටිනාකම රුපියල් 45,540 ලක්ෂයක් වූයෙන් පසුගිය වර්ෂයේ දීට වඩා රුපියල් 18,390 ලක්ෂයක හෙවත් සියයට 67·7 ක වැඩිවීමක් පෙන්නුම් කළේය. ලෝක ව්‍යාප්ති උද්ධමනය හේතුකොටගෙන ආනයන වටිනාකමෙහි තියුණු වැඩිවීමක් දිස්වූයේ වී නමුත් 1974 වර්ෂයේදී මුළු ආනයන පරිමාවෙහි සියයට 29 ක පහත වැටීමක් දක්නට තිබුණි. 1965 සිට දිගටම පිරිහෙමින් පැවති වෙළෙඳ අනුපාතය 1973 දී සියයට 13 කින් ද, 1974 දී සියයට 11 කින් ද පහත වැටුනි.

### (අ) ආනයන - ගැලපූ රේගු සංඛ්‍යා

කලින් විස්තර කරන ලද පරිදි රේගු දත්ත, ආහාර කෙමසාරිස්ගේ හා ඛනිජ තෙල් සංස්ථාවේ ආනයන සමග ගලපා ඇත. II (ඔ) 19 සංඛ්‍යා සටහනෙහ දක්වා ඇති ගලපන ලද රේගු සංඛ්‍යා අනුව ආනයන වටිනාකම රුපියල් 20,070 ලක්ෂයකින් 1974 දී රුපියල් 47,700 ලක්ෂය දක්වා වැඩිවීමක් පෙන්නුම් කරයි.

ගැලපූ දත්තයනට අනුව මුළු ආනයනවල පාරිභෝගික භාණ්ඩ අනුපාතය 1973 දී සියයට 54 ක සිට 1974 දී සියයට 49 දක්වා අඩු වූයේය. නමුත් නිරපේක්ෂ සංඛ්‍යාවලට අනුව පාරිභෝගික භාණ්ඩ වටිනාකම රුපියල් 15,000 ලක්ෂයක සිට රුපියල් 23,390 ලක්‍ෂය දක්වා සියයට 56 කින් වැඩිවිය. අන්තර් භාණ්ඩ ආනයන වටිනාකම 1973 දී රුපියල් 7,860 ලක්‍ෂයක සිට 1974 දී රුපියල් 19,350 ලක්‍ෂය දක්වා වැඩි වූයෙන් මුළු ආනයනවල අන්තර් භාණ්ඩ අනුපාතය සියයට 28 සිට සියයට 41 දක්වා වැඩිවිය. අනෙක් අතට බලනවිට මුළු ආනයනවල ආයෝජන භාණ්ඩ අනුපාතය 1973 දී සියයට 16 ක සිට 1974 දී සියයට 10 දකවා තියුණු ලෙස අඩුවූ අතර, ආයෝජන භාණ්ඩයන්හි මුළු වටිනාකම රුපියල් 4,500 ලක්‍ෂයකට කිට්ටු ප්‍රමාණයක පැවැත්තේය

## II (ඔ) 19 වැනි සංඛ්‍යා සටහන

### රේගු දත්ත - සැකසූ

(රුපියල් දශ ලක්ෂ)

| | 1973 | | 1974 | |
|---|---|---|---|---|
| | වටිනාකම | මුළු ආනයන වලින් ප්‍රතිශතය | වටිනාකම | මුළු ආනයන වලින් ප්‍රතිශතය |
| 1· පාරිභෝගික භාණ්ඩ, මෙවායින් .. | 1500·1 | 54·3 | 2,338 6 | 49·0 |
| (අ) ආහාර පාන .. | 1317·2 | 47·7 | 2,150·3 | 45·7 |
| (i) සහල් .. | 321·9 | 11·7 | 797·8 | 17·0 |
| (ii) පිටි .. | 458·2 | 16·6 | 938·4 | 19·9 |
| (iii) සීනි .. | 333·8 | 12·1 | 230·4 | 4·9 |
| (ආ) රෙදිපිළි .. | 55·3 | 2·0 | 59·2 | 1·3 |
| (ඇ) අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 120·4 | 4·4 | 129 2 | 2·7 |
| 2· අන්තර් භාණ්ඩ .. .. | 785·6 | 28·4 | 1,934·6 | 40·6 |
| 3· ආයෝජන භාණ්ඩ .. .. | 452·0 | 16·4 | 457·1 | 9·6 |
| 4· වර්ග නොකළ ආනයන .. | 25·0 | 0·9 | 39 2 | 0·8 |
| 5· මුළු ආනයන .. .. | 2762·7 | 100·0 | 4,769·5 | 100·0 |

මූලයයන්: ශ්‍රී ලංකා රේගුව;
ඛනිජ තෙල් නීතිගත සංස්ථාව;
ආහාර කොමසාරිස්වරයාගේ දෙපාර්තමේන්තුව

ආහාර කොමසාරිස්වරයාගේ සංඛ්‍යාවලට අනුව සහල්, පිටි හා සීනි වටිනාකම, II (ඔ) 20 වැනි සංඛ්‍යා සටහනෙන් දක්වා ඇති පරිදි 1973 දී රුපියල් 11,140 ලක්‍ෂයක සිට 1974 දී රුපියල් 19,660 ලක්‍ෂය දක්වා රුපියල් 8,520 ලක්‍ෂයකින් හෙවත් සියයට 76·5 කින් වැඩි වීමක් පෙන්නුම් කළේය. 1974 දී සහල් අපනයන පරිමාව වූ ටොන් 297,000 ක ප්‍රමාණය, 1973 වර්ෂය හා ඉසඳනවිට ටොන් 41,000 ක පහත වැටීමක් පෙන්නුම් කළද, සහල් ආනයන වටිනාකම 1973 දී රුපියල් 3,220 ලක්ෂයක සිට 1974 දී රුපියල් 7,980 ලක්ෂය දක්වා රුපියල් 4,760 ලක්ෂයකින් හෙවත් සියයට 147·8 කින් ඉහළ ගියේය. මෙයට ප්‍රධාන හේතුව වූයේ, ටොන් එකක මි. භා. ගැ. මිල සියයට 181·8 කින් පමණ විශාල ප්‍රමාණයකින් ඉහළ යාමයි.

ආහාර කොමසාරිස්ට අනුව පිටි ආනයන පරිමාව 1973 දී ටොන් 365,000 ක සිට 1974 දී ටොන් 442,000 දක්වාත්, ඒ සඳහා වූ වියදම රුපියල් 4,580 ලක්‍ෂයක සිට රුපියල් 9,380 ලක්ෂය දක්වාත් ඉහළ ගියේය. වෙනත් වචනවලින් කිවහොත්, ආනයන පරිමාව සියයට 21·5 කිනුත්, වියදම සියයට 126·6 කිනුත් වැඩිවීමක් පෙන්නුම් කළේය. පිටි ආනයන වටිනාකම ඉහළ යාමට ප්‍රධාන හේතුව වූයේ, ටොන් එකක මි. භා. ගැ. මිල රුපියල් 870 කින් හෙවත් සියයට 69·4 කින් ඉහළ යාමය. ප්‍රමාණය වැඩිවීමද ඊට තුඩුදුන් තවත් හේතුවකි.

1974 දී සීනි ආනයන පරිමාව හා වටිනාකම යන දෙකම සැලකියයුතු ලෙස අඩුවිය සීනි ආනයන පරිමාව ටොන් 148,000 කින් හෙවත් සියයට 77·9 කින්ද, වටිනාකම රුපියල් 1,040 ලක්ෂයකින් හෙවත් සියයට 31·1 කින් ද පහළ ගියේය. මේ නිසා 1974 දී ආහාර කොමසාරිස් විසින් ආනයන කරන ලද සීනි ප්‍රමාණය වූ ටොන් 42,000 ට වැයවූයේ, රුපියල් 2,300 ලක්ෂයකි. මෙම වර්ෂයේදී ලෝක වෙළෙඳපොලෙහි සීනි මිල ඉතා විශාල වශයෙන් වැඩිවූයේ නමුදු සීනි ආනයන ප්‍රමාණය විශාල ලෙස අඩු කිරීම මගින් මුළු වියදමෙහි ඉතුරුවක් කරගත හැකි විය.

## II (ඔ) 20 වැනි සංඛ්‍යා සටහන

### රේගු දත්ත හා නියත වශයෙන් ආනයනය කළ - සහල්, පිටි සහ සීනි

| | ආහාර කොමසාරිස්ගේ දත්ත | | | | | රේගු දත්ත (ආහාර කොමසාරිස්ගේ දත්ත සහ රේගුව විසින් සටහන් කළ පරිදි වෙනත් ආනයන) | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1972 | 1973 | 1974 | 1973/74 වෙනස | | 1972 | 1973 | 1974 | 1973/74 වෙනස | |
| | | | | නිරපේක්ෂ | % | | | | නිරපේක්ෂ | % |
| **සහල්** | | | | | | | | | | |
| ප්‍රමාණය: ටොන් දහස් .. .. | 262 | 338 | 297 | − 41 | − 12.1 | 294 | 335 | 293 | − 42 | − 12.5 |
| වටිනාකම: රුපියල් දශලක්ෂ .. .. | 142 | 322 | 798 | +476 | +147.8 | 161 | 270 | 720 | + 450 | +166.7 |
| මිල සහ ගැල්කුලී: ටොන් එකක් රුපියල් .. .. | 544.25 | 953.18 | 2685.82 | +1732.64 | +181.8 | 547.27 | 807.47 | 2461.40 | +1653.93 | +204.8 |
| **පිටි** | | | | | | | | | | |
| ප්‍රමාණය: ටොන් දහස් .. .. | 324 | 365 | 442 | + 77 | + 21.5 | 301 | 396 | 402 | + 6 | + 1.5 |
| වටිනාකම: රුපියල් දශලක්ෂ .. .. | 216 | 458 | 938 | +580 | +126.6 | 193 | 453 | 857 | + 404 | + 89.2 |
| මිල සහ ගැල්කුලී: ටොන් එකක් රුපියල් .. .. | 667.26 | 1,254.20 | 2124.04 | +869.84 | + 69.4 | 639.92 | 1,144.14 | 2131.66 | + 987.52 | + 86.3 |
| **සීනි** | | | | | | | | | | |
| ප්‍රමාණය: ටොන් දහස් .. .. | 214 | 190 | 42 | − 148 | − 77.9 | 223 | 193 | 67 | − 126 | − 65.3 |
| වටිනාකම: රුපියල් දශලක්ෂ .. .. | 250 | 334 | 230 | − 104 | − 31.1 | 248 | 321 | 190 | − 131 | − 40.8 |
| මිල සහ ගැල්කුලී: ටොන් එකක් රුපියල් .. .. | 1,168.16 | 1,752.16 | 5485.75 | +3733.59 | +213.1 | 1,111.55 | 1,663.44 | 2846.88 | +1183.44 | + 71.1 |
| සහල්, පිටි සහ සීනිවල මුළු වටිනාකම: රුපියල් දශලක්ෂ .. | 608 | 1,114 | 1966 | + 852 | + 76.5 | 602 | 1,044 | 1767 | + 723 | + 69.3 |

මූලයන්; ආහාර කොමසාරිස්වරයාගේ දෙපාර්තමේන්තුව.
ශ්‍රී ලංකා රේගුව.

(ආ) ප්‍රධාන ගණ අනුව ආනයන - රේගු සංඛ්‍යා.

II (ඔ) 21 සංඛ්‍යා සටහන මගින් රේගු වාර්තාවලට අනුව ප්‍රධාන භාණ්ඩ ගණ අනුව ආනයන කොටස් කර දැක්වෙන අතර, II (ඔ) 20 වැනි සංඛ්‍යා සටහනෙහි ද සහල්, පිටි හා සීනි ආනයන සඳහා වූ රේගු සංඛ්‍යා ඇතුලත් වේ.

ජාත්‍යන්තර භාණ්ඩ වෙළෙඳපොලවල තියුණු මිල නැගීම් නිසා ආනයන සැකැස්මෙහි වෙනස් වීමක් දැකිය හැක. තෙල් සහ අනිකුත් අන්තර් භාණ්ඩ ආනයන සඳහා වැඩිපුර මුදල් ප්‍රමාණයක් වෙන්කිරීම නිසා මුළු ආනයනයන්හි අන්තර් භාණ්ඩවල අනුපාතය 1973 දී සියයට 30 ක සිට 1974 දී සියයට 42 දක්වා වැඩිවිය. මේ නිසා පාරිභෝගික භාණ්ඩ අනුපාතය 1973 දී සියයට 53 ක සිට 1974 දී සියයට 47 දක්වා අඩුවූ අතර, ආයෝජන භාණ්ඩ අනුපාතය සියයට 17 ක සිට සියයට 10 දක්වා අඩුවිය. 1974 වර්ෂයේදී ආනයන කරන ලද අන්තර් භාණ්ඩ ප්‍රමාණය 1973 හා සසඳනවිට ස්ථාවර තත්ත්වයක පවත්වාගත් අතර, ආයෝජන හා පාරිභෝගික භාණ්ඩ ප්‍රමාණවල තියුණු පහත වැටීමක් දිස්වේ.

( i ) පාරිභෝගික භාණ්ඩ

රේගුව විසින් සපයන ලද දත්තයනට අනුව, පාරිභෝගික භාණ්ඩවල වටිනාකම 1973 දී රුපියල් 14,240 ලක්ෂයක සිට 1974 දී රුපියල් 21,380 ලක්‍ෂය දක්වා රුපියල් 6,530 ලක්ෂයකින් හෙවත් සියයට 46 කින් වැඩිවිය. මුළු ආනයන වටිනාකම අනුව බලනවිට 1974 දී පාරිභෝගික භාණ්ඩවල අනුපාතය සියයට 47 ක් වූයේ 1973 දී එම අනුපාතය සියයට 52·5 ක් විය. 1974 දී පාරිභෝගික භාණ්ඩවල මුළු ආනයන වටිනාකම වූ රුපියල් 21,380 ලක්ෂයෙන් සහල්, පිටි හා සීනි සඳහා පමණක් රුපියල් 17,670 ලක්ෂයක් හෙවත් සියයට 38·8 ක් වෙන් වූයේය. 1974 දී සහල් ආනයන පරිමාව සියයට 12·5 කින් ද, සීනි ආනයන පරිමාව සියයට 65 3 කින් ද පහළ ගියේය. අනිකුත් ආහාර ආනයන අතර ධාන්‍ය හා කුළුබඩු ද්‍රව්‍ය දැඩිලෙස සීමා කළ අතර, වියලි මිරිස් ආනයනය කිරීම සම්පූර්ණයෙන්ම නැවතිණ. කරවල ආනයනය ද මෙම වර්ෂයේදී අඩු විය.

සහල්

1974 දී ආනයන කරන ලද සහල් ප්‍රමාණය වූ ටොන් 293,005 පසුගිය වර්ෂයේදීට වඩා ටොන් 42,000 ක හෙවත් සියයට 15·5 ක පහත වැටීමක් පෙන්නුම් කළේය. මීට එක් හේතුවක් වූයේ සලාකයට දෙන ලද සහල් ප්‍රමාණය අඩු කිරීමයි. සලාකයට නිකුත් කරන ලද සහල් ප්‍රමාණය 1973 දී ටොන් 675,370 ක සිට 1974 දී ටොන් 550,268 දක්වා අඩුවිය.

සහල් ආනයන පහත වැටීම, ඒ සඳහා වූ වියදම අඩු වීමට හේතුවක් නොවිය. ජාත්‍යන්තර සහල් මිල ඉතා ඉහළ මට්ටමකට නැඟීම වියදම වැඩිවීමට හේතු විය. නිදසුනක් වශයෙන් 1973 දී ටොන් එකක මි. හා ගැ. මිල රුපියල් 807 සිට 1974 දී රුපියල් 2 461 ක් දක්වා ටොන් එකක් රුපියල් 1,654 කින් හෙවත් සියයට 205 කින් වැඩි වූයේය. 1972 දී ටොන් එකක මි. හා ගැ මිල වූයේ රුපියල් 547 ක් පමණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1972 දී සහල් ආනයන සඳහා රුපියල් 1,610 ලක්ෂයක් වියදම් වූ අතර එය 1973 රුපියල් 2,700 ලක්ෂය දක්වාත්, 1974 දී රුපියල් 7,200 ලක්ෂය දක්වාත් වැඩි වූයේය.

පිටි

1974 වර්ෂයේදී පිටි ආනයන ප්‍රමාණය ටොන් 6,000 කින් හෙවත් සියයට 1·5 කින් වැඩි වූයේය. 1973 දී ටොන් එකක මි. හා ගැ. මිල රුපියල් 1,144 ක සිට 1974 දී රුපියල් 2,132 දක්වා සියයට 86 කින් වැඩිවූ හෙයින් පිටි ආනයන සඳහා යොදන ලද වියදම 1973 දී රුපියල් 4,530 ලක්ෂයක සිට 1974 දී රුපියල් 8,570 ලක්ෂය දක්වා සියයට 90 කට කිට්ටු ප්‍රමාණයකින් වැඩි වූයේය.

## ප්‍රධාන වර්ග හා ද්‍රව්‍ය හෝ ද්‍රව්‍ය

| | වටිනාකම රුපියල් දශ ලක්ෂ | | |
|---|---|---|---|
| | 1970 | 1971 | 1972 |
| 1. පාරිභෝගික භාණ්ඩ[1] | 1,282 | 1,113 | 1,069 |
| මෙවායින් | | | |
| (අ) ආහාර පාන[1] | 1,057 | 395 | 917 |
| (1) සහල් | 318 | 195 | 161 |
| (2) පිටි | 260 | 206 | 193 |
| (3) (අ) සීනි ශුද්ධ කළ | 170 | 243 | 248 |
| (ආ) සීනි, අනෙකුත් (එනම්, සක්කර, හකුරු සහ සූකිරි) | 1 | 1 | 1 |
| (4) කිරි සහ කිරි නිෂ්පාදිත | 55 | 47 | 57 |
| (5) මස්, මාළු සහ බිත්තර | 68 | 72 | 83 |
| මෙවායින්, (අ) කරවල (උම්බලකඩ හැර එහෙත් වියලි ඉස්සන් ඇතුළුව) | 53 | 52 | 62 |
| (ආ) මාළු, අනෙකුත් | 15 | 19 | 20 |
| (6) ආහාර අනෙකුත් | 139 | 96 | 143 |
| මෙවායින් (අ) කඩල සහ ධාන්‍ය වර්ග | 63 | 45 | 98 |
| (ආ) ළූණු | 33 | 10 | 3 |
| (ඇ) මිරිස් | 26 | 30 | 24 |
| (7) බීම සහ සකස්කළ දුම්කොළ | 3 | 2 | 1 |
| (ආ) රෙදිපිළි (ඇඳුම් ඇතුළුව) | 124 | 103 | 48 |
| (ඇ) අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 101 | 115 | 104 |
| මෙවායින් | | | |
| (1) මෝටර් රථ | 10 | 7 | 11 |
| (2) ඔරලෝසු සහ අත් ඔරලෝසු | ... | ... | ... |
| (3) ගුවන් විදුලි යන්ත්‍ර | 1 | 1 | 2 |
| (4) රබර් ටයර් සහ ටියුබ් | 11 | 11 | 5 |
| (5) බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 29 | 34 | 41 |
| 2. අන්තර් භාණ්ඩ[1] | 463 | 411 | 502 |
| මෙවායින් | | | |
| (1) පොහොර | 81 | 59 | 63 |
| (2) ඛණිජ තෙල් නිෂ්පාදිත | 59 | 26 | 38 |
| (3) ගල් අඟුරු | 4 | 4 | 1 |
| (4) රසායනික ද්‍රව්‍ය හා සංයෝග | 56 | 66 | 73 |
| (5) ඩයි වර්ග පදම් කිරීමේ හා වර්ණ ද්‍රව්‍ය | 10 | 11 | 14 |
| (6) තේ හා වෙනත් පෙට්ටි | 9 | 20 | 9 |
| (7) කඩදාසි සහ කඩදාසි බෝඩ | 45 | 48 | 42 |
| (8) කැට් නූල් සහ නූල් | 41 | 40 | 61 |
| (9) සකස් නොකළ දුම්කොළ | 3 | 4 | 1 |
| (10) තිරිඟු සහ මෙස්ලින්[2] | 12 | 23 | 44 |
| 3. ආයෝජන භාණ්ඩ | 546 | 419 | 438 |
| මෙවායින් | | | |
| (1) ගොඩනැගිලි භාණ්ඩ | 119 | 118 | 121 |
| මෙවායින් (අ) සිමෙන්ති | 7 | 3 | 2 |
| (2) ප්‍රවාහන උපකරණ | 126 | 76 | 107 |
| (3) යන්ත්‍රෝපකරණ සහ උපකරණ | 276 | 200 | 181 |
| 4. එකතුව (1, 2 සහ 3 ශීර්ෂ) | 2,291 | 1,943 | 2,009 |
| 5. වර්ග නොකළ ආනයන | 22 | 43 | 55[1] |
| 6. මුළු ආනයන | 2,313 | 1,986 | 2,064[1] |

1. ප්‍රති ශෝධිත සංඛ්‍යා
2. පිටි නොකළ.

II (ඔ) 21 වැනි සංඛ්‍යා සටහන

කාණ්ඩ අනුව ආනයන — 1970/1974

| | | මුළු ආනයනවලින් සියයට ගණන | | | | |
|---|---|---|---|---|---|---|
| 1973 | 1974 | 1970 | 1971 | 1972 | 1973 | 1974 |
| 1,424 | 2,138 | 55·4 | 56·0 | 51·8 | 52·5 | 47·0 |
| 1,248 | 1,950 | 45·7 | 45·0 | 44·4 | 45·9 | 42·8 |
| 270 | 720 | 13·7 | 9·8 | 7·8 | 9·9 | 15·8 |
| 453 | 857 | 11·2 | 10·4 | 9·4 | 16·7 | 18·8 |
| 321 | 190 | 7·3 | 12·2 | 12·0 | 11·8 | 4·2 |
| ... | ... | ... | 0·1 | ... | ... | ... |
| 70 | 70 | 2·4 | 2·4 | 2·8 | 2·6 | 1·5 |
| 52 | 50 | 2·9 | 3·6 | 4·0 | 1·9 | 1·1 |
| 39 | 30 | 2·3 | 2·6 | 3·0 | 1·4 | 0·7 |
| 13 | 20 | 0·6 | 1·0 | 1·0 | 0·5 | 0·4 |
| 50 | 33 | 6·0 | 4·8 | 6·9 | 1·8 | 0·7 |
| 31 | 17 | 2·7 | 2·3 | 4·7 | 1·1 | 0·4 |
| 3 | 2 | 1·4 | 0·5 | 0·1 | 0·1 | ... |
| 3 | – | 1·1 | 1·5 | 1·2 | 0·1 | – |
| 1 | 2 | 0·1 | 0·1 | ... | ... | ... |
| 55 | 59 | 5·3 | 5·2 | 2·3 | 2·0 | 1·3 |
| 120 | 129 | 4·3 | 5·8 | 5·0 | 4·4 | 2·8 |
| 8 | 13 | 0·4 | 0·4 | 0·5 | 0·3 | 0·3 |
| ... | ... | ... | ... | ... | ... | ... |
| 3 | 1 | ... | 0·1 | 0·1 | 0·1 | ... |
| 10 | 11 | 0·5 | 0·6 | 0·2 | 0·4 | 0·2 |
| 36 | 44 | 1·5 | 1·7 | 2·0 | 1·3 | 1·0 |
| 815 | 1920 | 20·0 | 20·7 | 24·3 | 30·0 | 42·1 |
| 111 | 221 | 3·5 | 3·0 | 3·1 | 4·1 | 4·9 |
| 295 | 905 | 2·5 | 1·3 | 1·8 | 10·9 | 19·9 |
| 3 | 4 | 0·2 | 0·2 | ... | 0·1 | 0·1 |
| 107 | 232 | 2·4 | 3·3 | 3·5 | 3·9 | 5·1 |
| 12 | 22 | 0·4 | 0·6 | 0·7 | 0·4 | 0·5 |
| 5 | 18 | 0·4 | 1·0 | 0·4 | 0·2 | 0·4 |
| 40 | 65 | 1·9 | 2·4 | 2·0 | 1·5 | 1·4 |
| 21 | 65 | 1·8 | 2·0 | 3·0 | 0·8 | 1·4 |
| 3 | 10 | 0·1 | 0·2 | ... | 0·1 | 0·2 |
| 61 | 117 | 0·5 | 1·2 | 2·1 | 2·2 | 2·6 |
| 452 | 457 | 23·5 | 21·1 | 21·2 | 16·6 | 10·0 |
| 107 | 147 | 5·1 | 5·9 | 5·9 | 3·9 | 3·2 |
| 2 | ... | 0·3 | 0·2 | 0·1 | 0·1 | ... |
| 95 | 91 | 5·4 | 3·8 | 5·2 | 3·5 | 2·0 |
| 224 | 186 | 11·9 | 10·1 | 8·8 | 8·3 | 4·1 |
| 2,690 | 4,515 | 99·0 | 97·8 | 97·3 | 99·1 | 99·1 |
| 25 | 39 | 1·0 | 2·2 | 2·7 | 0·9 | 0·9 |
| 2,715 | 4,554 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා රේගුව

1974 වර්ෂයේදී ආනයන කරන ලද පිටි ප්‍රමාණය වැඩිවුවද, සලාකයට සැපයූ පිටි ප්‍රමාණය සීමා කිරීම සහ 1974 අප්‍රේල් මාසයේ සිට පිටි මිල රාත්තල ශත 70 සිට රුපියල් 1.10 දක්වා තවදුරටත් වැඩි කිරීම නිසා, පිටි පරිභෝජනය ටොන් 416,289 දක්වා ටොන් 33,912 කින් අඩු විය.

1973 දී පිටි, සලාක කළ ආහාර ද්‍රව්‍යයක් නොවූ අතර, විවෘත වෙළෙඳපොලේ පිටි අලෙවිය ටොන් 450,201 ක් වූයේය. පිටි ආනයනවල මෙම වැඩිවීම සහ පරිභෝජනයෙහි අඩුවීම ආහාර කොමසාරිස්වරයා වෙත වූ පිටි තොග වැඩිවීමෙන් පැහැදිලි වෙයි. 1973 අගදී ටොන් 16,000 ක් පමණක් වූ මෙම තොගය 1974 අවසානයේදී ටොන් 84,000 ක් වූයේය.

### සීනි

1973 දී ටොන් 193,000 ක්වූ සීනි ආනයන ප්‍රමාණය 1974 වර්ෂයේදී ටොන් 67,000 දක්වා ටොන් 126,000 කින් හෙවත් සියයට 65 කින් සැලකිය යුතු ලෙස පහත වැටුණි. මේ අනුව සීනි ආනයන සඳහා දරූ වියදමද 1973 දී රුපියල් 3,210 ලක්ෂයක සිට 1974 දී රුපියල් 1,900 ලක්ෂය දක්වා අඩු වූයේය.

1974 දී සීනි පරිභෝජනය බෙහෙවින් අඩුවීමට හේතු වූයේ 1974 මාර්තු මාසයේ සිට සලාකයට පිටින්වූ සීනි විකුණුම් මිල ඉහළ දැමීමත්, 1974 සැප්තැම්බර් මාසයේ සිට සලාක යට හා ඉන් පිටත දෙන සීනි ප්‍රමාණය විශාල ලෙස අඩු කිරීමත් ය. මෙම සීමාකාරී ක්‍රියා මාර්ග නිසා සලාකය යටතේ නිකුත් කළ සීනි ප්‍රමාණය 1973 දී ටොන් 66,400 ක සිට 1974 දී ටොන් 55·077 දක්වා අඩු වූයේය. සලකායට පිටින් දෙන ලද සීනි ප්‍රමාණයද 1973 දී ටොන් 128,785 ක සිට 1974 දී ටොන් 38,223 දක්වා විශාල ලෙස පහත වැටිණි.

### (ii) අන්තර් භාණ්ඩ

ප්‍රධාන ආනයන ගණ අතුරින්, වටිනාකම අනුව ඉහළම වැඩිවීමක් පෙන්වූයේ අන්තර් භාණ්ඩ ගණයයි. මෙයට ප්‍රධානතම හේතුව වූයේ මෙම ගණයෙහි මූලික ආනයන ද්‍රව්‍යය වූ ඛනිජ තෙල් නිෂ්පාදිත ආනයන 1974 දී තුන් ගුණයකටත් වඩා ඉහළ යාමයි. අනිකුත් අන්තර් භාණ්ඩද ඒවායේ මිල ඉහළ යාම හේතුකොටගෙන වටිනාකම වැඩිවීමක් පෙන්නුම් කළේය. රසායනික ද්‍රව්‍ය, පොහොර, තිරිඟු, හා ඉරිඟු ආදී ද්‍රව්‍යවල වටිනාකමද 1973 හා 1974 වර්ෂ අතරතුරදී දෙගුණයකින් පමණ වැඩි විය.

### (iii) ආයෝජන භාණ්ඩ

මෙම වර්ෂයේදී ආයෝජන භාණ්ඩ වටිනාකම ආන්තික වශයෙන් වැඩිවූ අතර, මුළු ආනයනවල මෙම ගණයෙහි අනුපාතය 1973 දී සියයට 17 ක සිට 1974 දී සියයට 10 දක්වා සැලකිය යුතු ප්‍රමාණයකින් පහත වැටුණි. 1973 දක්වා පහත වැටෙමින් පැවති ගොඩනැගිලි ද්‍රව්‍ය වටිනාකම 1974 දී ඉහළ මිල ගණන් නිසා තීව්‍ර ලෙස වැඩි විය. ගොඩනැගිලි ද්‍රව්‍ය උපගණයෙහි සිමෙන්ති ආනයන ඉතා සුළු ප්‍රමාණයක් වූයේ, දේශීය සිමෙන්ති නිෂ්පාදනය 1973 දී ටොන් 415,000 ක සිට 1974 දී ටොන් 466,000 දක්වා විශාල ලෙස ඉහළ ගිය හෙයිනි. ආනයනය කරන ලද සියලුම ආයෝජන භාණ්ඩ පරිමාණය සියයට 40 කින් පහළ ගිය බව ආනයන පරිමා දර්ශකයෙන් දක්වේ. (1967 = 100 ලෙස දක්වෙන ශ්‍රී ලංකා මහ බැංකුවේ ආනයන පරිමා දර්ශකයට අනුව ආයෝජන භාණ්ඩ 1973 දී 84 සිට 1974 දී 50 දක්වා අඩු විය.)

## 4. ඛණිජ තෙල් නිෂ්පාදිත

1973 අග භාගය වනවිට තෙල් මිල තියුණු ලෙස වැඩිවීමත් සමග අමුතෙල් සහ අනෙකුත් ඛණිජ තෙල් නිෂ්පාදිත ආනයනය සඳහා සැළකිය යුතු විදේශ විනිමය ප්‍රමාණයක් වැය කිරීමට ශ්‍රී ලංකාවට සිදුවිය. උදාහරණයක් වශයෙන්, අමුතෙල්, කළුතෙල්, කාර්මික තෙල් සහ අනෙකුත් ඛණිජ තෙල් සඳහා 1972 දී රුපියල් 2,968 ලක්ෂයක් වූ ආනයන වියදම, 1974 දී රුපියල් 9,203 ලක්ෂය දක්වා රුපියල් 6,235 ලක්ෂයකින් හෙවත් සියයට 210 කින් වැඩිවිය ශ්‍රී ලංකාවේ මුළු ආනයන වලින්, අමුතෙල් සහ අනෙකුත් ඛනිජ තෙල් නිෂ්පාදිත ආනයන සඳහා වියදම 1973 සියයට 10.9 ක් වූ අතර 1974 දී එය සියයට 20 දක්වා වැඩි විය.

ප්‍රධාන ආනයන භාණ්ඩය වූ අමුතෙල් ආනයනය සඳහා 1974 වියදම රුපියල් 8,614 ලක්ෂයක්වූ අතර 1973 දී එය රුපියල් 2,650 ලක්ෂයකි. 1974 අමුතෙල් ආනයන වටිනාකමෙහි තියුණු වැඩිවීම එහි අඩුවූ ආනයන පරිමාව හා සැසඳිය යුතුවේ. 1973 අමුතෙල් ආනයන පරිමාව මෙට්‍රික් ටොන් 17,53,233 ක් වූ අතර 1974 පරිමාව මෙට්‍රික් ටොන් 15,02,367 ක් දක්වා අඩුවිය. ඛණිජ තෙල් නිෂ්පාදිතවල මුළු ආනයන වටිනාකමින් අමු තෙල්වල වටිනාකම 1973 දී සියයට 89.5 ක් වූයේ 1974 දී සියයට 93.5 ක් විය.

අමුතෙල් හැරුණු විට, ඊළඟ ප්‍රධාන ආනයන ද්‍රව්‍යය වූයේ කළු තෙල්ය. 1973 එහි වටිනාකම රුපියල් 139 ලක්ෂයක් වූ අතර 1974 දී රුපියල් 204 ලක්ෂය දක්වා වැඩි විය රටට අවශ්‍ය භූමි තෙල් ප්‍රමාණය මුළුමනින්ම වාගේ පිරිපහදුවේ නිෂ්පාදනය කළ අතර ඉකුත් වසරේ මෙන් 1974 දී ද රුපියල් 85 ලක්ෂයක් වටිනා මෙට්‍රික් ටොන් 9,809 ක් වූ සුළු ප්‍රමාණයක් ආනයනය කර ඇත. ද්‍රාවකයන්, ලිහිස්සි තෙල් සහ ග්‍රීස් ආනයනයන් පිළිවෙලින් රුපියල් 49 ලක්ෂයක් රුපියල් 34 ලක්ෂයක් සහ රුපියල් 27 ලක්ෂයක් විය. තවත් වැදගත් ද්‍රව්‍යයක් වූ කෘෂි රසායනික ආනයනය සඳහා රුපියල් 37 ලක්ෂයක් වැය විය. ගෑස් තෙල් ආනයන වියදම රුපියල් 70 ලක්ෂයක් වූ අතර සුදු තෙල්, සැකසූ තෙල්, ඛණිජ තෙල් ගල්තාර, ඉටි සහ ඔට්ලෙක්ස් ආදිය සඳහා ආනයන වියදම එතරම් වැඩි නොවිය.

1974 දී පිරිපහදුව සඳහා අමුතෙල් මෙට්‍රික් ටොන් 14.3 ලක්ෂයක් පාවිච්චි කළ අතර 1973 දී ඒ සඳහා ගත් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 16.5 ලක්ෂයක් විය. 1973 දී පිරිපහදු කළ තෙල්වල වටිනාකම රුපියල් 2,632 ලක්ෂයක් වූයේ 1974 දී එය රුපියල් 9,247 ලක්ෂයක් විය. ලිහිස්සි තෙල් නිෂ්පාදනය රුපියල් 220 ලක්ෂයක සිට රුපියල් 286 ලක්ෂය දක්වා වැඩිවූ අතර ඉටිපන්දම් පෙට්ටි නිෂ්පාදනය රුපියල් 18 ලක්ෂයක සිට රුපියල් 14 ලක්ෂය දක්වා අඩුවිය.

අමුතෙල් පිරිපහදු කිරීම, ශ්‍රී ලංකාවේ කර්මාන්ත ක්ෂේත්‍රයෙහි වඩාත්ම වැදගත් කාර්යය විය. සුපිරි සහ පිරි තෙල් නිෂ්පාදනය 1973 දී පිළිවෙලින් මෙට්‍රික් ටොන් 68,000 ක් සහ මෙට්‍රික් ටොන් 51,000 ක් වූ අතර 1974 දී එය මෙට්‍රික් ටොන් 57,924 සහ මෙට්‍රික් ටොන් 39,563 දක්වා පහත වැටුණි. එහෙත් ඒවායේ (කර්මාන්තශාලාවේ දී) වටිනාකම පිළිවෙලින් රුපියල් 156 ලක්ෂයේ සිට රුපියල් 489 ලක්ෂය දක්වා සහ රුපියල් 104 ලක්ෂයේ සිට රුපියල් 308 ලක්ෂය දක්වා වැඩි වී ඇත. එසේම, ඔටෝ ඩීසල් සහ නාවුක ඩීසල් නිෂ්පාදන පරිමාව පහත වැටුණ ද ඒවායේ වටිනාකම් පිළිවෙලින් රුපියල් 538 ලක්ෂයේ සිට රුපියල් 1,876 ලක්ෂය දක්වා ද රුපියල් 178 ලක්ෂයේ සිට රුපියල් 590 ලක්ෂය දක්වා ද වැඩිවිය. භූමිතෙල් නිෂ්පාදනය 1973 දී මෙට්‍රික් ටොන් 251,000 සිට 1974 දී මෙට්‍රික් ටොන් 202,820 දක්වා පහත වැටුන නමුත් එහි වටිනාකම රුපියල් 586 ලක්ෂයේ සිට රුපියයල් 1,517 ලක්ෂය දක්වා වැඩි වී ඇත.

නැප්තා සහ බිටුමන් නිෂ්පාදනය පිළිවෙලින් මෙට්‍රික් ටොන් 128,000 සිට 103,616 දක්වා ද, මෙට්‍රික් ටොන් 31,000 සිට 23,892 දක්වා ද පහත වැටුණු නමුත් ඒවායේ (කර්මාන්ත ශාලාවේදී) වටිනාකම පිළිවෙලින් රුපියල් 123 ලක්ෂයේ සිට රුපියල් 896 ලක්ෂය දක්වා ද, රුපියල් 73 ලක්ෂයේ සිට රුපියල් 174 ලක්ෂය දක්වා ද වැඩිවිය. එසේම

ද්‍රව් තෙල් නිපැයුම 1973 දී මෙට්‍රික් ටොන් 673,000 සිට 1974 දී මෙට්‍රික් ටොන් 595,200 දක්වා අඩුවූ නමුත් එහි වටිනාකම රුපියල් 586 ලක්ෂයේ සිට රුපියල් 1517 ලක්ෂය දක්වා සැළකිය යුතු ප්‍රමාණයකින් වැඩි විය. 1974 දී ද්‍රාවකයන් සහ අනිකුත් ද්‍රව්‍ය (Artur & Solvents) වල පරිමාව මෙන්ම වටිනාකමද ඉහළ ගොස් ඇති අතර එල්. පී. පී. ද්‍රව්‍යයේ නිෂ්පාදන පරිමාව මෙන්ම වටිනාකම ද අඩුවී ඇත.

තෙල් මිළ සීග්‍රයෙන් වැඩිවීම නිසා (අ) සියළුම ඛණිජ තෙල් නිෂ්පාදිත ද්‍රව්‍යයන්ගේම වාගේ පරිභෝජනය සැළකිය යුතු ලෙස පහත වැටීමක් හා (ආ) මෙම නිෂ්පාදිතවල අලෙවි වටිනාකම සෑහෙන ලෙස වැඩිවීමක් සිදුවී ඇත. ඛණිජ තෙල් නිෂ්පාදිත වල අපනයන හැර අලෙවි වටිනාකම 1973 දී රුපියල් 8,02,281 ක්වූ අතර එය 1974 දී රුපියල් 11,95,012 ක් විය.

සුපිරි සහ පිරි තෙල් අලෙවි ප්‍රමාණය 1975 දී පිළිවෙලින් මෙට්‍රික් ටොන් 81,486 සහ මෙට්‍රික් ටොන් 48,741 ක් වූයේ, 1974 දී එම ප්‍රමාණයන් පිළිවෙලින් මෙට්‍රික් ටොන් 64,416 ක් සහ මෙට්‍රික් ටොන් 30,509 දක්වා අඩුවිය. වෙනත් වචන වලින් කිවහොත් 1974 දී සුපිරි පරිභෝජනය සියයට 20·9 කින්ද පිරිතෙල් සියයට 37·4 කින් ද අඩුවී ඇත. එහෙත් ඒවායේ අලෙවි වටිනාකම් පිළිවෙලින් රුපියල් 138,515 සිට රුපියල් 223,537 දක්වා සහ රුපියල් 80,618 සිට 106,580 දක්වා වැඩි විය. ඔටෝ බරතෙල් සහ නාවුක ඩීසල් තෙල් අලෙවි ප්‍රමාණය 1973 දී පිළිවෙලින් මෙට්‍රික් ටොන් 279,716, මෙට්‍රික් ටොන් 68,198 සහ මෙට්‍රික් ටොන් 74,059 සිට 1974 දී මෙට්‍රික් ටොන් 243,667 මෙට්‍රික් ටොන් 44,059 සහ මෙට්‍රික් ටොන් 50,319 දක්වා අඩු විය. භූමිතෙල් අලෙවි ප්‍රමාණය 1973 දී මෙට්‍රික් ටොන් 269,571 සිට 1974 දී මෙට්‍රික් ටොන් 212,757 දක්වා සියයට 21 කින් අඩුවූ බැව් දක්වුනද එහි වටිනාකම රුපියල් 109,482 සිට රුපියල් 205,622 දක්වා ඉහළ නැගීය. ලිහිස්සි තෙල් (අයි. ජී.) විකුණුම 1974 දී සියයට 20 කින් අඩුවූ අතර, ග්‍රීස් සියයට 6·9 කින්ද ඉටි තෙල් සියයට 10·8 කින්ද ද්‍රව්තෙල් සියයට 72·9 කින් ද කෘෂි රසායනික සියයට 59 කින් සහ අනෙකුත් විශේෂ නිෂ්පාදිත (අයි. ජී.) සියයට 17·5 කින්ද අඩු වූයේය.

ලංකා ඛණිජ තෙල් සංස්ථාවේ සංඛ්‍යා අනුව, 1973 දී රුපියල් 1,344 ලක්ෂයක්ව පැවති ඛණිජ තෙල් නිෂ්පාදිත වල මුළු අපනයන වටිනාකම 1974 දී රුපියල් 3,500 ලක්ෂය දක්වා රුපියල් 2,156 ලක්ෂයකින් හෙවත් සියයට 160·4 කින් වැඩි විය. ඛණිජ තෙල් නිෂ්පාදිත අපනයන වල වැදගත්ම අපනයන ද්‍රව්‍යය වූ නාවුක බංකර වල වටිනාකම 1973 දී 937 ලක්ෂයේ සිට 1974 දී රුපියල් 2,168 ලක්ෂය දක්වා ඉහළ ගොස් ඇත. ගුවන් ඉන්ධන වලින් ලත් ඉපැයුම රුපියල් 171 ලක්ෂයේ සිට රුපියල් 451 ලක්ෂය දක්වා වැඩිවිය.

අනෙකුත් ඛණිජ තෙල් නිෂ්පාදිත අපනයන වලින් ලත් ආදායම 1973 දී රුපියල් 236 ලක්ෂයේ සිට 1974 දී රුපියල් 881 දක්වා තියුණු ලෙස වැඩි විය. නැප්තා අපනයනයෙන් ලත් ආදායම රුපියල් 173 ලක්ෂයේ සිට රුපියල් 815 ලක්ෂය දක්වා වැඩිවූ අතර ඉන්ධන තෙල් අපනයනයෙන් ලත් ආදායම රුපියල් 41 ලක්ෂයේ සිට රුපියල් 67 ලක්ෂය දක්වා වැඩි විය. සුපිරි, භූමිතෙල් සහ ඔටෝ ඩීසල් ද මඳ ප්‍රමාණයක් අපනයනය කර ඇත.

1974 දී ශ්‍රී ලංකාවට අමුතෙල් සැපයූ ප්‍රධාන රට සවුදි අරාබිය වේ. එරටින් ලත් අමු තෙල් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 770,663 (හෙවත් බැරල් 5,668,430) වූ අතර එහි වටිනාකම රුපියල් 4,317 ලක්ෂයක් විය. මෙය මුළු ආනයන ප්‍රමාණයෙන් සියයට 50·1 කි. දෙවැනි ප්‍රධාන සැපයුම කරුවූ ඉරානයෙන් අමුතෙල් මෙට්‍රික් ටොන් 371,417 (හෙවත් බැරල් 2,754,789) ක් ආනයනය කර ඇති අතර එහි වටිනාකම රුපියල් 2.251 ලක්ෂයක් විය අනෙකුත් රටවලින් ආනයනය කර ඇති ප්‍රමාණය අමුතෙල් මෙට්‍රික් ටොන් 381,389 (හෙවත් බැරල් 2,806,006) ක් වූයේය. එහි වටිනාකම රුපියල් 2,046 ලක්ෂයක් විය.

## 5. වෙළෙඳ රටාව

II (ඹ) 22 සංඛ්‍යා සටහනින් වෙළෙඳ කලාප හා අනිකුත් කණ්ඩායම් සමඟ ශ්‍රී ලංකාව පැවැත්වූ වෙළෙඳාම පිළිබඳ තොරතුරු දැක්වේ. සාමාන්‍ය වශයෙන් බලන කළ සියළුම රට වලින් පාහේ ආනයන කරන ලද හා ඒවාට අපනයන කරන ලද භාණ්ඩ වල වටිනාකම, භාණ්ඩ වෙළෙඳ පල වල පැවති තියුණු මිළ උද්ධමනය නිසා ඉහළ යාමක් පෙන්නුම් කළේය.

පොදු රාජ්‍ය මණ්ඩලීය නොවන රට වලින් කරන ලද ආනයන රුපියල් 15,002 ලක්ෂයකින් ඉහළ ගිය අතර මෙම රට වලට අපනයන කරන ලද භාණ්ඩ වල වටිනාකම රුපියල් 5,109 ලක්ෂයකින් ඉහළ ගියේය. අනිත් අතට, පොදු රාජ්‍ය මණ්ඩලීය රටවලින් කරන ලද ආනයන වටිනාකම රුපියල් 3,500 ලක්ෂයකින්ද, ඒවාට කරන ලද අපනයන රුපියල් 1,740 ලක්ෂයකින්ද ඉහළ ගියේය. ශ්‍රී ලංකාවේ වෙළෙඳ ශේෂය වාසි සහිත වූයේ යුරෝපීය නිදහස් වෙළෙඳ සංගමය සමඟ කරන ලද වෙළෙඳාමෙන් පමණකි.

රටවල් අනුව වෙළෙඳාම දෙස බලන විට එක්සත් රාජධානිය සමඟ වූ වෙළෙඳාමෙහි සංකෝචනය දිගටම පැවති බව දිස්වේ. එක්සත් රාජධානියට කළ අපනයන රුපියල් 669 ලක්ෂයකින් ඉහළ ගිය අතර එම රටින් කළ ආනයන රැපියල් 142 ලක්ෂකින් අඩුවූයෙන් වෙළෙඳ අතිරික්තය රුපියල් 1,964 ලක්ෂයක් විය. සෝවියට දේශය, චීනය සහ පකිස්ථානය සමඟ වෙළෙඳාමෙහි අගය සෑහෙන පමණ වැඩි වූ නමුත් මෙම රටවල් සමඟ වූ වෙළෙඳ ශේෂ හිඟ ඒවා විය. ඇමරිකා එක්සත් ජනපදය සමඟ වූ වෙළෙඳාමෙන් අතිරික්තයක් පෙන්නුම් කළේය.

### II (ඹ) 22 වැනි සංඛ්‍යා සටහන

### වෙළෙඳ කණ්ඩායම් සහ අනෙකුත් සමූහ හා තෝරාගත් ප්‍රධාන වෙළෙඳ කරුවන් අනුව ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළෙඳුම

රුපියල් දශ ලක්ෂ

| | මුළු අපනයන නැ· වි· ස· (අ) | | මුළු ආනයන මි· ර· ගැ· (ආ) | | වෙළෙඳ ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | 1973 | 1974 | 1973 | 1974 | 1973 | 1974 |
| පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් .. | 671·1 | 845·4 | 578·1 | 928·1 | + 93·0 | − 82·6 |
| පොදු රාජ්‍ය මණ්ඩලයට අයත් නොවන රටවල් .. | 1831·1 | 2342·0 | 2115·4 | 3615·6 | − 284·3 | − 1273·6 |
| යුරෝපීය ආර්ථික ප්‍රජාව .. | 591·5 | 856·8 | 622·0 | 896·2 | − 30·5 | − 39·4 |
| යුරෝපීය නිදහස් වෙළෙඳ සංගමය .. | 336·1 | 406·0 | 238·3 | 253·6 | + 97·8 | + 152·4 |
| නැගෙනහිර යුරෝපය .. | 194·9 | 276·2 | 101·9 | 342·3 | + 93·0 | − 66·2 |
| ආ·ඇ·පෙ·ආ·කො· ප්‍රදේශය | | | | | | |
| (අ) සංවර්ධන වෙමින් පවත්නා .. | 392·9 | 450·1 | 543·1 | 876·6 | − 150·2 | − 426·5 |
| (ආ) සංවර්ධිත .. | 234·7 | 277·6 | 364·7 | 629·1 | − 130·0 | − 351·5 |
| එක්සත් රාජධානිය .. | 300·2 | 367·1 | 184·5 | 170·3 | + 115·7 | + 196·8 |
| සෝ· ස· ස· සංගමය .. | 63·0 | 99·3 | 47·0 | 145·5 | + 16·0 | − 46·2 |
| චීනය .. | 240·6 | 267·2 | 211·3 | 358·7 | + 29·3 | − 91·5 |
| පකිස්ථානය .. | 213·9 | 267·1 | 108·9 | 278·9 | + 105·0 | − 11·8 |
| ඉන්දියාව .. | 10·6 | 8·8 | 80·6 | 218·9 | − 70·0 | − 210·2 |
| ඇමෙරිකා එක්සත් ජනපදය .. | 180·1 | 242·7 | 245·7 | 145·3 | − 65·6 | + 97·4 |

මූලය: ශ්‍රී ලංකා රේගුව.

(අ) නැව් තොග සහ ඉන්ධන ඇතුළත් නොවේ.

(ආ) මගීන්ගේ බඩු බාහිරාදිය ඇතුළත් නොවේ.

**චීන මහජන සමූහාණ්ඩුව සමඟ වෙළෙඳාම**

පසුගිය වර්ෂය හා සසඳන විට 1974 දී චීන මහජන සමූහාණ්ඩුව සමඟ වෙළඳාමෙහි පිරිවැටුම, රුපියල් 6,260 ලක්ෂය දක්වා රුපියල් 1,740 ලක්ෂයකින් හෙවත් සියයට 39 කින් ඉහළ ගියේය. 1973 වර්ෂයට වඩා 1974 වර්ෂයේ දී අපනයන වටිනාකම රුපියල් 260 ලක්ෂයකින් හෙවත් සියයට 11 කින් වැඩි වූ අතර චීනයෙන් ගෙන්වූ ආනයනයන්හි වටිනාකම, වඩා විශාල ප්‍රමාණයකින් එනම් රුපියල් 1,480 ලක්ෂයකින් හෙවත් සියයට 70 කින් ඉහළ ගියේය. 1973 දී චීනය සමඟ වූ වෙළෙඳාමෙහි පැවති රුපියල් 300 ලක්ෂයක වෙළෙඳ අතිරික්තය, 1974 දී රුපියල් 920 ලක්ෂයක හිඟයක් බවට පත් විය.

චීනයට කරන ලද අපනයන අතුරින් ප්‍රධානම අපනයන ද්‍රව්‍ය වූ රබර් වල වටිනාකම, රුපියල් 102 ලක්ෂයකින් ඉහළ ගිය අතර පොල්තෙල් අපනයන වටිනාකම රුපියල් 146 ලක්ෂයකින් වැඩි වූයේය. සහල් ආනයන වටිනාකම රුපියල් 1,438 ලක්ෂයකින් ඉහළ යාමක් පෙන්විය.

**II (ඔ) 23 වැනි සංඛ්‍යා සටහන**

**චීන මහජන සමූහාණ්ඩුව සමග වෙළෙඳම - 1970 - 74**

| වර්ෂය | අපනයන | | ආනයන | | වෙළඳ ශේෂය රුපියල් දශලක්ෂ | වෙළෙඳ පිරිවැටුම | |
|---|---|---|---|---|---|---|---|
| | වටිනාකම රු: දශලක්ෂ | මුළු අපනයන වල ප්‍රතිශත යක් වශයෙන් | වටිනාකම රු. දශලක්ෂ | මුළු ආනයන වල ප්‍රතිශත යක් වශයෙන් | | වටිනාකම රුපියල් දශ ලක්ෂ | මුළු වෙළෙඳ පිරිවැටුමෙහි ප්‍රතිශතයක් වශයෙන් |
| 1970 | 252 | 12·4 | 289 | 12·5 | – 37 | 541 | 12·4 |
| 1971 | 181 | 9·4 | 161 | 8·1 | + 20 | 342 | 8·7 |
| 1972 | 160 | 8·0 | 96 | 4·6 | + 64 | 256 | 6·3 |
| 1973 | — 241 | 9·2 | 211 | 7·8 | + 30 | 452 | 8·5 |
| 1974 | 267 | 7·7 | 359 | 7·9 | – 92 | 626 | 7·8 |

මූලය: ශ්‍රී ලංකා රේගුව

**II (ඔ) 24 වැනි සංඛ්‍යා සටහන**

**චීන මහජන සමූහාණ්ඩුව සමග වෙළෙඳම (භාණ්ඩ අනුව)**

**1973-1974**

රුපියල් දශලක්ෂ

| | 1973 | 1974 | වෙනස |
|---|---|---|---|
| අපනයන | | | |
| රබර් .. .. | 232·7 | 242·9 | + 10·2 |
| පොල් තෙල් .. .. | 2·5 | 17·1 | + 14·6 |
| වෙනත් . .. | 5·4 | 7·2 | + 1·8 |
| **එකතුව** .. .. | **240·6** | **267·2** | **+ 26·6** |
| ආනයන | | | |
| සහල් .. .. | 156·0 | 299·8 | + 143·8 |
| රෙදිපිළි .. .. | 29·6 | 21·6 | — 8·0 |
| වියළි මිරිස් .. .. | 2·9 | – | — 2·9 |
| රෙදි නූල් සහ නූල් .. .. | 0·5 | 0·9 | + 0·4 |
| ඇට වර්ග සහ කුළු බඩු .. .. | 2·7 | 6·0 | + 3·3 |
| තේ පෙට්ටි .. .. | 1·6 | – | — 1·6 |
| අනෙකුත් .. .. | 18·0 | 30·4 | + 12·4 |
| **එකතුව** .. .. | **211·3** | **358·7** | **+ 147·4** |
| වෙළෙඳ ශේෂය .. .. | + 29·3 | –91·5 | — |

මූලය: ශ්‍රී ලංකා රේගුව

## සෝ·ස·ස· සංගමය සහ නැගෙනහිර යුරෝපය සමඟ වෙළෙඳාම

1973 වර්ෂය සමඟ සසඳන විට 1974 වර්ෂයේදී සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමය සහ නැගෙනහිර යුරෝපය සමඟ කරන ලද වෙළෙඳාම සියයට 108 කින් රුපියල් 6,180 ලක්ෂයක් දක්වා ඉහළ ගිය බව දක්වේ. 1974 දී මෙම වෙළෙඳ කලාපයට යවන ලද භාණ්ඩ වල වටිනාකම 1973 වර්ෂයට වඩා රුපියල් 810 ලක්ෂයකින් හෙවත් සියයට 42 කින් ඉහළ ගිය අතර ඒ රටවලින් කරන ලද ආනයනයන්හි වටිනාකම රුපියල් 2,400 ලක්ෂයකින් හෙවත් සියයට 235 කින් ඉහළ ගියේය. 1974 වර්ෂයේදී මෙම ප්‍රදේශයට කළ අපනයන වලින් රුපියල් 990 ලක්ෂයක් සෝ·ස·ස· සංගමයට යවන ලද අතර මෙහි ප්‍රතිශත වටිනාකම සියයට 36 කි මෙම කලාපයෙහි ශ්‍රී ලංකාව හා ගනුදෙනු කළ අනිකුත් වෙළෙඳ හවුල්කරුවන් අතර පෝලන්තය, යුගෝස්ලාවියාව, ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුව, හංගේරියාව හා බල්ගේරියාව ආදී රටවල් වූයේය.

මෙම කලාපයෙන් ශ්‍රී ලංකාවට ආනයන කරන ලද ද්‍රව්‍ය වල වටිනාකම 1973 දී රුපියල් 1,020 ලක්ෂයක සිට 1974 දී රුපියල් 3,420 ලක්ෂය දක්වා සියයට 235 කින් ඉහළ ගියේය· සෝ·ස·ස· සංගමයෙන් කළ ආනයනයන්හි වටිනාකම රුපියල් 470 ලක්ෂයක සිට 1974 දී රුපියල් 1,455 ලක්ෂය දක්වා සියයට 211 කින් ඉහළ ගියේය. බල්ගේරියාව හා යුගෝස්ලාවියාවෙන් කළ ආනයන ද සැහෙන පමණ වැඩි විය. සාමාන්‍ය වශයෙන් බලන කළ සියළු ආනයන වටිනාකම ඉහළ යාමට හේතු වූයේ සෑම ආනයන භාණ්ඩයකම පාහේ මිළ ඉහළ යාමය.

### II (ඹ) 25 වැනි සංඛ්‍යා සටහන

### සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමය හා නැගෙනහිර යුරෝපය* සමඟ වෙළෙඳ කටයුතු (1970-1974)

| වර්ෂය | අපනයන | | ආනයන | | වෙළෙඳ ශේෂය රුපියල් දශලක්ෂ | වෙළෙඳ පිරිවැටුම | |
|---|---|---|---|---|---|---|---|
| | වටිනාකම රුපියල් දශලක්ෂ | මුළු අපනයන වල ප්‍රතිශතයක් වශයෙන් | වටිනාකම රුපියල් දශලක්ෂ | මුළු ආනයන වල ප්‍රතිශතයක් වශයෙන් | | වටිනාකම රුපියල් දශලක්ෂ | මුළු වෙළෙඳ පිරිවැටුමෙහි ප්‍රතිශතයක් වශයෙන් |
| 1970 | 174 | 8·6 | 185 | 8·0 | − 11 | 359 | 8·2 |
| 1971 | 180 | 9·3 | 151 | 7·6 | + 29 | 331 | 8·4 |
| 1972 | 145 | 7·2 | 82 | 4·0 | + 63 | 227 | 5·6 |
| 1973 | 195 | 7·5 | 102 | 3·8 | + 93 | 297 | 5·6 |
| 1974 | 276 | 7·9 | 342 | 7·5 | − 66 | 618 | 7·7 |

මූලය: ශ්‍රී ලංකා රේගුව

* බල්ගේරියාව, චෙකොස්ලෝවැකියාව, ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුව, හංගේරියාව, පෝලන්තය, රුමේනියාව සහ යුගෝස්ලාවියාව.

**සෝ. ස. ස. සංගමය සහ නැගෙනහිර යුරෝපය**

| | බල්ගේරියාව | | චෙකෝස් ලෝවෙකියාව | | ජ. ප්‍ර. සමූහාණ්ඩුව | |
|---|---|---|---|---|---|---|
| | 1973 | 1974 | 1973 | 1974 | 1973 | 1974 |
| **(I) මුළු අපනයන** .. .. | **8·03** | **22·41** | **14·23** | **13·72** | **13·09** | **20·00** |
| මෙවායින් | | | | | | |
| තේ .. .. .. | — | — | ... | — | ... | ... |
| රබර් .. .. | 8·03 | 22·41 | 7·34 | 4·41 | 9·05 | 16·94 |
| පොල් නිෂ්පාදිත .. | — | — | 1·15 | 6·77 | 3·14 | 2·46 |
| **(II) මුළු ආනයන** .. .. | **0 49** | **56·97** | **6·22** | **29·61** | **3 53** | **34·18** |
| මෙවායින් | | | | | | |
| සීනි .. .. .. | — | — | — | — | — | — |
| යන්ත්‍ර සහ ඒවායේ කොටස් .. | — | 0·02 | 0·42 | 0·13 | 0·46 | 1·12 |
| රෙදිපිළි .. .. | — | — | 3·47 | — | — | — |
| තේ පෙට්ටි .. .. | — | — | — | — | — | — |
| යකඩ, වානේ සහ ඒවායේ කොටස් .. | — | — | ... | 0 04 | 0·11 | 0·32 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත .. .. | — | — | — | — | ... | — |
| පොහොර .. .. | — | — | — | — | — | 5·15 |
| වෙළඳ ශේෂය .. .. | + 7·54 | – 34·56 | + 8·01 | – 15·89 | + 9·56 | – 14·18 |

II (ඔ) 26 වැනි සංඛ්‍යා සටහන

සමග කල වෙළෙඳමේ අගය (භාණ්ඩ අනුව)

රුපියල් දශලක්ෂ

| හංගේරියාව | | පෝලන්තය | | රුමේනියාව | | යුගෝස්ලාවියාව | | සෝ. ස ස. සං. | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1973 | 1974 | 1973 | 1974 | 1973 | 1974 | 1973 | 1974 | 1973 | 1974 | 1973 | 1974 |
| **20.66** | **20.90** | **43.10** | **52.70** | **19.49** | **19.79** | **13.31** | **27.36** | **62.95** | **99.27** | **194.86** | **276.15** |
| 0.39 | ... | — | 1.39 | ... | ... | 0.82 | 0.13 | 8.66 | 16.83 | 9.87 | 18.35 |
| 18.74 | 14.10 | 35.49 | 39.89 | 19.24 | 19.11 | 4.95 | 3.77 | 47.53 | 75.09 | 150.37 | 195.72 |
| 1.51 | 5.93 | 6.23 | 7.43 | 0.02 | — | 0.19 | 11.84 | — | — | 12.24 | 34.43 |
| **3.99** | **2.04** | **29.76** | **23.11** | **8.75** | **3.75** | **2.10** | **47.18** | **47.00** | **145.51** | **101.84** | **342.34** |
| — | — | 21.47 | — | — | — | — | — | — | — | 21.47 | — |
| — | ... | 0.09 | 0.22 | 0.07 | 0.03 | 0.56 | 2.72 | 4.33 | 9.47 | 5.93 | 13.71 |
| — | ... | 6.69 | — | — | ... | — | — | — | ... | 10.16 | ... |
| — | — | — | — | — | — | — | — | 3.31 | 12.55 | 3.31 | 12.55 |
| — | — | 0.02 | ... | 0.01 | ... | 0.07 | 1.20 | 17.49 | 40.94 | 17.70 | 42.50 |
| — | — | — | — | — | — | 0.12 | ... | ... | 0.12 | 0.12 | 0.12 |
| — | — | — | ... | — | — | — | 41.10 | — | — | — | 46.25 |
| +16.67 | +18.86 | +13.34 | +29.59 | +10.74 | +16.03 | +11.21 | −19.82 | +15.95 | −46.24 | +93.02 | −66.19 |

මූලය: ශ්‍රී ලංකා රේගුව

**පකිස්ථානය සමග වෙළෙඳාම**

1974 දී පකිස්ථානය සමග කළ අපනයන සහ එම රටින් කරන ලද ආනයන වටිනාකම පිළිවෙලින් රුපියල් 2,671 ලක්ෂයක් සහ රුපියල් 2,789 ලක්ෂයක් වූයේ, පිළිවෙලින් රුපියල් 532 ලක්ෂයක සහ රුපියල් 1,700 ලක්ෂයක වැඩිවීමක් වාර්තා කළේය ආනයන වටිනාකම වැඩිවීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1973 දී රුපියල් 1,050 ලක්ෂයක්ව පැවති වෙළෙඳ ශේෂයෙහි අතිරික්තය 1974 දී රුපියල් 118 ලක්ෂයක හිඟයක් බවට පත්විය.

පකිස්ථානය වෙත අපනයනය කළ තේ වල වටිනාකම මුළු ප්‍රමාණයෙන් සියයට 76 ක් විය. අපනයන වටිනාකම 1973 දී රුපියල් 1,653 ලක්ෂයේ සිට 1974 දී රුපියල් 2,022 ලක්ෂය දක්වා වැඩි විය මුළු ආනයන වටිනාකමින් සියයට 71 ෆෙවක් රුපියල් 1,988 ලක්ෂයක් වටිනා සහල් 1974 දී ශ්‍රී ලංකාව විසින් පකිස්ථානයෙන් ආනයනය කරන ලදුව 1973 එම වටිනාකම හා සසඳන විට එය රුපියල් 1,221 ලක්ෂයක් වැඩිවීමකි. 1973 හා 1974 පකිස්ථානය හා කළ වෙළෙඳාම පිළිබඳ විස්තර II (ඔ) 26 (අ) සංඛ්‍යා සටහනින් දැක්වේ

**II (ඔ) 26 (අ) සංඛ්‍යා සටහන**

**පකිස්ථානය සමග වෙළඳාම, 1973 — 1974**

(වටිනාම රුපියල් දශලක්ෂවලින්)

| | 1973 | 1974 | නියත වෙනස |
|---|---|---|---|
| **අපනයන** | | | |
| තේ .. .. | 165·3 | 202·2 | + 36·9 |
| රබර්, ෂීට් සහ ක්‍රේප් .. .. | 27·6 | 39·0 | + 11 4 |
| කොප්පරා .. .. | 3·3 | 0·6 | − 2·7 |
| පොල්තෙල් .. .. | 2·7 | 1·2 | — 1·5 |
| පුවක් .. .. | 2·5 | 2·7 | + 0·2 |
| බුලත් .. .. | 1·1 | 7·2 | + 6·1 |
| බීඩි කොළ .. .. | 1·8 | 1·3 | − 0·5 |
| ගම්මිරිස් .. .. | 2·7 | 0·4 | − 2·3 |
| අනෙකුත් .. .. | 6·9 | 12·5 | + 5·6 |
| එකතුව .. .. | 213·9 | 267·1 | + 53·2 |
| **ආනයන** | | | |
| සහල් .. .. | 76·7 | 198·8 | +122·1 |
| මාළු, වියලන ලද, ටින්කළ සහ උම්බලකඩ .. | 23 5 | 22·5 | − 1·0 |
| කපු, නොපීරන ලද .. .. | 2·1 | 7·6 | + 5·5 |
| කපු නූල් .. .. | 1·5 | 43·3 | + 41·8 |
| මහන මැෂින් .. .. | 1·2 | 1·8 | + 0·6 |
| අනෙකුත් .. .. | 3·9 | 4·9 | + 1·0 |
| එකතුව .. .. | 108·9 | 278·9 | +170·0 |

මූලය: ශ්‍රී ලංකා රේගුව

## 6. වෙළෙඳ සහ ගෙවීම් ගිවිසුම්

### (අ) ගිවිසුම

1973 ජනවාරි 1 දින සිට ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකා සහ චීන මහජන සමූහාණ්ඩුව අතර පස්වෙනි පස් අවුරුදු වෙළෙඳ හා ගෙවීම් ගිවිසුමට අනුකූලව, 1974 ජනවාරි 1 දින සිට වර්ෂයක කාලයක් සඳහා වලංගු වූ වෙළෙඳ සන්ධානයකට දෙරට විසින් අත්සන් කර ඇත. මෙම වෙළෙඳ සන්ධානයට අනුව චීනය විසින් රුපියල් 3,000 ලක්ෂයකට ආසන්න වටිනාකමක් ඇති (ආර් එස්. එස්. නො: 1 ෂීට් රබර් මෙට්‍රික් ටොන් 23,400, ආර්. එස් එස්. නො: 2 ෂීට් රබර් මෙට්‍රික් ටොන් 14,040 සහ ආර් එස්. එස්. නො: 3 ෂීට් රබර් මෙට්‍රික් ටොන් 9,360 කින් සමන්විත) රබර් මෙට්‍රික් ටොන් 46,800 ක් මිළයට ගනු ඇත. ශ්‍රී ලංකාව රුපියල් 3,000

ලක්ෂයකට ආසන්න වටිනාකමක් ඇති සහල් මෙට්‍රික් ටොන් 130,000 ක් මිළයට ගැනීමට එකඟ වී ඇත. ඉකුත් වර්ෂය හා සසඳන විට 1974 ගිවිස ගත් රබර් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 10,200 කින් අඩුවන අතර සහල් ප්‍රමාණය ටොන් 70,000 කින් අඩුය. එහෙත් 1974 දී දෙරට විසින් හුවමාරු කර ගැනීමට ගිවිස ගත් භාණ්ඩ වල ආසන්න වටිනාකම ඉකුත් වර්ෂයට වඩා රුපියල් 1,500 ලක්ෂයකින් වැඩි විය

තවද, චීනය විසින් ශ්‍රී ලංකාවෙන් රුපියල් 1,500 ලක්ෂයක් වටිනා වෙනත් භාණ්ඩ මිළයට ගැනීමට ගිවිස ගත් අතර ඒවායින් වඩා වැදගත් භාණ්ඩ වූයේ රබර්, පොල් නිෂ්පාදිත, තේ, කොකෝවා, අගනා සහ අර්ධ අගනා ගල්වර්ග සහ කාර්මික හා සම්ප්‍රදායික නොවන නිෂ්පාදිත භාණ්ඩ වේ. ශ්‍රී ලංකාවද, එම වටිනාකමට සාමාන භාණ්ඩ චීනයෙන් මිළයට ගනු ඇත. එම භාණ්ඩ අතර සහල්, තෙල් සහ තෙල් ඇට, ආහාරද්‍රව්‍ය, රෙදිපිළි, රබර් නිෂ්පාදන, රසායනික ද්‍රව්‍ය, ඖෂධ වර්ග, වානේ, සිමෙන්ති, කඩදාසි සහ යන්ත්‍ර සූත්‍ර වේ.

1974 ජූලි මාසයේ දී, ශ්‍රී ලංකාව සහ පෝලන්තය අතර පස් අවුරුදු වෙළෙඳ ගිවිසුමක් අත්සන් කරන ලදුව එය මීට ප්‍රථම 1959 නොවැම්බර් 29 දින කොළඹ දී අත්සන් කළ වෙළඳ හා ගෙවීම් ගිවිසුම වෙනුවට ක්‍රියාත්මක වෙයි. මෙම ගිවිසුම දෙරටින් කුමන රටක් හෝ ගිවිසුමෙහි කාලය අවසන් වීමට තුන් මසකට ප්‍රථම එය වෙනස් කිරීමට හෝ අවලංගු කිරීමට දැනුම් දීමක් නොකෙරෙයි නම් ගිවිසුම තවත් වර්ෂයක කාලයක් සඳහා දීර්ඝ වේ. අළුත් ගිවිසුමට අනුව දෙරට අතර වන සියළුම ගෙවීම් නිදහස් පරිවර්ත්‍ය මුදල් වර්ගයකින් ප්‍රකාශ කිරීමට හෝ ගෙවීමට හැකිය. පෙර පැවති ගිවිසුම අවලංගු වුවද, නව ගිවිසුම අත්සන් කිරීමෙන් මාස හයක් ඉක්මවෙන තුරු නිෂ්කාශන ගිණුම් යටතේ ගෙවීම් සහ ලැබීම් ක්‍රියාත්මක වනු ඇත. ඉන් අනතුරුව ගිණුම් වල ශේෂයක් වෙයි නම් ණයකරු විසින් එය ස්ටර්ලින් පවුම් වලින් පියවිය යුතු වේ. අළුත් ගිවිසුම තුළ දෙරට විසින් හුවමාරු කළයුතු භාණ්ඩවල ලැයිස්තුවක් ඇතුළත් නොවීය.

1970 සැප්තැම්බර් 21 දින ගිවිසගත් වෙළෙඳ ගිවිසුමෙහි 10 වැනි වගන්තියට අනුව ශ්‍රී ලංකාව සහ උතුරු කොරියාව 1974 අගෝස්තු 1 දින සිට 1975 දෙසැම්බර් 31 දින දක්වා කාලච්ඡේදය තුළ දෙරට හුවමාරු කර ගතයුතු භාණ්ඩ පිළිබඳව වෙළෙඳ සන්ධානයකට 1974 ජූලි මාසයේදී අත්සන් කර ඇත. ඉහත සඳහන් කළ ගිවිසුමෙහි මෙන්ම මෙහිදීද හුවමාරු වන භාණ්ඩ පිළිබඳ ගෙවීම් පරිවර්ත්‍ය මුදල් වර්ගයකින් සිදුකිරීමට එකඟ වීම වැදගත් ලක්ෂණයකි. වෙළෙඳ සන්ධානයෙහි, හුවමාරු කර ගතයුතු භාණ්ඩ දක්වා ඇති නමුත් අනෙකුත් භාණ්ඩ වෙළෙඳම ඉන් ඉවත්කර නොමැත. ශ්‍රී ලංකාවෙන් අපනයනය කළයුතු භාණ්ඩ නම් රබර්, පොල් තෙල් සහ අනෙකුත් පොල් නිෂ්පාදිත, ග්ලිසරින් සහ මේද අම්ල, සම්, සබන්, ටයර්, ටියුබ් සහ අනෙකුත් රබර් නිෂ්පාදිත වේ. කොරියාවෙන් අපනයනය කළ යුතු භාණ්ඩ වශයෙන් දක්වා ඇති ඒවා අතර යන්ත්‍රසූත්‍ර උපකරණ, විදුලි උත්පාදන, වානේ තහඩු, පොහොර, කපු සහ කෘතිම කෙඳි සහ රසායනික ද්‍රව්‍යයන් වැදගත් වේ. දෙරට විසින් ඔවුනොවුනට පවුම් 45 ලක්ෂයක් වටිනා භාණ්ඩ අපනයනය කිරීමට ගිවිසගෙන ඇත.

වෙළෙඳ සන්ධානය අත්සන් කිරීමට අමතරව,නිෂ්කාශන ගිණුම්වල ශ්‍රී ලංකාවට අය විය යුතුව ඇති ශේෂය වන පවුම් 366,073·19 ක් පරිවර්ත්‍ය මුදල්වලින් පියවීම සඳහා වහාම පියවර ගැනීමට උතුරු කොරියානු රජය එකඟ වී ඇත. කෙසේ වුවද, ලංකා වානේ සංස්ථාව සහ කොරියානු වානේ අපනයන සහ ආනයන සංස්ථාව අතර ඇතිකරගෙන තිබෙන ගිවිසුමට අනුව වානේ තහඩු නැව්ගත කෙරෙයි නම් ඉන් අනතුරුව ඇතිවන ශේෂය පමණක් පරිවර්ත්‍ය මුදල්වලින් පියවීමට සන්ධානයෙහි ඉඩකඩ සලසා ඇත.

ශ්‍රී ලංකාව සහ හංගේරියානු රජය 1974 ජූලි 24 දින අත්සන් කළ වෙළෙඳ ගිවිසුමද, ශ්‍රී ලංකාව හා පෝලන්තය අතර ඇතිකර ගත් වෙළෙඳ ගිවිසුමට සමාන වේ. මෙම ගිවිසුමද අත්සන් කළ දින සිට අවුරුදු පහක කාලයක් සඳහා වලංගු වේ. ඒ අනුව මීට කලින් 1956 ජූනි 4 දින අත්සන් කළ වෙළෙඳ ගිවිසුම සහ 1961 සැප්තැම්බර් 12 දින අත්සන් කළ වෙළෙඳ

සන්ධාන ගෙවීම් ගිවිසුම මින් අවලංගු වේ. අළුත් ගිවිසුම යටතේ ගෙවීම් පරිවර්ත්‍ය මුදල් වලින් පියවිය යුතු අතර 1974 ජූලි 24 දිනට ණයකරුගේ ශුද්ධ ශේෂය (මුල් ගිවිසුමෙහි සටහන්ව ඇති), හය මාසයක් ඇතුළත භාණ්ඩ බෙදාහැරීම මගින් පියවිය යුතු වේ. එයින්ද අනතුරුව ශේෂයක් වෙයි නම් එය පරිවර්ත්‍ය ස්ටර්ලින් පවුම්වලින් පියවිය යුතුය.

1974 සහ 1975 යන වර්ෂවලදී දෙරට අතර භාණ්ඩ හුවමාරු කර ගැනීම පිණිස ශ්‍රී ලංකාව සහ බල්ගේරියාව 1974 ජූලි 12 දින වෙළෙඳ සන්ධානයක් අත්සන් කර ඇත. මෙය 1970 නොවැම්බර් 27 දින අත්සන් කළ වෙළෙඳ ගිවිසුමෙහි 4 වැනි වගන්තියට අනුව වේ. ගිවිසුමෙහි 'අ' උපලේඛනයෙහි බල්ගේරියාව විසින් ලංකාවට අපනයනය කළයුතු භාණ්ඩ ලැයිස්තුව දක්වේ. එම භාණ්ඩවල වටිනාකම පවුම් 30 ලක්ෂයක් වන අතර, භාණ්ඩ වශයෙන් දක්වෙනුයේ යන්ත්‍ර සූත්‍ර සහ කොටස්, වාහන නිෂ්පාදන සහ ලෝහ, පොහොර, රසායනික ද්‍රව්‍ය, ඖෂධ වර්ග, නූල්, කිරිගු, වීදුරු සහ ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය නොවන මත් ද්‍රව්‍ය සහ දුම්කොළත් ය. 'ආ' උපලේඛනයෙන් ශ්‍රී ලංකාවෙන් එරටට අපනයනය කළයුතු භාණ්ඩ දක්වෙන අතර එහි ඇතුළත් වූ භාණ්ඩ නම් තේ, පොල් නිෂ්පාදිත, රබර්, කොකෝවා, සමහර පාරිභෝගික භාණ්ඩ, අගනා සහ අර්ධ අගනා ගල් වර්ග සහ කුළුබඩුත් ය.

ඉහත සඳහන් වෙළෙඳ ගිවිසුම් හැරුණුවිට, ශ්‍රී ලංකාවේ වාණිජ අධ්‍යක්ෂ සහ ස්වීඩනයේ ස්ටොක්හෝම් හි අබ්සුකාබ අතර විශේෂ වෙළෙඳ ගිවිසුමක් සඳහා 1974 ඔක්තෝබර් 28 දින අත්සන් කර ඇත. මෙම ගිවිසුමෙහි වලංගු කාලය, එය අනුමත කිරීමේ දින සිට වර්ෂ දෙකක කාලයක් සඳහා වන අතර, දෙපක්ෂය අතර වෙළෙඳ හුවමාරුවෙහි වාර්ෂික වටිනාකම එ. ජ. ඩොලර් 12 ලක්ෂයක් වන පරිදි ඒකාබද්ධව කටයුතු කිරීමට එකඟ වී ඇත. මෙම ගිවිසුමෙහි පරමාර්ථය වනුයේ ශ්‍රී ලංකාවෙන් ස්කැන්ඩිනේවියාව වෙත කෙරෙන අපනයන දිරිගැන්වීම වන අතර එයින් ලැබෙන විදේශ විනිමය ඉපැයුම්, ස්වීඩනයෙන් සහ අනෙකුත් ස්කැන්ඩිනේවියානු රටවලින් කෙරෙන ආනයන සඳහා උපයෝගී කර ගැනීමය. ශ්‍රී ලංකාවෙන් අපනයන කිරීම සඳහා තෝරාගෙන ඇති භාණ්ඩ අතර කාර්මික නිෂ්පාදන සහ සමහර සම්ප්‍රදායික නොවන භාණ්ඩ වේ. ශ්‍රී ලංකාවට කෙරෙන අපනයන වනයේ ටිකැට් යන්ත්‍ර, වාහන, තේ පෙට්ටි පතෝල, ඉදි කිරීමේ භාණ්ඩ සහ යන්ත්‍ර සූත්‍ර, මුද්‍රණ කඩදාසි ලී පල්ප සහ අන්‍යෝන්‍යව එකඟ වූ වෙනත් භාණ්ඩත් වේ.

(ආ) ගෙවීම් මාධ්‍ය.

රටෙහි පවත්වාගෙන එන ද්විපාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම්වල පාලනය පිළිබඳව මහබැංකුව අවසර්‍ා කීපයකදීම සිය අවධානය යොමුකොට ඇත. මෙරට ආනයන ධාරිතාවෙහි පවත්නා දැඩි අහිතකර තත්ත්වය අනුව ශ්‍රී ලංකාව සඳහා ශේෂයන් පවත්වා ගැනීම නුවණට හුරු නැති බවපෙන්නුම් කෙරිණි. එක් අතකින්, සම්ප්‍රදායික වෙළෙඳපල වලින් ද්විපාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම් ඇති රටවලට වෙළෙඳම යොමු කිරීම නිසා, අත්‍යාවශ්‍ය භාණ්ඩ ආනයනය කිරීම සඳහා උපයෝගී කොට ගතහැකිව තිබූ ප්‍රධාන මුදල් ඉපැයීමට පාඩු විය. අනෙක් අතට, ද්විපාර්ශ්වීය ක්‍රමය නිසා වඩා වාසිදායක මිල ගණන්වලට ගැනීමට සහ අලෙවි කිරීමට ඇති නිදහස සීමාවිය. එමනිසා අදාළ හැම සාධකයක් ගැන නිසිලෙස සැළකිලිමත් නොවී ශ්‍රී ලංකාව ද්විපාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම්වලට එකඟ නොවිය යුතුයැයි යෝජනා කැරුනු අතර වෙළෙඳ ගිවිසුම්වලින් හැකිතාක් ප්‍රයෝජන ලබනුවස් එම ද්විපාර්ශ්වීය ගිණුම් මනාව පාලනය කළයුතු යැයිද මහ බැංකුව විසින් දක්වා ඇත.

මෙම අරමුණු ඉටුකර ගැනීම වස් 1974 දී යම් යම් පියවර ගෙන ඇති බව සඳහන් කළ යුතු වේ. ද්විපාර්ශ්වීය ගිවිසුම් පාලනය කිරීමේදී යම්කිසි නම්‍යතාවයක් ඇති කිරීමේ අදහසින් 1974 මැයි 24 වැනිද භාණ්ඩාගාරය විසින් චක්‍රලේඛනයක් නිකුත් කරන ලදී. මේ අනුව පොහොර, කෝස්ටික් සෝඩා, ෆේප්මික් අම්ල, පුවත්පත් කඩදාසි, වාහන තහඩු ආදී අර්ධ අත්‍යාවශ්‍ය භාණ්ඩ ලබාගැනීමේදී ටෙන්ඩර් ක්‍රමයෙන් පිටස්තරව, අවශ්‍ය වේ නම්, ආනයන ආයතන සමග සාකච්ඡාවලට එළඹීම සුදුසුයයි එම චක්‍රලේඛනයෙන් යෝජනාකර ඇත.

විශේෂ වෙළෙඳ සමීක්ෂණ සහ පවත්නා මිල ගණන් පිළිබඳ වාර්තාවලින් ලබාගත හැකි දත්ත අනුව, විදේශ විනිමය ප්‍රශ්නයද සැළකිල්ලට ගෙන යාවත්කාලීන වෙළෙඳ වාර්තා සකස්කිරීම වාණිජ අධ්‍යක්ෂ විසින් කළයුතු යැයිද එහි දක්වා තිබුණි.

ද්විපාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම් පාලනය පිළිබඳව, 1974 දී ගෙන ඇති සතුටුදායක පියවරක් නම් එම ගිවිසුම්, පරිවර්තනය මුදල්වලින් ගෙවිය හැකි වෙළෙඳ ගිවිසුම් හැටියට සකස් කිරීමයි. එය රටෙහි වෙළෙඳ රටාව බහුපාර්ශ්වීය කිරීමෙහිලා ගෙන ඇති වැදගත් පියවරක් බව කිව යුතු නොවේ. පෝලන්තය, හංගේරියාව, බල්ගේරියාව, සහ උතුරු කොරියාව වැනි සමහර සමාජවාදී රටවල් සමග ගිවිසගෙන ඇති වෙළෙඳ ගිවිසුම් මෙයට සාක්ෂි වේ. දනට පවත්වාගෙන එන වෙළෙඳ ගිවිසුම් නිරීක්ෂණය කිරීමත් අනෙකුත් සමාජවාදී රටවල් සමග එවැනි වෙළෙඳ ගිවිසුම සඳහා සාකච්ඡා කිරීමත් නිර්දේශ කෙරේ.

**ද්විපාර්ශ්වික නිෂ්කාෂණ ගිණුම :**

ශ්‍රී ලංකාව හා වෙනත් රටවල් සමග පැවති ද්විපාර්ශ්වික වෙළෙඳ ගිවිසුම්වල නිෂ්කාශන ගිණුම් අධ්‍යයනය කිරීමේ දී 1973 ශ්‍රී ලංකාවට වාසිදයකව තිබූ රුපියල් 548 ලක්ෂයක ශුද්ධ ශේෂය 1974 දී රුපියල් 1828 ලක්ෂයක අවාසිදයක ශේෂයක් බවට පත් විය.

මෙයින් පෙනී යන්නේ එම රටවලින් කෙරුණු ආනයන පරිමාව වැඩි කිරීමට පියවර ගෙන ඇති බවය. ඒ අනුව වාසිදයක ශේෂයන්හි මට්ටම අඩු වී ඇත. මෙම තත්ත්වය විදේශ විනිමය හිඟයක් පැවති කාලයක දී, ද්විපාර්ශ්වික වෙළෙඳමෙහි ප්‍රතිඵලයක් වශයෙන් එම ගිණුම්වල වාසිදයක තත්ත්වයක පවත්වා ගෙන ආ පසු ගිය අවුරුදු කිහිපය මුළුල්ලේ පැවැති තත්ත්වයට ප්‍රතිවිරුද්ධ තත්ත්වයකි.

**II (ඹ) 27 වැනි සංඛ්‍යා සටහන**

**ද්විපාර්ශ්වීය නිෂ්කාශණ ගිණුම්***

**1973 - 1974 ගිණුම්වල ශුද්ධ තත්ත්වය කාර්තු වශයෙන්**

(රුපියල් දශ ලක්ෂ)

| අවසානයෙහිදී පැවති ශුද්ධ තත්ත්වය | | බැර | හර |
|---|---|---|---|
| 1973 | මාර්තු | — | 47·6 |
| | ජූනි | — | 64·0 |
| | සැප්තැම්බර් | — | 77·0 |
| | දෙසැම්බර් | — | 54·8 |
| 1974 | මාර්තු | 69·1 | — |
| | ජූනි | 78·7 | — |
| | සැප්තැම්බර් | 154·6 | — |
| | දෙසැම්බර් | 182·8 | — |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

* චීනය, ප්‍රජාතන්ත්‍රවාදී මහජන කොරියන් සමූහාණ්ඩුව, සිරියාව, එක්සත් අරාබි සමූහාණ්ඩුව, සෝ. ස. ස. සංගමය, බල්ගේරියාව, චෙකොස්ලෝවැකියාව, ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය, හංගේරියාව, පෝලන්තය, රුමේනියාව සහ යුගොස්ලාවියාව.

බැර: ලංකාවෙන් ගෙවිය යුතු.

හර: ලංකාවට ලැබිය යුතු.

ද්විපාර්ශ්වික නිෂ්කාශන ගිණුම් අනුව එම රටවලට ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන ලද භාණ්ඩවල වටිනාකම 1974 දී රුපියල් 6,412 ලක්ෂයක් වූ අතර, 1973 දී එය රුපියල් 5,286 ලක්ෂයක් විය. 1974 දී ශ්‍රී ලංකාවට එම රටවලින් කරන ලද ආනයනවල වටිනාකම රුපියල් 8,788 ලක්ෂයක් වූ අතර, එය ඉකුත් වසරට වඩා රුපියල් 2,900 ලක්ෂයක වැඩිවීමක් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් මෙම රටවල් සමඟ වූ ශ්‍රී ලංකාවේ වෙළෙඳ ශේෂයේ හිඟය 1973 දී

රුපියල් 586 ලක්ෂයේ සිට 1974 දී රුපියල් 2,376 ලක්ෂය දක්වා වැඩි විය. 1974 දී ශ්‍රී ලංකාවේ මුළු අපනයනයෙන් මෙම රටවලට කරන ලද අපනයනය සියයට 18·5 ක් වූ අතර ආනයන අනුපාතයෙහි වටිනාකම සියයට 19·3 කි.

II (ඹ) 29 වැනි සංඛ්‍යා සටහනින්, 1974 නිෂ්කාශන ගිණුම් යටතේ ලැබීම් හා ගෙවීම් දක්වෙන අතර, II (ඹ) 28 සංඛ්‍යා සටහනින් ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික අපනයනයන් හා එහි ප්‍රතිශත කොටස් දක්වේ.

### II (ඹ) 28 වැනි සංඛ්‍යා සටහන

### ශ්‍රී ලංකාවේ ද්විපාර්ශ්වික ගිවිසුම්: 1974 සම්ප්‍රදායික අපනයන සහ මුළු අපනයනයන්හි ප්‍රතිශත කොටස්

වටිනාකම රුපියල් දශලක්ෂ වලින්

| | සම්ප්‍රදායික අපනයන (අ) | | මුළු අපනයන | | සම්ප්‍රදායික අපනයනයන් මුළු අපනයනයන්හි ප්‍රතිශතයක් වශයෙන් | |
|---|---|---|---|---|---|---|
| | 1973 | 1974 | 1973 | 1974 | 1973 | 1974 |
| 1· බල්ගේරියාව .. | 1·5 | 20·3 | 2·0 | 20·9 | 74·0 | 97·1 |
| 2· චීන මහජන සමූහාණ්ඩුව .. | 180·3 | 285·2 | 302·2 | 340·5 | 59·7 | 83·8 |
| 3· චෙකොස්ලොවැකියාව .. | 20·2 | 26·4 | 21·0 | 29·8 | 96·0 | 88·6 |
| 4· ජ. ප්‍ර. සමූහාණ්ඩුව .. | 15·6 | 21·4 | 16·8 | 23·0 | 93·2 | 93·0 |
| 5· හන්ගේරියාව .. | 14·3 | 19·5 | 15·2 | 20 6 | 93·8 | 94·7 |
| 6· පෝලන්තය .. | 36·4 | 43·5 | 41·5 | 52·4 | 87·9 | 83·0 |
| 7· රුමේනියාව .. | 9·2 | — | 10·9 | 0·7 | 84·7 | — |
| 8· සිරියාව .. | 0·03 | — | 0·5 | 0·1 | 6·5 | — |
| 9· කොරියාව .. | — | — | — | — | — | — |
| 10· එක්සත් අරාබි ජනරජය .. | 42·3 | 24·8 | 42·3 | 25·5 | 100·0 | 97·3 |
| 11· සෝ ස.ස. සංගමය .. | 58·8 | 99·8 | 76·3 | 127·7 | 77·1 | 78·2 |
| 12· යුගෝස්ලාවියාව .. | — | — | — | — | — | — |
| එකතුව .. .. | 378·6 | 540·9 | 528·5 | 641·2 | 71·6 | 84·4 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තේ, රබර් හා පොල් නිෂ්පාදිත

## II (ඔ) 29 වැනි සංඛ්‍යා සටහන

### නිෂ්කාශණ ගිණුම් යටතේ ලැබීම් සහ ගෙවීම් විස්තර 1974

( රුපියල් දශලක්ෂ )

| | |
|---|---|
| 1. අපනයන | |
| තේ | 52·5 |
| රබර් | 459·8 |
| පොල් තෙල් | 12·2 |
| කපාපු පොල් | 16·4 |
| අනෙකුත් පොල් නිෂ්පාදිත | 8·4 |
| අනෙකුත් අපනයන සහ ලැබීම් | 91·9 |
| එකතුව | 641·2 |
| 2. ආනයන | |
| සහල් | 366·0 |
| පිටි | 71·5 |
| කුළුබඩු | 13·3 |
| කෘ | 87·4 |
| කපු නූල් | 0·8 |
| ඖෂධීය නිෂ්පාදිත | 7·2 |
| අනෙකුත් රසායන ද්‍රව්‍ය | 17·0 |
| යකඩ සහ වානේ | 47·3 |
| යන්ත්‍ර සූත්‍ර | 13·1 |
| ගමනාගමන උපකරණ | 1·1 |
| කඩදාසි සහ ඝන කඩදාසි | 18·0 |
| පොහොර | 11·5 |
| රෙදිපිළි | 20·9 |
| අනෙකුත් ආනයන සහ ගෙවීම් | 203·7 |
| එකතුව | 878·8 |
| 3. ලැබීම්වලට වඩා ගෙවීම්වල අතිරික්තය | 237·6 |
| 4. 1973 වර්ෂය අවසානයේදී ශුද්ධ ශේෂය – හර | 54·8 |
| 5. 1974 වර්ෂය අවසානයේ ශුද්ධ ශේෂය – බැර | 182·8 |

හර: ලංකාවෙන් ලැබිය යුතු
බැර: ලංකාවෙන් ගෙවියයුතු

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

ද්විපාර්ශ්වික ගිණුම් ඇති සියළුම රටවල් සඳහා ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික අපනයන වූ තේ (සියයට 8·2) රබර් (සියයට 71·7) පොල් තෙල් (සියයට 1·9) සහ කපාපු පොල් (සියයට 2·6) යන භාණ්ඩවල වටිනාකම, එම රටවලට අපනයනය වූ භාණ්ඩවල මුළු වටිනාකමෙන් සියයට 84·4 ක් විය. අනෙකුත් පොල් නිෂ්පාදිත සියයට 1·3 ක් වූ අතර, අනිකුත් අපනයන සියයට 14·3 ක් විය. ආනයන පිළිබඳ සැළකීමේ දී සහල් ආනයනවල වටිනාකම රුපියල් 3,660 ලක්ෂයක් වූ අතර, ද්විපාර්ශ්වික ගිවිසුම් යටතේ මුළු ආනයනයෙන් සියයට 41·6 ක් විය. පිටි ආනයනයන්හි අනුපාතය සියයට 8·1 ක් විය. අනිකුත් ආනයන අතර වඩා වැදගත් ආනයන වන්නේ කපු රෙදි (කපුසහ නූල්) යකඩ සහ වානේ, යන්ත්‍ර සූත්‍ර, ගමනාගමන උපකරණ, කඩදාසි සහ ඝන කඩදාසි සහ පොහොරය.

### 7. නැව් ගාස්තු සහ අධි ගාස්තු

**( අ ) සාමාන්‍ය නැව් ගාස්තු වැඩිකිරීම් :**

1974 දී ශ්‍රී ලංකාවට මුහුණ පෑමට සිදු වූ මූලික ප්‍රශ්න අතර සාමාන්‍ය නැව් ගාස්තු ඉහළ දැමීම, බංකර හා වරාය තදබදය මත පැනවූ අධිගාස්තු, මුදල් ගැලපීමේ සාධකයට සම්බන්ධ වූ අයකිරීම් ආදිය වේ. 1974 දී ලෝක භාණ්ඩ මිල ගණන් වැඩි වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ලංකාව ලැබූ විදේශ විනිමය වාසි එක් අතකින් නැව් ගාස්තු වැඩිවීම නිසා මැකීගිය අතර, අනික් අතට එමගින් ඒ වන විටද පිරිහෙමින් තිබූ ගෙවුම් ශේෂය මත පැටවුණු බර තවදුරටත් දැඩි විය, නිදසුනක් වශයෙන් ශ්‍රී ලංකා අපනයනවලට නියමිත නැව්ගාස්තු දර්ශකය (1961 = 100) එක්දහස් නවසිය හැට ගණන්වල සුළු ඉහළ යාම පෙන්නුම් කළා වුවද, 1970 සිට

සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, සියළුම ප්‍රධාන අපනයන භාණ්ඩයන් සඳහා වූ ඒ ඒ දර්ශකයන්ගේ සැලකිය යුතු වැඩිවීම් පෙන්නුම් කෙරිණි. මෙම අපනයන සඳහා වූ පොදු නැව් ගාස්තු දර්ශකය 1973 දී 217·3 ක සිට 1974 දී 234·9 දක්වා ඉහළ ගියේය.

1974 වර්ෂයේදී නැව් සම්මේලන හෝ සමාගම් එකොලහක් විසින් සියයට 10 සිට සියයට 37 දක්වා නැව්ගාස්තු වැඩි කරන ලදී. 1973 දී නැව් ගාස්තු වැඩි කරන ලද්දේ නැව් සම්මේලන දෙකක් සහ නැව් සමාගම් හතරක් මගින් පමණක් වූ අතර, එම වැඩිවීම් සියයට 10 සිට සියයට 20 දක්වා වූ පරාශයක් අතර විය. ශ්‍රී ලංකා මධ්‍යම නැව්ගාස්තු කාර්යාංශය, නැව් සංගම් හා ඒවායේ අධිකාරීන් විසින් නැව් ගාස්තු වැඩි කිරීමට දක්වූ හේතු සලකා බැලීමෙන් පසුව මෙම සම්මේලන සම්බන්ධව ගාස්තු වැඩිකිරීම් සාකච්ඡා මගින් අඩුකර ගැනීමට පොහොසත් විය. නැව් ගාස්තු වැඩි කිරීමේදී අඩුම වශයෙන් දින 90 ක කල්දීමක් අවශ්‍යයයි නැව් ගාස්තු කාර්යාංශය විසින් නැව් සමාගම්වලින් ඉල්ලා සිටින ලදී. නැව්ගාස්තු වැඩි කිරීම සඳහා හේතු ලෙස සම්මේලන විසින් දක්වන ලද කරුණු නම් කාරක පිරිවැය දිගටම ඉහළ යාමත්, පාඩු දරා ගැනීමට තමන් අපොහොසත් බවත් ය.

( ආ ) බංකර අධිගාස්තු :

ඛනිජතෙල් මිළ ඉහළ යාමෙන් වූ එක් ප්‍රතිඵලයක් නම් බංකර සඳහා සම්මේලන විසින් අසාමාන්‍ය වියදමක් දැරීමට සිදුවීමයි. මේ නිසා සම්මේලන විසින් දැරිය යුතුවූ පාඩු පිරිමසා ගැනීමට බංකර අධිගාස්තු සාධකයක් ආරම්භ කිරීමට සිදුවූවා හැර බොහෝ සම්මේලන විසින් තමන්ගේ නැව් භාර පත්‍රයන්හි බංකර වගන්ති ද ඇතුළත් කරන ලදී. 1974 දී නැව් සමාගම් හෝ සම්මේලන නවයක් විසින් නව බංකර අධිගාස්තු ආරම්භ කරන ලද අතර, වෙනත් සමාගම් හයක් විසින් බංකර අධිගාස්තු ඉහළ දමන ලදී. බොහෝ සම්මේලන විසින් සියයට 3·54 ක සිට සියයට 56 තරම් වූ ඉතා ඉහළ මට්ටමක් දක්වා විශාල වැඩි කිරීම් සිදුකරන ලදී පසුව බංකර මිළ ගණන් පහත වැටීම හේතුවෙන් සමහර බංකර අධිගාස්තු පහත හෙලන ලදී. එවැනි අඩුවීම් සඳහා ශ්‍රී ලංකා නැව්ගාස්තු කාර්යාංශය මගින් ඉල්ලීම් ඉදිරිපත් කෙරිණි.

(ඇ) වරාය තදබද අධිගාස්තු.

වරායවල තදබදය හා අසතුටුදායක තත්ත්වයන් නිසා සම්මේලනවලට ඇතිවන අමතර පිරිවැය දරාගැනීම දුෂ්කර වූ විට ඊට ගැලපෙන පරිදි වරාය තදබද ගාස්තු අළුතින් පනවන ලදී 1974 දී එබඳු අධිගාස්තු අයකිරීම්වල සැලකිය යුතු වැඩිවීමක් දිස්වේ. නිදසුනක් වශයෙන් 1974 දී නැව් සම්මේලන දහයක් විසින් සියයට 7·5 සිට සියයට 50 දක්වා වරාය තදබද අධිගාස්තු ලෝකයේ විවිධ වරායයන් 28 කට බලපාන අයුරින් අයකරන ලදී. 1973 දී එබඳු අධිගාස්තු අයකරන ලද්දේ වරාය පහකට පමණි. මෙම වරායවල ඊටපසුව පැවති තත්ත්වයන් සලකාබලා එම අධිගාස්තු අඩුකිරීම, වැඩිකිරීම හෝ ඉවත් කිරීම කරන ලදී.

(ඈ) මුදල් ගැලපීමේ සාධකය (හෙවත් අවප්‍රමාණ අධිගාස්තු)

මෙම අධිගාස්තුව, තීරුබදු මුදල් වටිනාකම හෙවත් නැව් ගාස්තු සඳහන් කර ඇති මුදල් වර්ගය සමග සම්බන්ධ වේ. තීරු බදු මුදල් අවප්‍රමාණයට හිලව් වීමක් වශයෙන්, අධිගාස්තුවක් පනවන ලදී. මෙවැනි අවප්‍රමාණ අධිගාස්තු උපක්‍රමය හෙවත් මුදල් ගැලපීමේ සාධකය (මු. ගැ. සා.) මෑත යුගයේ බෙහෙවින් ප්‍රයෝජනයට ගැණිනි.

කෙසේවුවද 1974 දී මු. ගැ. සා ක්‍රමයෙන් ඉහළ දමන ලද්දේ එක් සම්මේලනයක් විසින් පමණක් වන අතර මෙම වැඩිකිරීමෙහි මට්ටම, (මු. ගැ. සා.) 1973 දී වඩා ඉහළ මට්ටමකින් සිදුවිය. අනිකුත් සම්මේලන තුනක් විසින්, ගෙවීමේ මුදල් අවප්‍රමාණය වීමක් (නිද. ඕස්ට්‍රේලියානු ඩොලරය සහ නවසීලන්ත ඩොලරය) හෝ ප්‍රධාන තීරු මුදල් වර්ගය වූ ඇමෙරිකානු ඩොලරය උච්චාවචනය වීම හෝ මු ගැ සා. මුතු වටිනාකම කිහිපවරක් වෙනස් කරන ලදී. මධ්‍යම නැව් ගාස්තු කාර්යාංශයේ ඉල්ලීම මත මෙම පසුකී සම්මේලන විසින් මුදල් ගැලපීමේ සාධකය සම්පූර්ණයෙන්ම අස්කර ගන්නා ලද අතර, වෙනත් සම්මේලනයක් විසින් මෙවා වැඩි

කිරීම අත්හිටුවන ලදී. මුදල් ගැලපීමේ සාධකය හා බැඳී පැවති එක් දුෂ්කරතාවයක් නම්, මු. ගැ. සා. වල සමහර අධිගාස්තු, සාමාන්‍ය නැව් ගාස්තු වැඩිකිරීම සමග එකතුවී පැවති නිසා ඒවා වෙනම අංගයක් ලෙස වෙන්කර ගැනීමට තිබූ අපහසුවයි.

නැව්වල ඉඩකඩ වෙන්කිරීම පිළිබඳවද මධ්‍යම නැව් ගාස්තු කාර්යාංශයේ සාර්ථකත්වය පිළිබඳවද මෙහිදී කෙටියෙන් විස්තර කිරීම වැදගත් වේ. එයින් භාණ්ඩ ඒකාරාශි කර ගැනීමත්, නැව් සමමේලන සමග සාකච්ඡා කිරීමත්, සම්ප්‍රදායික නොවන භාණ්ඩ සඳහා දිරිගැන්වීමේ නැව් ගාස්තු නියමකර ගැනීමත් වැදගත් ය.

1974 දී එහි විෂය ක්ෂෙත්‍රය පුළුල් කරන ලද අතර, ශ්‍රී ලංකාපවන් යවන ලද සියලුම අපනයන මෙම කාර්යාංශ මගින් මෙහෙයවන ලදී. ඒ අනුව 1974 පෙබරවාරි 1 වැනි දිනට හෝ ඊට පසු ලංකාවේ ඒ ඒ වරායවල් බඩු නැව්වලින් සියළුම දිසාවනට බඩු යැවීමේදී තමන්ට නැව්වල අවශ්‍ය ඉඩකඩ තහවුරු කරලීම සඳහා කලින් දැනුම්දෙන ලෙස සියලුම අපනයනකරුවන්ගෙන් ඉල්ලීම් කෙරිණි. බඩු නැව්වල කාලය ඉතිරිකර ගැනීමේ අරමුණ ඇතිව වරාය නැව් බඩු සංස්ථාව, වරාය ටැලි හා ආරක්ෂක සේවා සංස්ථාව සහ ශ්‍රී ලංකා රේගුව යන ආයතන සමග සහභාගිත්වයෙන් පියවර කිහිපයක් ගන්නා ලදී. බඩු ප්‍රවාහනය සම්බන්ධීකරණය, කොළඹ වරායෙහි නිෂ්පාදනය වැඩිකරලීමට තුඩු දුන්නේය.

ශ්‍රී ලංකාවේ අපනයන බඩු ගෙනයාම පිළිබඳව, අනිකුත් පුද්ගලික නැව්කරුවන්ගේ මණ්ඩලවලට වඩා මෙම කාර්යාංශයට වැඩි කේවෙල් කිරීමේ ශක්තියක් තිබුණි. ලංකා නැව් සංස්ථාව විසින් වැදගත් රටවල් බොහොමයකට බඩු සේවා සපයන නිසා මෙම කේවෙල් ශක්තිය තවදුරටත් වැඩිදියුණු විය. ශ්‍රී ලංකා නැව්කරුවන්ගේ කවුන්සලය මගින් ඉහතකී විවිධ පරමාර්ථ බොහොමයක් ඉටුකර ගැනීමෙහිලා දෙන ලද ක්‍රියාත්මක වූත්, අචිච්ින්ත වූත් සහයෝගය මෙහිදී වාර්තා කළයුතු වේ.

**වරායවල නැව්බඩු මෙහෙයවීම්.**

ශ්‍රී ලංකාවේ වරායවල මෙහෙයවන ලද නැව් බඩු පරිමාව දෙස බලනවිට පෙනීයන්නේ පසුගිය වර්ෂ කිහිපය තුලදී බාහිර ලෝකය සමග මෙරටෙහි වෙළෙඳාම ක්‍රමයෙන් සංකෝචනය වෙමින් පැවති බවයි. කොළඹ, ගාල්ල හා ත්‍රිකුණාමලය යන වරායන්හි මෙහෙයවන ලද නැව් බඩු ප්‍රමාණය 1973 දී නැව් ටොන් 25,43,283 ක සිට 1974 දී නැව් ටොන් 24,48,947 දක්වා පහළ ගියේය. මෙය හා සසඳනවිට 1968 දී කොළඹ වරායෙහි පමණක් මෙහෙයවන ලද නැව් බඩු ප්‍රමාණය නැව් ටොන් 30,74,747 ක් විය. 1974 දී ත්‍රිකුණාමලය හා ගාල්ල වරායවල මෙහෙයවන ලද නැව් බඩු ප්‍රමාණය පිළිවෙලින් සියයට 29 කින් හා සියයට 25 කින් පහත වැටුණු අතර, කොළඹ වරාය විසින් මෙහෙයවන ලද නැව් බඩු ප්‍රමාණය සියයට 1·27 කින් පමණක් පහත වැටිණි.

1973 හා 1974 වර්ෂවලදී කොළඹ වරායෙහි මෙහෙයවන ලද නැව් බඩුවල ප්‍රමාණයන් කාර්තු අනුව පහත දැක්වෙන සංඛ්‍යා සටහනෙහි ඇතුලත් වේ.

### II (ඔ) 30 වැනි සංඛ්‍යා සටහන

### කොළඹ වරායේදී මෙහෙය වූ ආනයන සහ අපනයන නැව් බඩු

(නැව් ටොන්)

| | මෙහයවූ නැව් බඩු | | වෙනස | |
|---|---|---|---|---|
| | 1973 | 1974 | නිරපේක්ෂ | සියයට ගණන |
| 1 වැනි කාර්තුව .. .. | 636,478 | 567,218 | − 69,260 | − 10·9 |
| 2 වැනි කාර්තුව .. .. | 560,802 | 659,595 | + 98,793 | + 17·6 |
| 3 වැනි කාර්තුව .. .. | 569,161 | 576,088 | + 6,927 | + 1·2 |
| 4 වැනි කාර්තුව .. .. | 585,796 | 519,409 | − 66,387 | − 11·3 |
| වර්ෂය .. .. | 2,352,237 | 2,322,310 | − 29,927 | − 1·3 |

මූලය: වරාය (නැව් බඩු) සංයුක්ත මණ්ඩලය

## 8. භාණ්ඩ ආධාර

විදේශ රටවලින් 1974 දී සපයන ලද භාණ්ඩ ආධාරවල වටිනාකම රුපියල් 5,862 ලක්ෂයක් වූ අතර, එය 1973 වටිනාකමට වඩා රුපියල් 3,047 ලක්ෂයක සැලකිය යුතු වැඩි වීමකි.

භාණ්ඩ ආධාරවල මුළු වටිනාකමින් රුපියල් 3,475 ලක්ෂයක් හෙවත් සියයට 59 ක් සම්න්විත වූයේ පාරිභෝගික භාණ්ඩ වලිනි. රුපියල් 2,387 ලක්ෂයක වටිනාකමක් හෙවත් මුළු වටිනාකමින් ඉතිරිය වූ සියයට 41 අනෙකුත් භාණ්ඩ සඳහා විය.

ආධාර දෙන රටවලින් 1974 දී ලබාගත් ආධාර, ආහාර හා අනිකුත් ආධාර වශයෙන් වර්ගකොට II (ඔ) 31 වැනි සංඛ්‍යා සටහනින් දක්වා ඇත.

### II (ඔ) 31 වැනි සංඛ්‍යා සටහන

### භාණ්ඩ ආධාර – 1974

(වටිනාකම රුපියල් දශලක්ෂ)

| රට | 1<br>ආහාර ආධාර | 2<br>අනෙකුත් භාණ්ඩ ආධාර | 3<br>එකතුව (1+2) |
|---|---|---|---|
| ඕස්ට්‍රේලියාව .. .. | 27·5 | — | 27·5 |
| කැනඩාව .. .. | 25·9 | 8·1 | 34·0 |
| චීන මහජන සමූහාණ්ඩුව .. .. | 175·6 | — | 175·6 |
| ඩෙන්මාර්කය .. .. | — | 4·6 | 4·6 |
| ප්‍රංශය .. .. | — | 21·0 | 21·0 |
| ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය .. .. | — | 1·0 | 1·0 |
| ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුව .. .. | 37·4 | 92·7 | 130·1 |
| හංගේරියාව .. .. | — | 0·7 | 0·7 |
| ඉන්දියාව .. .. | — | 25·7 | 25·7 |
| ඉතාලිය .. .. | — | 2·2 | 2·2 |
| ජපානය .. .. | — | 54·6 | 54·6 |
| එක්සත් රාජධානිය .. .. | — | 14·0 | 14·0 |
| ස්වීඩනය .. .. | 10·4 | 8·1 | 18·5 |
| ඇමරිකා එක්සත් ජනපදය .. .. | 34·4 | 3·5 | 37·9 |
| එ. ස. සෝ. රුසියාව .. .. | — | 2·5 | 2·5 |
| ඇ. දී. හැ. ස. සංවිධානය .. .. | 21·4 | — | 21·4 |
| යුරෝපීය ආර්ථික ප්‍රජාව .. .. | 14·9 | — | 14·9 |
| එකතුව .. .. | 347·5 | 238·7 | 586·2 |

මූලය: ක්‍රමසම්පාදන හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය.